# බෞද්ධ ශිෂ්ටාචාරය

## ගුරු මාර්ගෝපදේශය

## 13 ශ්‍රේණිය

(2018 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ)




ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව

ජාතික අධ්‍යාපන ආයතනය

මහරගම

ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.nie.lk

විද්‍යුත් තැපැල : info@nie.lk

# බෞද්ධ ශිෂ්ටාචාරය
## ගුරු මාර්ගෝපදේශය
## 13 ශ්‍රේණිය

(2018 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ)

ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපෑල : info@nie.lk

බෞද්ධ ශිෂ්ටාචාරය

13 ශ්‍රේණිය

ගුරු මාර්ගෝපදේශය

ප්‍රථම මුද්‍රණය 2018

C ජාතික අධ්‍යාපන ආයතනය

ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපෑල : info@nie.lk

මුද්‍රණය :
මුද්‍රණාලය
ජාතික අධ්‍යාපන ආයතනය

## අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ පණිවිඩය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිර්දේශිත ජාතික අධ්‍යාපන අරමුණු සාක්ෂාත් කර ගැනීම සහ පොදු නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිත ව එවකට පැවති අන්තර්ගතය පදනම් වූ විෂයමාලාව නවීකරණයට භාජනය කොට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු අදියර, වර්ෂ 2007 දී ජාතික අධ්‍යාපන ආයතනය විසින් ශ්‍රී ලංකාවේ ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදි.

පර්යේෂණවලින් අනාවරණය වූ කරුණු ද, අධ්‍යාපනය පිළිබඳ ව විවිධ පාර්ශ්වයන් ඉදිරිපත් කළ යෝජනා ද පදනම් කොට ගෙන සිදු කරන ලද විෂයමාලා තාර්කීකරණය කිරීමේ ක්‍රියාවලියක ප්‍රතිඵලයක් ලෙස විෂයමාලා චක්‍රයේ දෙවැනි අදියර අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දීම 2015 වසරේ සිට ආරම්භ කර ඇත.

මෙම තාර්කීකරණ ක්‍රියාවලියේ දී සියලු ම විෂයයන්ගේ නිපුණතා පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූල ව ගොඩනැගීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිත කර ඇති අතර විවිධ විෂයයන්හි දී එක ම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත් වීම හැකිතාක් අවම කිරීම, විෂය අන්තර්ගතය සීමා කිරීම සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිතුරු විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය ද භාවිත කර ඇත.

ගුරු භවතුන්ට පාඩම් සැලසුම් කිරීම, ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියෙහි සාර්ථක ව නිරත වීම, පන්ති කාමර මිනුම් හා ඇගයීම් ප්‍රයෝජනවත් පරිදි යොදා ගැනීම සඳහා අවශ්‍ය වන මාර්ගෝපදේශ ලබාදීමේ අරමුණින් නව ගුරු මාර්ගෝපදේශ හඳුන්වා දී ඇත. පන්ති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයෙකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශ උපකාරී වනු ඇත. සිසුන්ගේ නිපුණතා වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමගින් ලබා දී තිබේ. එමෙන් ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළිබඳ ව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නොවේ. එම නිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායී වීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමග සමගාමී ව භාවිත කිරීම අත්‍යවශ්‍ය වේ.

තාර්කීකරණය කරන ලද විෂය නිර්දේශ, නව ගුරු මාර්ගෝපදේශ හා නව පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් මිදී ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන රටාවක් හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට එළඹීම මගින් වැඩ ලෝකයට අවශ්‍ය වන්නා වූ නිපුණතා හා කුසලතාවන්ගෙන් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීමයි.

නව විෂය නිර්දේශ සහ ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ ද, ආයතන සභාවේ ද, රචනයේ දී දායකත්වය ලබා දුන් සියලු ම සම්පත්දායකයින් හා වෙනත් පාර්ශ්වයන්ගේ ද ඉමහත් කැපවීම ඇගයීමට ද මෙය අවස්ථාවක් කර ගනු කැමැත්තෙමි.

**ආචාර්ය ජයන්ති ගුණසේකර**
**අධ්‍යක්ෂ ජනරාල්**
**ජාතික අධ්‍යාපන ආයතනය**
**මහරගම**

# නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

ඉගෙනුම පුළුල් ක්ෂේත්‍රයක විහිද යන්නකි. එය ජීවිත අතිමහත් බවට ද, ඉතා ම සරල බවට ද පත් කරයි. මනුෂ්‍යයා ඉගෙනුම් කුසලතාවෙන් උත්කෘෂ්ට ය. මානව සමාජ සංවර්ධනය කේන්ද්‍ර කොට ගත් රටක්, සමාජයක් බුද්ධිය විසින් හඳුනා ගත් අසම්මතයන් බැහැර කිරීමට ද සුභාවිතයන් තුළින් නව ලොවක් නිර්මාණය කර ගැනීමට ද මෙවලම කර ගනු ලබන්නේ ඉගෙනුම යි.

ඉගෙනුම සඳහා වටිනා යමක් ද, ඉගෙනුම් ක්‍රමවේදයන් හා පහසුකම් ද අධ්‍යාපනය වටා නිර්මාණය විය යුතු ය. විෂය මාලාව, විෂය නිර්දේශය, මාර්ගෝපදේශ, සුසාධ්‍යකරුවන් ඉගෙනුම් ක්ෂේත්‍රයට එක්වනුයේ මේ ආකාරයෙනි.

නූතන ශ්‍රී ලංකාව ගෝලීය ප්‍රවණතාවන් මෙන් ම පුරාතන උරුමයන් ද සම්මිශ්‍රණය කර ගනිමින් ස්වීය අධ්‍යාපන රටාවක් හිමි කරගෙන ඇත. කාලීන අවශ්‍යතා මත ප්‍රතිසංස්කරණයන් තුළින් වසර අටකට වරක් යාවත්කාලීන වන විෂයමාලාවේ ඉගෙනුම් සම්පතක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශ නිර්මාණය වේ.

විෂයයෙහි අරමුණුවල සංගතතාව ජාතික මට්ටමින් පවත්වා ගත යුතු ය. එහෙත් ගුරු මාර්ගෝපදේශයන් හි ඉගෙනුම් ක්‍රමවේදයන්, අකුරක්වත් වෙනස් නොකොට පිළිපැදිය යුත්තක් නම් නොවේ. විෂය නිර්දේශයෙහි නිපුණතා, නිපුණතා මට්ටම්, සාධනය වීම සඳහා අන්තර්ගතය තුළින් ඉගෙනුම් පල සම්ප්‍රාප්තිය පිණිස ඉගෙනුම් ක්‍රමවේද නිර්මාණශීලී ව වෙනස් කර ගැනීමට සුසාධ්‍යකරුවන්ට පැහැදිලිව ම ඉඩක් ඇති බව සඳහන් කරමි. ශිෂ්‍ය සාධන ප්‍රතිශතය ඉහළ මට්ටමකට ගැනීම සඳහා උදව් වන , පහසුකම් සලසන ගුරු භූමිකාවට කිසියම් ප්‍රවේශයක් සඳහා නිර්මාණය වන ගුරු මාර්ගෝපදේශය ශික්ෂකයාහට ද දෙගුරුනට ද භාවිත කළ හැක. අදාළ පෙළ පොතට සහකරුවකු වන ගුරු මාර්ගෝපදේශය තවත් පෙළ පොතක් නොවන බව දන ගුරුභවතුන් ගුරු මාර්ගෝපදේශය හා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ සම්පාදිත අදාළ පෙළ පොත යන සම්පත් ද්‍රව්‍ය දෙක ම භාවිත කළ යුතු ය.

ඒ ඒ විෂයයන්හි සාධනය පිළිබඳ ඇගයීම් සිදු කරන ජාතික මට්ටමේ පරීක්ෂකවරයෙකු වුවද අපේක්ෂා කරන සාධනයන්, විෂය ඉගැන්වීමට මග පෙන්වන සුසාධ්‍යකරුවන් විසින් පාඩම අවසානයෙහි පන්ති කාමරයේ දී දරුවන් සමග ප්‍රත්‍යක්ෂකරණයට පත් විය යුතු ය. එම ඒකාත්මික වීම සඳහා වූ ප්‍රබෝධාත්මක සංස්කෘතියක් ගොඩනගා ගැනීමට ගුරු මාර්ගෝපදේශය පහුරක්, යාත්‍රාවක් කර ගනු ඇතැයි ආයාචනා පූර්වක ව අපේක්ෂා කරමි.

**ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි**
**පීඨාධිපති, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්**
**භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය**
**ජාතික අධ්‍යාපන ආයතනය.**

## විෂයමාලා කමිටුව

**උපදේශකත්වය හා අනුමතිය :** ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය,
ජාතික අධ්‍යාපන ආයතනය.

**විෂය සම්බන්ධීකරණය :** ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,
පූජ්‍ය උඩුගම සුදස්සී හිමි,
දෙපාර්තමේන්තු ප්‍රධාන,
ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව.

**විෂය විශේෂඥ උපදෙස් :**

**අතිපූජ්‍ය ගන්තුනේ අස්සජි මහානායක මාහිමිපාණන් වහන්සේ** - හිටපු කථිකාචාර්ය,
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයය.

**මහාචාර්ය පූජ්‍ය දේවාලේගම මේධානන්ද හිමි** - හිටපු මහාචාර්ය,
කැලණි විශ්වවිද්‍යාලයය.

**ලේඛක මණ්ඩලය :**

**මහාචාර්ය පූජ්‍ය තැරැලේ ධම්මරතන හිමි** - මහාචාර්ය,
කැලණි විශ්වවිද්‍යාලයය.

**පූජ්‍ය උඩුගම සුදස්සී හිමි** - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,
දෙපාර්තමේන්තු ප්‍රධාන,
ආගම් හා සාරධර්ම
අධ්‍යාපන දෙපාර්තමේන්තුව.

**මහාචාර්ය උදිත ගරුසිංහ මහතා** - මහාචාර්ය,
කැලණි විශ්වවිද්‍යාලය.ය.

**ආචාර්ය කේ.ඒ. විරසේන මහතා** - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයය.

**ආර්.ඒ. ගුණවර්ධන මහතා** - ගුරු උපදේශක,
කලාප අධ්‍යාපන කාර්යාලයය,
ගිරිඋල්ල.

| | | |
|---|---|---|
| **ජී.ආර්.එම්.ඒ. ගම්ලත් මහතා** | - | ගුරු සේවය,<br>ධර්මපාල මහා විද්‍යාලයය,<br>ඇරැව්වල, පන්නිපිටිය. |
| **එච්. එම්. සෙනෙවිරත්න මහතා** | - | ගුරු සේවය,<br>ර/ පින්නවල මහා විද්‍යාලයය,<br>බලංගොඩ. |
| **සංස්කරණය :** | | |
| **පූජ්‍ය උඩුගම සුදස්සී හිමි** | - | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,<br>දෙපාර්තමේන්තු ප්‍රධාන,<br>ජාතික අධ්‍යාපන ආයතනය. |
| **එස්.බී.එම්. නිමල් ධර්මසිරි මහතා** | - | අධ්‍යාපන අධ්‍යක්ෂ,<br>ආගමික හා සාරධර්ම ශාඛාව,<br>අධ්‍යාපන අමාත්‍යංශය, ඉසුරුපාය,<br>බත්තරමුල්ල. |
| **භාෂා සංස්කරණය :** | | |
| **ශ්‍රීනාත් ගණේවත්ත මහතා** | - | භාෂා සංස්කාරක |
| **පරිගණක වදන් සැකසුම :** | | |
| **මංගලිකා විජේරත්න මහත්මිය** | - | ජාතික අධ්‍යාපන ආයතනය |
| **විවිධ සහය :** | | |
| එස්. සී. ප්‍රියදර්ශනී මහත්මිය | - | ජාතික අධ්‍යාපන ආයතනය |
| ඩයස් අමරසිංහ මහතා | - | ජාතික අධ්‍යාපන ආයතනය |

## ගුරු මාර්ගෝපදේශය පරිශීලනය කිරීම සඳහා උපදෙස්

කාලීන අවශ්‍යතා පදනම් කොට 2009 වසරේ දී අ.පො.ස. (උ.පෙළ) පන්තිවල අදාළ විෂයමාලා වෙනස්කම්වලට අනුකූලව තවදුරටත් නවීකරණයට භාජනය කරමින් 2017 වර්ෂයේ සිට පද්ධතිය තුළ ක්‍රියාත්මක වන 12 ශ්‍රේණිය සඳහා වූ විෂයමාලා වෙනස්වීම් සහිත මෙම ගුරු මාර්ගෝපදේශය ඔබ අතට පත් වනු ඇත.

නව සහස්‍රයේ අභියෝග ජය ගැනීමට වෙර දරණ ගුරු පරපුරට සාර්ථක ජීවන ගමනක් සඳහා මගපෙන්වීම උදෙසා සිසුන් තුළ ප්‍රගුණ කළ යුතු නිපුණතා හා නිපුණතා මට්ටම් නිවැරදි පෙළ ගැස්වීමකට හා සවිස්තරාත්මක ව තොරතුරු ඉදිරිපත් කිරීමකට මෙම මාර්ගෝපදේශය භාජනය කොට තිබේ. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය නිපුණතා පාදකව ඉටු කිරීම සඳහා ප්‍රබලතාවයකින් යුතුව පෙර අත්දැකීම් ද සැලකිල්ලට ගෙන මෙම ගුරු මාර්ගෝපදේශය විෂයමාලා සම්පාදකවරු විසින් ඔබ වෙත සංග්‍රහ කොට ඇත. මෙම විෂයධාරාවට අදාළ ව ගුරු භවතුන්ගේ නව නිර්මාණාත්මක හැකියාව එක් කොට ගනිමින් අනුමත කොට ඇති විෂය නිර්දේශය නිපුණතා පාදකව අනාගත අපේක්ෂණ කරා දරුවන් පෙළ ගැස්වීමට ඉගෙනුම් ඉගැන්වීම් කාර්ය සඳහා යොදා ගැනීම ගුරු භවතුන්ගේ කාර්යයකි.

මෙය ඔබ අතට පත් වූ වහාම මෙහි ඇති විෂය නිර්දේශයෙහි වැදගත්කම හා පෙළගැස්ම පළමුව මනාව වටහා ගත යුතු ය. අනුමත කාලච්ඡේද සියල්ල සැළකිල්ලට ගෙන වාරයට නියමිත විෂය කොටස් හඳුනා ගනිමින් වාර සටහන් හා දින සටහන් ක්‍රමානුකූලව නිවැරදිව සකස් කර ගැනීමට වගබලා ගැනීම ඔබ සතු යුතුකමක් බව සිහිපත් කරමි.

පැවති ගුරු මාර්ගෝපදේශය හා සැසඳීමේ දී සෑම නිපුණතා මට්ටමක්ම ඉටු කර ගැනීම සඳහා අදාළ ඉගනුෙම් පල කීපයක් හඳුන්වා දී ඇත. මෙය මෙම විෂය නිර්දේශය තුළ නව ප්‍රවණතාවයකින් යුතු එක් කිරීමක් ලෙස හඳුන්වා දිය හැකි ය. එම ඉගෙනුම් පල ඉටුවන ලෙසත් ඒ තුළින් නිපුණතා මට්ටම සාක්ෂාත් කර ගැනීමටත් අවැසි පහසුව සැලසීම උදෙසා උපදෙස් ලබා දී ඇත.

මෙම ගුරු මාර්ගෝපදේශය සම්පාදනයේ දී ගුරු භවතුන්ට තම අභිමතය පරිදි නිපුණතා මට්ටම් සාක්ෂාත් කර ගැනීම සඳහා නිපුණතා පාදක ක්‍රමවේදයට ගැළපෙන නිදහස් විකල්ප ඉගෙනුම් ක්‍රමවේද භාවිත කිරීමට අවස්ථාව සැලසේ. ඔබ විසින් යොදා ගන්නා ඉගෙනුම් ප්‍රවේශය සතුටුදායක සිසු මනසට ගැලපෙන කුතුහලය උපදවන පෙර අත්දැකීම් ද සැලකිල්ලට ගත් කාර්යක්ෂම ක්‍රමවේදයක් වීම ඉතා වැදගත් වේ.

ඇගයීම් හා තක්සේරුකරණය සඳහා ලබා දී ඇති උපදෙස් අනිවාර්ය වූවක් නොවන අතර අදාළ කටයුත්ත නිසි පරිදි ඉටුවේ යැයි මැන බලා ගැනීම සඳහා ඔබේ අභිමතය පරිදි වෙනස්කම් සිදු කර ගැනීමට අවකාශ සැලසේ. එසේ වුවද නිපුණතාව හා නිපුණතා මට්ටම් පිළිබඳ ව දක්වන සැළකිල්ල

වෙනස් නොවිය යුතු ය. සෑම නිපුණතා මට්ටමක් අවසානයේ දී ම ලබා දී ඇති පරිශීලනයන් පිළිබඳ ව මනා මගපෙන්වීමක් සිසුන් වෙත දැක්වීම අතිශයින් වැදගත් වේ.

මෙම ගුරු මාර්ගෝපදේශය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය නිපුණතා පාදකව සිදු කිරීම සඳහා අත්පොතක් වේවා යි ප්‍රාර්ථනා කරන අතර, නව සහස්‍රය ජය ගැනීමට දරුවාගේ මනස නිවැරදිම මාවතට යොමු කිරීම සඳහා මගපෙන්වන ධාර්මික අත්වැලක් වේවායි ප්‍රාර්ථනා කරමි.

**ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,**
**ශාස්ත්‍රපති පූජ්‍ය උඩුගම සුදස්සී හිමි,**
**දෙපාර්තමේන්තු ප්‍රධාන,**
ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව

| පටුන | පිටුව |
| --- | --- |


| | |
| --- | --- |
| අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ පණිවිඩය | i |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය | ii |
| විෂයමාලා කමිටුව | iii |
| ගුරු මාර්ගෝපදේශය පරිශීලනය කිරීම සඳහා උපදෙස් | iv |
| විෂය නිර්දේශයේ අන්තර්ගතය | viii |
| ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් | 1- 75 |
| පාසල පදනම් කරගත් තක්සේරුකරණය - හැඳින්වීම සහ ඉගෙනුම් උපකරණ | 76-86 |

# විෂය නිර්දේශයේ අන්තර්ගතය

# හැඳින්වීම

ජාතික අධ්‍යාපන ක්‍රියාවලියේ දී විෂයමාලාවට හිමිවන්නේ වැදගත් ස්ථානයකි. ජාතික අවශ්‍යතාවලට සරිලන අයුරින් විෂයමාලා සංශෝධනය කිරීම කාලීනව සිදුවන්නකි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ 6-11 ශ්‍රේණිවල සිසුන්ට 2015 වර්ෂයේ සිට හඳුන්වා දෙනු ලැබූ බුද්ධ ධර්මය නව විෂය නිර්දේශය ඉගෙනීම තුළින් බුදු සමයේ මූලික ඉගැන්වීම්, ශාසන ඉතිහාසය හා බෞද්ධ සංස්කෘතිය ආදී ක්ෂේත්‍ර පිළිබඳ නිපුණතා පාදක කරගනිමින් ප්‍රමාණාත්මකව, ගුණාත්මකව හා ප්‍රයෝජනවත්ව කරුණු අධ්‍යයනය කිරීමට අවස්ථාව සලසා දී ඇත.

ඒ අනුව අ.පො.ස. සාමාන්‍ය පෙළ කඩඉම පසුකර උසස් පෙළ බෞද්ධ ශිෂ්ටාචාරය විෂය අධ්‍යයනයට පිවිසෙන දරුවන්, බුද්ධ කාලීන භාරතීය ආගමික, සංස්කෘතික, සමාජ, ආර්ථික හා දේශපාලන පසුබිමට සාපේක්ෂව බෞද්ධ ඉගැන්වීම්වල අර්ථාන්විත බව ද, ත්‍රිවිධ රත්නය, බෞද්ධ ආචාර ධර්ම, ශාසන ඉතිහාසය, කලාශිල්ප, බෞද්ධ ආර්ථික හා දේශපාලන දර්ශනය, බෞද්ධ සංස්කෘතියේ ජාත්‍යන්තර ව්‍යාප්තිය ආදී ක්ෂේත්‍ර පිළිබඳ විස්තරාත්මක, විචාරාත්මක හා තුලනාත්මක ගවේෂණයකට මෙමගින් යොමු කරනු ලැබේ. ඒ තුළින් ද්විතීය මට්ටමේ දී අධ්‍යනය කරනු ලැබූ බුද්ධ ධර්මය විෂය, නිපුණතා පාදකව වඩාත් පුළුල් හා ක්‍රමානුකූල අධ්‍යයනය කර ශිෂ්‍යයා යොමුවන අයුරින් මෙම විෂය අන්තර්ගතය ඉදිරිපත් කිරීමට මෙහි දී උත්සාහ ගෙන ඇත.

ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනයට මුල් තැන දෙමින් ශිෂ්‍යයාට වඩාත් රුචිකත්වයෙන් විෂය කරුණු අධ්‍යයනය කිරීමට මෙමගින් අවකාශ සැලසේ. වනපොත් කිරීමට හෝ අසා දැන ගැනීමට වඩා දැනුම තමා විසින්ම එක්රැස් කොට ස්වාධීනව විශ්ලේෂණය කරමින් ජීවිතාවබෝධය සඳහා යොදා ගැනීමට ශිෂ්‍යයා පෙළඹවීමත්, ජීවන යහපුරුදුවලින් හා සමබර පෞරුෂයකින් හෙබි අනාගත පරපුරක් ජාතියට දායාද කිරීමත් මෙහි අපේක්ෂාවයි.

## ජාතික අධ්‍යාපන පද්ධතිය සඳහා අරමුණු

## ජාතික අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟා වීම සඳහා පුද්ගලයින්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතිය සහාය විය යුතුය. වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබීය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලීන් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ළඟාකර ගත යුතු පහත දැක්වෙන අරමුණු ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හඳුනා ගෙන ඇත. මෙම අරමුණු සපුරා ගැනීම අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

1. මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පය මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩනැගීම සහ ලාංකීය අනන්‍යතාව තහවුරු කිරීම.
2. වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම.
3. මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයාංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග වර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතාන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණය කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම.
4. පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත සහ මානව අගයයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම.
5. සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම.
6. පුද්ගලයාගේ සහ ජාතියේ ජීව ගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායී කාර්යයන් සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම.
7. ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයන් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම.
8. ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය, සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම.

## මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු මුදුන් පත් කර ගැනීමට දායක වනු ඇත.

1. **සන්නිවේදන නිපුණතා**

   සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනු කාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

   **සාක්ෂරතාව** සාවධාන ව ඇහුම්කන් දීම, පැහැදිලි ව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායි අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

   **සංඛ්‍යා පිළිබඳ දැනුම** භාණ්ඩ, අවකාශය සහ කාලය, ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

   **රූපක භාවිතය** රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති හා වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

   **තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය** පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද, සේවා පරිශ්‍රයන් තුළ දී ද, පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම.

2. **පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා**
   - නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තිය, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයා ගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා
   - ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයයන්
   - චිත්තවේගී බුද්ධිය

3. **පරිසරයට අදාළ නිපුණතා**

   මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරයන්ට අදාළ වේ.

   **සමාජ පරිසරය** ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පුද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායයන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

   **ජෛව පරිසරය** සජීවි ලෝකය, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුදු, ජලය, වාතය සහ ජීවය - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා

   **භෞතික පරිසරය** අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ශ්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මළපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදීතාව හා කුසලතාව ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් හා තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගු වේ.

**4. වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා**

ආර්ථික සංවර්ධනයට දායක වීම. තම වෘත්තීය ළැදියා සහ අභියෝග්‍යතා හඳුනා ගැනීම. හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම. යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා.

**5. ආගම සහ ආචාර ධර්මයන්ට අදාළ නිපුණතා**

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකුල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය.

**6. ක්‍රීඩාව හා විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා**

සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්.

**7. ඉගෙනීමට ඉගෙනුම් පිළිබඳ නිපුණතා**

ශීඝ්‍රයෙන් වෙනස් වන, සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීන ව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයින් හට ශක්තිය ලබා දීම.

ඉහත ජාතික අරමුණු හා මූලික නිපුණතා ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්ති රාමුවක් සඳහා යෝජනා ඇතුළත් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ 2003 දෙසැම්බර් වාර්තාවෙන් උපුටා ගැනිණ.

## විෂය අධ්‍යයනයේ අරමුණු

බෞද්ධ ශිෂ්ටාචාරයෙහි මෙන්ම එහි පදනම වන බුද්ධ ධර්මයෙහි ද මූලික අරමුණ වන්නේ හුදෙක් පාරලෞකික සුගතියක් හෝ විමුක්ති ප්‍රතිලාභයක් හෝ උදෙසා මඟ පෙන්වීම ම නොවේ. මානව වර්ගයාට ඓහලෞකික වශයෙන් පෞද්ගලික ව හා සාමූහික ව තෘප්තිමත් සාමකාමී ජීවිතයක් ගත කිරීම සඳහා වන ප්‍රායෝගික මාර්ගය පෙන්වාදීම ද මූලික අරමුණක් බව ඊට අදාළ බුද්ධ දේශනාවන්ගෙන් මෙන් ම ශාසන ඉතිහාසයෙන් ද සනාථ වේ.

මෙහි ඇතුළත් නිපුණතා මාලාව මඟින් මූලික වශයෙන් ම පහත දක්වෙන අරමුණු සාධනය කරගැනීමට අපේක්ෂා කෙරේ.

- සමානාත්මතාවාදී, විචාරපූර්වක හා ප්‍රගතිශීලී ආකල්ප ශිෂ්‍ය ප්‍රජාව තුළ සංවර්ධනය කිරීම.
- සිවුබඹ විහරණයෙන් පෝෂිත සමාජානුයෝගී චරිත ගොඩනැඟීමට දායක වීම.
- ස්ව ශක්තිය කෙරෙහි විශ්වාසය තබන, හේතුඵලවාදී ව සිතා කටයුතු කරන දරුපරපුරක් බිහි කිරීම.
- බෞද්ධ පදනමක් ඇති චාරිත්‍ර-වාරිත්‍රාදිය ප්‍රායෝගික ව ප්‍රගුණ කරන මිනිසුන් ඇති කිරීම.
- අතීත ආදර්ශයන් මඟින් අනාගතය ගොඩනඟා ගැනීමට මඟ පෙන්වීම.
- වඩාත් ප්‍රබුද්ධ, සංවේදී හා නිර්මාණශීලී දරුවන් සමාජයට දායාද කිරීම.
- හරවත් හා සමබර පෞරුෂයකින් හෙබි මතු පරපුරක් බිහිකිරීම.

බෞද්ධ ශිෂ්ටාචාරය විෂය ඉගෙනීම යනු ආගමික හා දාර්ශනික වටිනාකම් සහිත දැනුම් සම්භාරයක් එකතු කර ගැනීම පමණක් නොවන බව ද, එය පුද්ගලයාගේ හා සමාජයේ ආධ්‍යාත්මික හා ලෞකික අභිවෘද්ධිය උදෙසා මඟ සලසා ගැනීමක් විය යුතු බවද ගුරු සිසු දෙපක්ෂය විසින් ම වටහා ගැනීමත්, ඒ අනුව ක්‍රියා කිරීමත් මෙහි ඇතුළත් සියලු නිපුණතාවන්ගේ පොදු අර්ථය බව සැලකිය යුතු ය.

## විෂය නිර්දේශය - 13 වන ශ්‍රේණිය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 06.<br>මූලාශ්‍රය අනුසාරයෙන් බෞද්ධ සාරධර්ම අධ්‍යයනය කොට ප්‍රායෝගික ව ක්‍රියාත්මක කරයි. | 6.1<br>අගාරික පටිපදවට අදළ බෞද්ධ සාරධර්ම මූලාශ්‍රයානුසාරයෙන් අධ්‍යයනය කරයි. | සිගාලෝවාද සූත්‍රය<br>• සදිසා නමස්කාරය<br>• භෝග විනාශ මුඛ<br><br>• පරාභව සූත්‍රය - පිරිහීමේ කරුණු<br>• මංගල සූත්‍රය - දියුණු වීමේ කරුණු<br>**ධම්ම පදය**<br>මනෝ පුබ්බංගමා ධම්මා........<br>(යමක විග්ගය 1 ගාථාව)<br><br>මනෝ පුබ්බංගමා ධම්මා........<br>(යමක විග්ගය 2 ගාථාව)<br><br>උට්ඨානවතෝ සතිමතෝ ......<br>(අප්පමාද වග්ගය 4 ගාථාව)<br><br>අප්පමාදෙන මඝවා .........<br>(අප්පමාද වග්ගය 10 ගාථාව)<br><br>න පරේසං විලෝමානි<br>(පුප්ඵ වග්ගය 7 ගාථාව)<br><br>යෝ බාලෝ මCoaCoති බාල්‍යං.......<br>(බාලවග්ගය 4 ගාථාව)<br><br>මධුවා මCර්Coති බාලෝ.......<br>(බාලවග්ගය 10 ගාථාව)<br><br>නිධීනං ව පවත්තාරං.......<br>(පණ්ඩිත වග්ගය 1 ගාථාව)<br><br>න භජේ පාපකේ මිත්තේ<br>(පණ්ඩිත වග්ගය 3 ගාථාව)<br><br>න අත්තහේතු න පරස්ස හේතු<br>(පණ්ඩිත වග්ගය 9 ගාථාව) | • මූලාශ්‍රයාගත බෞද්ධ සාරධර්ම හඳුනා ගනියි.<br>• චරිත සංවර්ධනය උදෙසා බෞද්ධ සදුපදේශ උපයෝගි කොට ගනියි.<br>• ආදර්ශවත් ජීවිතයක් ගත කරයි.<br>• බෞද්ධ සාරධර්මවල වටිනාකම ප්‍රකට කරයි. | 32 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | | සහස්සමපි චේ වාචා......<br>(සහස්ස වග්ගය 1 ගාථාව)<br><br>යෝ චේ වස්සසතං ජීවේ<br>(සහස්ස වග්ගය 13 ගාථාව)<br><br>අචරිත්වා බ්‍රහ්මචරියං..........<br>(ජරාවග්ගය 11 ගාථාව)<br><br>අත්තානං චේ පියං ජCද්[ා<br>(අත්ත වග්ගය 1 ගාථාව)<br><br>අත්තනා ව කතං පාපං......<br>(අත්ත වග්ගය 5 ගාථාව)<br><br>සුකරානි අසාධූනි .......<br>(අත්ත වග්ගය 7 ගාථාව)<br><br>ජයං වේරං පසවති .....<br>(සුඛ වග්ගය 5 ගාථාව)<br><br>තණ්හාය ජායතී සෝකෝ ....<br>(පිය වග්ගය 8 ගාථාව)<br><br>අක්කෝධේන ජිනේ කෝධං..<br>(කෝධ වග්ගය 3 ගාථාව)<br><br>කායේන සංවරෝ සාධු......<br>(භික්ඛු වග්ගය 2 ගාථාව) | | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 07.<br>බුදු රජාණන් වහන්සේ ජීවමාන සමයේ සිට කණිෂ්ක රාජ්‍ය සමය තෙක් ශාසන ඉතිහාසයේ සුවිශේෂ සිද්ධි අධ්‍යයනය කර බුදු සසුනේ චිරස්ථිතිය උදෙසා කැප වීමෙන් ක්‍රියා කරයි. | 7.1<br>බුද්ධ කාලීන ධර්ම දූත සේවාව පිළිබඳ සමාලෝචනයක යෙදෙයි. | • බුදු රජාණන් වහන්සේගේ ධර්ම චාරිකා<br>• බුදු රජාණන් වහන්සේ ධරමාණ සමයේ භික්ෂු-භික්ෂුණී ධර්ම දූත සේවා | • බුද්ධ කාලීන ව පැවති බෞද්ධ ධර්මදූත සේවාවන් විස්තර කරයි.<br>• බුදු රජාණන් වහන්සේ හා තත්කාලීන ශ්‍රාවක - ශ්‍රාවිකාවන්ගේ ධර්මදූත සේවාව අගය කරයි.<br>• අර්ථවත් සන්නිවේදනයෙහි යෙදෙයි.<br>• යහපත් සන්නිවේදනයෙහි වටිනාකම සමාජගත කරයි. | 22 |
| | 7.2<br>භාරතීය ථේරවාද ධර්ම සංගායනා පිළිබඳ සවිස්තරාත්මක අධ්‍යයනයක යෙදෙයි. | • ත්‍රිවිධ ථේරවාද සංගායනා | • ථේරවාද ත්‍රිවිධ සංගායනාවන්හි පසුබිම හා ප්‍රතිඵල අධ්‍යයනය කරයි.<br>• අභියෝග හමුවේ ක්‍රියා කළ යුතු ආකාරය වටහා ගනියි.<br>• ශාසනික වගකීම් හා කාර්යභාරයන් ඉටු කරයි.<br>• ශාසනික සුරක්ෂිතතාව පිණිස ක්‍රියා කරයි. | 16 |
| | 7.3<br>අශෝක රජතුමාගේ හා කණිෂ්ක රජතුමාගේ ශාසනික මෙහෙය ඇගයීමට ලක් කරයි. | • අශෝක අධිරාජයාගේ හා කණිෂ්ක රජතුමාගේ ශාසනික සේවාව | • අශෝක රජතුමාගේ හා කණිෂ්ක රජතුමාගේ ශාසනික සේවාවෙහි වැදගත්කම පෙන්වා දෙයි.<br>• ශාසනික සේවාවන්හි යෙදීමට පුරෝගාමී වෙයි.<br>• ශාසන චිරස්ථිතිය උදෙසා කැප වෙයි<br>• ශාසනමාමක වෙයි. | 16 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 7.4<br>භාරතීය බෞද්ධ විශ්ව විද්‍යාලයයන්හි අධ්‍යාපන හා පරිපාලන පරිපාටිය හැඳින ගනියි. | • නාලන්දා විශ්වවිද්‍යාලයය<br>• වික්‍රමශිලා විශ්වවිද්‍යාලයය<br>• වලභි විශ්වවිද්‍යාලයය | • භාරතයෙහි පැවති ඉපැරණි බෞද්ධ විශ්වවිද්‍යාලයයන් පිළිබඳ ව අවබෝධ කර ගනියි.<br>• බෞද්ධ විෂයයන් පිළිබඳ උසස් අධ්‍යාපනයක් හා ඒ සඳහා නිසි අධ්‍යාපන පරිපාටියක් පැවති බව පිළිගනියි.<br>• අධ්‍යාපනයට අදාළ සැලසුම් සකස් කරයි.<br>• ගුණ නුවණින් යුතු පුරවැසියකු බිහි කිරීමට දායක වෙයි. | 14 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 08.<br>ශ්‍රී ලංකාවේ ආගමික දේශපාලනික හා සමාජීය සංවර්ධනය උදෙසා බෞද්ධ ශිෂ්ටාචාරය පදනම් වූ ආකාරය විමර්ශනය කරමින් ඊට අනුගත වෙයි. | 8.1<br>ප්‍රාග් මහින්ද යුගයේ ශ්‍රී ලංකාවේ පැවති ඇදහිලි හා විශ්වාස මහින්දගමනයෙන් පසු බුදු සමයට අනුව හැඩගැසුණු ආකාරය පැහැදිලි කරයි. | • ප්‍රාග් මහින්ද යුගයේ පැවති ආගමික ඇදහිලි හා විශ්වාස<br>• එම ඇදහිලි හා විශ්වාස බුදු සමයට අනුව හැඩ ගැසුණු ආකාරය | • ප්‍රාග් මහින්ද යුගයේ පැවති ආගමික ඇදහිලි හා විශ්වාසයන් බුදු සමයට අනුව හැඩ ගැසුණු ආකාරය අවබෝධ කොට ගනියි.<br>• බෞද්ධාගමික පිළිවෙත් අගය කරයි.<br>• බෞද්ධාගමික පිළිවෙත් විෂයයෙහි කැප වී කටයුතු කරයි.<br>• බෞද්ධාගමික පිළිවෙත්වල අගය පෙන්වා දෙයි. | 20 |
| | 8.2<br>රාජ්‍ය පාලනයේ දී ශ්‍රී ලාංකේය රජවරුන් බුදු සමයෙන් ලද ආභාසය හා ඔවුන් සිදු කළ ශාසනික සේවාව හැඳින ගනියි. | • රාජ්‍ය පාලනය කෙරෙහි බෞද්ධ ආභාසය<br>• දේවානම්පියතිස්ස, දුටුගැමුණු, වළගම්බා, මහසෙන් යන රජවරුන්ගේ ශාසනික සේවාව | • ශ්‍රී ලාංකේය රාජ්‍ය පාලනය විෂයයෙහි බෞද්ධ ආභාසය හා ඉපැරණි රාජ්‍ය පාලකයන්ගේ ශාසනික මෙහෙය විස්තර කරයි.<br>• ශ්‍රී ලාංකේය රජවරුන් බුදුසමයේ චිරස්ථිතිය හා සංවර්ධනය පිණිස ක්‍රියා කළ බව පිළිගනියි.<br>• බුදු සසුනේ චිරස්ථිතියට හා සංවර්ධනයට දායක වෙයි.<br>• ශ්‍රී ලාංකේය දේශපාලන අනන්‍යතාව ප්‍රදර්ශනය කරයි. | 20 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 8.3<br>මහාවිහාරය හා අභයගිරිය කේන්ද්‍ර කර ගනිමින් බිහිවූ ආගමික, සමාජයීය හා සංස්කෘතික ප්‍රවණතා හැඳින ගනියි. | • මහා විහාරය හා අභයගිරිය කේන්ද්‍රකොට ගෙන බිහිවූ ආගමික සමාජයීය හා සංස්කෘතික ප්‍රවණතා | • මහා විහාරය හා අභයගිරිය කේන්ද්‍රකර ගනිමින් ලක්දිව ඇති වූ විවිධ ප්‍රවණතාවන් හඳුනා ගනියි.<br>• මහා විහාරය හා අභයගිරිය ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ බෞද්ධ මධ්‍යස්ථාන බව පිළි ගනියි.<br>• ආගමික මූලස්ථානයන්හි කාර්යභාරයන් හා වගකීම් අවබෝධ කොටගෙන කටයුතු කරයි.<br>• ශ්‍රී ලාංකේය බෞද්ධ සංස්කෘතියේ අනන්‍යතාව සමාජගත කරයි. | 20 |
| | 8.4<br>බුදු සමයෙන් හැඩගැසුණු සිරිත් විරිත් හා සාරධර්ම ශ්‍රී ලාංකේය සමාජය තුළ තහවුරු වූ ආකාරය විමර්ශනයට ලක් කරයි. | • පුද්ගලයාගේ උපතේ සිට මරණය තෙක් ජීවිතයේ වැදගත් අවස්ථාවන් සමග බැඳුණු බෞද්ධ සිරිත් විරිත්<br>• ශාසන මාමකත්වය, දන්දීම, ආගන්තුක සත්කාරය, වැඩිහිටියන්ට සැලකීම, පරෝපකාරය, අවිහිංසාව, ගිලානෝපස්ථානය | • බෞද්ධ සාරධර්මවලින් පෝෂණය වූ ශ්‍රී ලංකාවේ සිරිත් විරිත් අධ්‍යයනය කරයි.<br>• බෞද්ධ සාරධර්ම සාර්ථක ජීවිතයකට පදනම බව සැකහැර තහවුරු කර ගනියි.<br>• බෞද්ධ සිරිත් විරිත් හා සාරධර්මවලින් පිරිපුන් සාර්ථක දිවිපෙවතක් ගත කරයි.<br>• යහපත් සිරිත් විරිත් හා සාරධර්ම පිරි සමාජයක් බිහි කිරීමට පුරෝගාමී වෙයි. | 20 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 09.<br>බුදු දහම පැතිර ගිය ආසියාතික රටවල ජන ජීවිතය බෞද්ධ සාරධර්ම වලින් පෝෂණය වූ අයුරු ගවේෂණය කරමින් බෞද්ධ උරුමය රැක ගැනීමට දයක වෙයි. | 9.1<br>මියන්මාරයට (බුරුමයට) හා ථායිලන්තයට (සියමට) බුදු දහම සම්ප්‍රාප්ත වීම හා එම රටවල ජනජීවිතය බෞද්ධ සාරධර්මවලින් පෝෂණය වූ ආකාරය ගවේෂණය කරයි. | • මියන්මාරයට බුදුදහම හඳුන්වාදීම සහ එරට සංස්කෘතිය බුදු සමයෙන් පෝෂණය වූ ආකාරය<br>• ථායිලන්තයට බුදු දහම හඳුන්වාදීම හා එරට සංස්කෘතිය බුදු සමයෙන් පෝෂණය වූ ආකාරය | • මියන්මාර හා ථායිලන්ත සංස්කෘතිය බුදු සමයෙන් පෝෂණය වූ අයුරු ගවේෂණය කරයි.<br>• මියන්මාර හා ථායිලන්ත බෞද්ධ සංස්කෘතියේ විශිෂ්ට ලක්ෂණ අගය කිරීමට පෙළඹෙයි.<br>• මියන්මාර හා ථායිලන්ත බෞද්ධ සංස්කෘතිය ආදර්ශනය කරයි.<br>• ජාත්‍යන්තරව බෞද්ධ සංස්කෘතිය ව්‍යාප්ත කිරීමෙහිලා දායක වෙයි. | 20 |
| | 9.2<br>චීනයට හා ජපානයට බුදු දහම සම්ප්‍රාප්ත වීම හා එම රටවල ජන ජීවිතය බෞද්ධ සාරධර්ම වලින් පෝෂණය වූ ආකාරය ගවේෂණය කරයි. | • චීනයට බුදුදහම හඳුන්වාදීම සහ එරට සංස්කෘතිය බුදු සමයෙන් පෝෂණය වූ ආකාරය<br>• ජපානයට බුදුදහම හඳුන්වාදීම සහ එරට සංස්කෘතිය බුදු සමයෙන් පෝෂණය වූ ආකාරය | • චීන හා ජපන් සංස්කෘතීන් බුදු සමයෙන් පෝෂණය වූ අයුරු ගවේෂණය කරයි.<br>• චීන හා ජපන් බෞද්ධ සංස්කෘතියෙහි විශිෂ්ට ලක්ෂණ අගය කිරීමට පෙළඹෙයි.<br>• චීන හා ජපන් බෞද්ධ සංස්කෘතිය ආදර්ශනය කරයි.<br>• ජාත්‍යන්තරව බෞද්ධ සංස්කෘතික හුවමාරුවකට දායක වෙයි. | 24 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 10.<br>බුදු සමයෙන් පෝෂණය වූ භාරතීය, ශ්‍රී ලාංකේය කලා ශිල්ප හා සාහිත්‍යය ඇගයීමට ලක් කරමින් ඒවා සංරක්ෂණයටත් සංවර්ධනයටත් දායක වෙයි. | 10.1<br>බුද්ධ ප්‍රතිමා හා ස්තූප නිර්මාණයට අදාළ භාරතීය කලා සම්ප්‍රදාය හැඳින ගනියි. | • බුද්ධ ප්‍රතිමාවේ ආරම්භය<br>• ගන්ධාර සම්ප්‍රදායය,මථුරා සම්ප්‍රදායය<br>• ශ්‍රී ලංකාවේ බුද්ධ ප්‍රතිමා<br>• බුද්ධ ප්‍රතිමාවල මුද්‍රා සහ ආසන<br>• භාරතීය ස්තූප කලාව- සාංචි, භාරුත් ස්තූප<br>• ශ්‍රී ලාංකේය ස්තූප කලාවේ ආරම්භය<br>• විවිධ ස්තූප ආකෘති<br>• ශ්‍රී ලාංකේය ස්තූපයේ අනන්‍යතා ලක්ෂණ<br>• ස්තූපයේ සංකේතාර්ථ | • බුද්ධ ප්‍රතිමා හා ස්තූප නිර්මාණකරණයෙහි ලා පාදක වූ විවිධ සම්ප්‍රදායයන් හා ඒවායේ සුවිශේෂතා අධ්‍යයනය කරයි.<br>• බෞද්ධ කලා නිර්මාණ අගය කරයි<br>• බෞද්ධ කලා කෘති සුරක්ෂිත කිරීමට දායක වෙයි.<br>• බෞද්ධ කලා කෘති නිර්මාණය කිරීමෙහි ලා පුරෝගාමී වෙයි. | 34 |
| | 10.2<br>අනුරාධපුර, පොළොන්නරු යුගවලට අයත් බුද්ධ ප්‍රතිමා හා ස්තූප අනුබද්ධ කලා නිර්මාණ පිළිබඳ ව අධ්‍යයනය කරයි. | • චෛතියඝර / වටදාගෙය<br>• බෝධිඝර<br>• පටිමාඝර<br>• වාහල්කඩ<br>• සඳකඩපහණ<br>• මුරගල<br>• කොරවක්ගල<br>• පියගැට පෙළ | • අනුරාධපුර, පොළොන්නරු යුගවලට අයත් බුද්ධ ප්‍රතිමා හා ස්තූප අනුබද්ධ කලා නිර්මාණ පිළිබඳ ව ගවේෂණය කරයි.<br>• ඉපැරණි ශ්‍රී ලාංකේය කලාකරුවාගේ කලා කෞශල්‍යය අගය කරයි.<br>• ඉපැරණි බෞද්ධ කලා කෘති සුරක්ෂිත කිරීමට දායක වෙයි.<br>• නව බෞද්ධ කලා කෘති නිර්මාණයෙහි ලා උත්සුක වෙයි. | 18 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 10.3<br>ශ්‍රී ලාංකේය සාහිත්‍යය හා ශිල්ප කලාවන් පෝෂණයෙහි ලා බුදුසමයෙන් ලැබුණු දායකත්වය ගවේෂණය කරයි. | • දඹදෙණි හා කෝට්ටේ යුගවල සිංහල ගද්‍ය හා පද්‍ය සාහිත්‍යය බුදුසමයෙන් පෝෂණය වූ ආකාරය<br>• ශ්‍රී ලංකාවේ බෞද්ධ චිත්‍ර කලාවේ තේමා, අරමුණු හා සුවිශේෂතා<br>• ශ්‍රී ලංකාවේ ජනකවි, ගීත හා නාට්‍ය කෙරෙහි බෞද්ධ ආභාසය | • බුදුසමයෙන් පෝෂණය වූ ශ්‍රී ලාංකේය සාහිත්‍යය හා ශිල්ප කලාවන් විචාරශීලී ව අධ්‍යයනය කරයි.<br>• සාහිත්‍යය හා විවිධ කලා මාධ්‍යය සමාජයකට සාරධර්ම සම්ප්‍රේෂණය කිරීමෙහි ලා මූලික වූ ප්‍රබල සන්නිවේදන මාධ්‍යයක් බව පිළිගනියි.<br>• උසස් රසඥතාවකට යොමු වෙයි.<br>• සදාචාරාත්මක පුරවැසියකු බිහි කරයි. | 24 |

# ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්

| | | | |
|---|---|---|---|
| නිපුණතාව | 6.0 | : | මූලාශ්‍රය අනුසාරයෙන් බෞද්ධ සාරධර්ම අධ්‍යයනය කොට ප්‍රායෝගික ව ක්‍රියාත්මක කරයි. |
| නිපුණතා මට්ටම | 6.1 | : | අගාරික පටිපදවට අදළ බෞද්ධ සාරධර්ම මූලාශ්‍රයානුසාරයෙන් අධ්‍යයනය කරයි. |
| කාලච්ඡේද සංඛ්‍යාව | | : | 20 යි. |
| ඉගෙනුම් පල | | : | |

- මූලාශ්‍රයාගත බෞද්ධ සාරධර්ම හඳුනා ගනියි.
- චරිත සංවර්ධනය උදෙසා බෞද්ධ සදුපදේශ උපයෝගි කොට ගනියි.
- ආදර්ශවත් ජීවිතයක් ගත කරයි.
- බෞද්ධ සාරධර්මවල වටිනාකම ප්‍රකට කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

සිගාලෝවාද, පරාභව හා මහා මංගල යන සූත්‍ර හා ධම්ම පදය, පුද්ගලයාගේ සාරධර්ම සංවර්ධනයට අදාළ වන ආකාරයත් මෙලොව පරලොව ජීවිතය සුඛිත, මුදිත කර ගැනීම සඳහා සදුපදේශ සපයන ආකාරයත් හඳුන්වා දෙමින් සාරධර්මවලට අනුගත ව පුද්ගලයා ආදර්ශවත් ජීවිතයක් ගත කරන බවට දැනුම්වත් කිරීමක් මෙයින් අපේක්ෂිත ය. ධම්ම පදයෙහි නිර්දිෂ්ට ගාථාවන්හි අර්ථය නිවැරදි ව දක්වමින් එම ගාථා හා බැඳුණු වර්තමාන හා අතීත කථා පිළිබඳ ව අවබෝධයක් ලබාදීම ද මෙයින් අපේක්ෂිත ය.

**විෂය අන්තර්ගතය**

**සිගාලෝවාද සූත්‍රය**

- බුදු රජාණන් වහන්සේ රජගහ නුවර වේළුවනාරාමයෙහි කලන්දක නිවාපයෙහි වැඩ වසන සමයෙහි සිගාල ගෘහපතියා අරභයා සිගාලෝවාද සූත්‍රය දේශනා කළ බව

- මාතාපිතා දිසා පුබ්බා
  ආචරියා දක්ඛිණා දිසා
  පුත්තදාරා දිසා පච්ඡා
  මිත්තා මච්චා ච උත්තරා
  දාස කම්මකරා හෙට්ඨා
  උද්ධං සමණබ්‍රාහ්මණා
  ඒතා දිසා නමස්සෙය්‍ය
  අලමත්ථො කුලෙ ගිහී

| | | |
|---|---|---|
| නැඟෙනහිර දිසාව | - | දෙමාපියෝ |
| දකුණු දිසාව | - | ගුරුවරු |
| බටහිර දිසාව | - | අඹුදරුවෝ |
| උතුරු දිසාව | - | මිත්‍රයෝ |
| යට දිසාව | - | දැසි - දස්සෝ |
| උඩ දිසාව | - | පැවිදි උතුමෝ |

| | | |
|---|---|---|
| මවුපිය | - | දූදරු |
| ගුරු | - | ශිෂ්‍ය |
| ස්වාමි | - | භාර්යා |
| මිත්‍ර | - | මිත්‍ර |
| සේව්‍ය | - | සේවක |
| ගිහි | - | පැවිදි |

ලෙස සමාජය වර්ගීකරණයකට ලක් කර එකිනෙකා විෂයයෙහි ඉටු කළ යුතු යුතුකම් හැට එකක් (61) දේශනා කර ඇති බව.

- යුතුකම් ඉටු කිරීම නිසා අන්‍යෝන්‍ය හා සුහදතා වර්ධනය වන බව.
- පවුල් සංස්ථාව හා සමාජ සංස්ථාව තුළ ප්‍රියජනක වටපිටාවක් නිර්මාණය වන බව

**භෝග විනාශ මුඛ**

| | | |
|---|---|---|
| රහමෙර පානය | - | සුරාමේරයමජ්ජ පමාදට්ඨානානු යෝගෝ |
| නොකල්හි වීථි සංචාරය | - | විකාල විසිඛාචරියානු යෝගෝ |
| නාට්‍ය දර්ශන සඳහා යාම | - | සමජ්ජාභිචරණං |
| දූ කෙළියෙහි යෙදීම | - | ජූතප්පමාදට්ඨානානුයෝගෝ |
| පාප මිත්‍ර සේවනය | - | පාපමිත්තානුයෝගෝ |
| අලස බව | - | ආලස්සානුයෝගෝ |

- භෝග විනාශ මුඛයකින් සිදුවන හානි හය බැගින් කරුණු තිස්හයක් දේශනා කොට ඇති බව
- භෝග විනාශ මුඛ සඳහා යොමු වන තැනැත්තා ආධ්‍යාත්මික හා ආර්ථික අංශවලින් පරිහානියට ලක්වන බව

**පරාභව සූත්‍රය**

- දේවතාවකු, භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹ, පුද්ගලයකුගේ පිරිහීමට හේතු වන කාරණ මොනවා දැයි යනුවෙන් අසන ලද ප්‍රශ්න දොළහකට පිළිතුරු වශයෙන් පරාභව සූත්‍රය දේශනා කළ බව
- ධර්මයට කැමති තැනැත්තා දියුණු වන්නා ය. ධර්මයට ද්වේශ කරන්නා පිරිහෙන්නා ය.
- අසත්පුරුෂයන් කෙරෙහි ප්‍රිය වෙයි. සත්පුරුෂයා කෙරෙහි ප්‍රිය නොකෙරෙයි. අසත්පුරුෂ ධර්මය ප්‍රිය කරයි. එය පුද්ගලයාගේ පිරිහීමට හේතු වේ.
- නිතර නිඳන සුලු වේ ද, පිරිස සමඟ එකට සිටීමට කැමති වේ ද, උට්ඨාන වීර්යයෙන් තොර වූයේ වේ ද අලස වූයේ වේ ද  නිතර කිපෙන සුලු වේ වේ ද  එය පුද්ගලයාගේ පිරිහීමට හේතු වේ.
- තමාට හැකියාව තිබිය දී මහලු ව ජරාවට ගිය මව හෝ පියා හෝ පෝෂණය නොකරයි ද  එය පිරිහීමට හේතුවකි.

- තමන් වෙත පැමිණෙන ශ්‍රමණයකු හෝ බ්‍රාහ්මණයකු හෝ වෙනත් යාචකයකු හෝ බොරුවෙන් රවටා ද එය පිරිහීමට හේතුවකි.
- බොහෝ රන් රිදී මුතු මැණික් හා කහවණු ඇති, ආහාරපාන හොඳින් ඇති පුද්ගලයෙක් තනි ව ම ඒවා පරිභෝග කෙරේ ද එය පිරිහීමට හේතුවකි.
- ජාතිය නිසා හෝ ධනය නිසා හෝ ගෝත්‍රය නිසා හෝ ඇතිවූ මානයෙන් යුක්ත යම් මිනිසෙක් සිය ඥාතීන් පහත් කොට සලකා ද එය පිරිහීමට හේතුවකි.
- මිනිසෙක් ස්ත්‍රීන් කෙරෙහි ලොල් වූයේ, සුරාවෙහි ලොල් වූයේ, සූදුවෙහි ලොල් වූයේ තමාට ලැබෙන ලැබෙන දේ විනාශ කරයි ද එය පිරිහීමට හේතුවකි.
- තම බිරියගෙන් සතුටට පත් නොවූයේ වෙසඟනන් වෙත යයි ද, පරඅඹුවන් වෙත යයි ද එය පිරිහීමට හේතුවකි.
- තරුණ විය ඉක්මවූ පුද්ගලයකු තිඹිරිගෙඩි වැනි පියවුරු ඇති තැනැත්තියක ආවාහ කොට ගෙන ඒ ද ඇය කෙරෙහි ඊර්ෂ්‍යාවෙන් නොනිඳා සිටී ද එය පිරිහීමට හේතුවකි.
- සුරාව, සූදුව, මස් මාංස ආදියෙහි ලොල් වූ ස්ත්‍රියක හෝ පුරුෂයකු හෝ පරිපාලනයෙහි යොදවයි නම් එය පිරිහීමට හේතුවකි.
- අල්ප වූ භෝග සම්පත් ඇති ව මහා තෘෂ්ණාවෙන් යුක්ත ව ක්ෂත්‍රිය කුලයෙහි උපන්නෙක් රජකම ප්‍රාර්ථනා කරයි ද එය පිරිහීමට හේතුවකි.

**මංගල සූත්‍රය**

- බුදු රජාණන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයෙහි වැඩ වාසය කරද්දී දෙව් මිනිසුන් වෙනුවෙන් ඉල්ලීමක් කළ එක්තරා දෙවියකුගේ ආරාධනයෙන් සැවැත් නුවර ජේතවනාරාමයේ දී මංගල සූත්‍රය දේශනා කළ බව.
- මෙලොව පරලොව සුගතිගාමී කර ගැනීමට මංගල කරුණු ඉවහල් වන බව.
- එම ඉල්ලීමට අනුව මංගල කරුණු තිස්අටක් (38) දේශනා කළ බව.
- 1. අසේවනාච බාලානං - බාලයන් ඇසුරු නොකිරීම
  2. පණ්ඩිතානංච සේවනා - පණ්ඩිතයන් ඇසුරු කිරීම
  3. පූජාච පූජනීයානං - පිදිය යුත්තන් පිදීම
  4. පතිරූපදේස වාසෝච - සුදුසු පෙදෙසක විසීම
  5. පුබ්බේච කතපුඤ්ඤතා - පෙර කළ පින් ඇති බව
  6. අත්තසම්මා පණීධිච - සිත මනාසේ පිහිටුවා ගැනීම
  7. බාහු සච්චංච - බොහෝ ඇසූ පිරූ තැන් ඇති බව
  8. සිප්පංච - ශිල්පයෙහි දක්ෂ බව
  9. විනයෝච සුසික්ඛිතෝ - තිදොර මනා ව හික්මවීම
  10. සුභාසිතා ච යාවාචා - යහපත් වචන කතා කිරීම
  11. මාතා උපට්ඨානං - මව පෝෂණය කිරීම
  12. පිතා උපට්ඨානං - පියා පෝෂණය කිරීම
  13. පුත්ත දාරස්ස සංඝහෝ - අඹුදරුවන්ට සංග්‍රහ කිරීම
  14. අනාකුලාච කම්මන්තා - නිරවුල් කර්මාන්ත කිරීම
  15. දානංච - දන් දීම
  16. ධම්ම චරියාච - ධර්මයෙහි හැසිරීම
  17. ඤාතකානංච - නෑයන්ට සංග්‍රහ කිරීම

| | | |
|---|---|---|
| 18. අනවජ්ජානි කම්මානි | - | නිවැරදි කර්මාන්තය |
| 19 ආරති විරති පාපා | - | පාපයෙන් වැළකීම |
| 20. මජ්ජපානාච සඤ්ඤමෝ | - | මත්පැනින් වෙන් වීම |
| 21. ධම්මේසු අප්පමාදෝච | - | ධර්මයෙහි අප්‍රමාද වීම |
| 22. ගාරවෝච | - | සුදුසුසාට ගරු කිරීම |
| 23. නිවාතෝච | - | යහපත් පැවතුම් ඇති බව |
| 24. සන්තුට්ඨීච | - | ලද දෙයින් සතුටු වීම |
| 25. කතඤ්ඤුතා | - | කළගුණ දන්නා බව |
| 26. කාලේන ධම්ම සවණං | - | සුදුසු කල බණ ඇසීම |
| 27. ඛන්තීච | - | ඉවසීම |
| 28. සෝච චස්සතා | - | කීකරුකම |
| 29. සමණානඤ්ච දස්සනා | - | ශ්‍රමණයන් දැකීම |
| 30. කාලේන ධම්ම සාකච්ඡා | - | සුදුසු කල බණ ඇසීම |
| 31. තපෝච | - | තපස |
| 32.බ්‍රහ්ම චරියාච | - | බඹසර විසීම |
| 33. අරිය සච්චාන දස්සනං | - | චතුරාර්ය සත්‍යදැකීම |
| 34. නිබ්බාණ සච්ඡි කිරියාච | - | නිවන් අවබෝධ කර ගැනීම |
| 35. ඵුට්ඨස්ස ලෝක ධම්මේහි | - | අටලෝ දහමෙහි කම්පා නොවීම |
| 36. අසෝකං | - | සෝක රහිත වීම |
| 37.විරජං | - | කෙලෙස් රහිත බව |
| 38. ඛේමං | - | සිත කෙලෙසුන්ගෙන් නිදහස් වීම |

**ධම්ම පදය**

- බෞද්ධයාගේ අත්පොත, පටිපදා මාර්ගය, ධර්ම මාර්ගය යන නම්වලින් හැඳින්වෙන ධම්ම පදය සමස්ත මනුෂ්‍ය වර්ගයාගේ ජීවිතයට ආලෝකය සපයන උපදේශ සංග්‍රහයක් බව
- බුදු පියාණන් වහන්සේ විසින් ඒ ඒ අවස්ථාවන්හි දී ඒ ඒ කරුණු නිමිති කොට දේශනා කරන ලද ගාථා 423ක් මෙහි ඇතුළත් බව
- විවිධ පුද්ගලයන්ගේ විවිධ වූ ජීවිත ගැටලු විසඳමින් ද ඔවුන්ගේ මෙලොව පරලොව සුවසෙත සලසමින් ද නිවන් මඟට යොමු කිරීමේ අරමුණින් දේශනා කළ ධම්ම පද ගාථා වර්තමාන සමාජයේ ගැටලු නිරාකරණය කර ගැනීමට ද ඉවහල් කර ගත හැකි බව
- ධම්ම පදය පරිශීලනය කිරීමෙන් උතුම් ගතිගුණ වර්ධනය වන බව

1. මනෝ පුබ්බංගමා ධම්මා - මනෝ සෙට්ඨා මනෝමයා
   මනසා චෙ පදුට්ඨෙන - භාසති වා කරොති වා
   තතො නං දුක්ඛමන්වෙති - චක්කංව වහතො පදං

**තේරුම :**

චෛතසික ධර්මයෝ හෙවත් සිතෙහි ඇතිවන ගතිහු සිත පෙරටු කොට ඇත්තාහු ය. ඒ ගතිහු සිත ම ශ්‍රේෂ්ඨ කොට පවතින්නෝ ය. සිතින් ම උපදින්නෝ ය. ඒ නිසා යමෙක් නරක, කිලිටි සිතින් යමක් කියයි නම්, කරයි නම් ගැල අදිනා ගොනාගේ පය අනුව රථ රෝදය යන්නාක් මෙන් ඔහු පසු පස්සේ දුක ලුහු බදියි.

2. මනෝ පුබ්බංගමා ධම්මා - මනෝ සෙට්ඨා මනෝමයා
මනසා චෙ පසන්නේන - භාසති වා කරොති වා
තතො නං සුඛමන්වෙති - ඡායාව අනපායිනී

**තේරුම :**

චෛතසික ධර්මයෝ හෙවත් සිතෙහි ඇතිවන ගතිහු සිත පෙරටු කොට ඇත්තාහු ය. ඒ ගතිහු සිත ම ශ්‍රේෂ්ඨ කොට පවතින්නෝ ය. සිතින් ම උපදින්නෝ ය. ඒ නිසා යමෙක් හොඳ පහන් සිතින් යමක් කියයි නම්, කරයි නම් සිරුර නොහැර යන සෙවණැල්ල මෙන් ඔහු පසු පස්සේ සැපය ලුහුබඳියි.

3. උට්ඨානවතො සතිමතො - සුචිකම්මස්ස නිසම්ම කාරිනො
සඤ්ඤ තස්සච ධම්ම ජීවිනො - අප්පමත්තස්ස යසෝභි වඩ්ඪති

**තේරුම :**

නැඟී සිටි වීර්ය ඇති, තමා ගැන තමාට ම දැනෙන සිහිය ඇති, නිදොස් දේ කරන, විමසා බලා කටයුතු කරන, තැන්පත් දැහැමි දිවි පැවතුම් ඇති නොපමා පුද්ගලයාගේ කීර්තිය මනා ව වැඩේ.

4. අප්පමාදේන මඝවා - දේවානං සෙට්ඨතං ගතො
අප්පමාදං පසංසන්ති - පමාදෝ ගරහිතෝ සදා

**තේරුම :**

ශක්‍රයා දෙවියන් අතර ශ්‍රේෂ්ඨ වූයේ නොපමා බව නිසා ය. බුද්ධාදි උතුමෝ නිතරම නොපමා බව පසසත්. පමාව හැම කල්හි ගරහන ලද්දකි.

5. න පරේසං විලෝමානි - න පරේසං කතාකතං
අත්තනොව අවෙක්ඛෙය්‍ය - කතානි අකතානිච

**තේරුම :**

අනුන්ගේ රළු පරළු කතාත්, අනුන් කළ නොකළ දේත් නොසෙවිය යුතු ය. තමා ම කළ නොකළ දේ සෙවිය යුතු ය.

6. යො බාලො මඤ්ඤති බාල්‍යං - පණ්ඩිතො වාපි තේනසො
බාලෝ ච පණ්ඩිතමානි - සවේ බාලොති වුච්චති

**තේරුම :**

යම් අනුවණ පුද්ගලයකුට තමාගේ මෝඩකම ගැන හැඟේ නම් ඒ කාරණයෙන් පවා ඔහු පණ්ඩිතයෙක් වේ. තමා පණ්ඩිතයෙකැයි සිතන මෝඩයා ඒකාන්තයෙන් ම මෝඩයෙකි. හෙවත් කිසිම සැකයක් නැති ව ඔහුට මෝඩයෙකැයි කියනු ලැබේ.

7. මධුවා මඤ්ඤති බාලෝ - යාව පාපං න පච්චති
යදා ච පච්චතී පාපං - අථ බාලෝ දුක්ඛං නිගච්ඡති

**තේරුම :**
මෝඩයා තමා කළ පව් මෝරා විපාක දෙන තෙක් එය මී පැණි මෙන් (මිහිරි කොට) සලකයි. යම් විටෙක පව මෝරා විපාක දෙයි ද එවිට ඔහු දුකට පැමිණේ.

8. නිධීනංව පවත්තාරං - යං පස්සේ වජ්ජ දස්සිනං
නිග්ගය්හවාදිං මේධාවිං - තාදිසං පණ්ඩිතං භජේ
තාදිසං භජමානස්ස - සෙයෙ‍්‍යා හෝති න පාපියෝ

**තේරුම :**
යමෙක් නිධානයක් දක්වන්නකු මෙන් කෙනෙකුගේ ඇති වරද දකී ද එයට තරවටු කොට අවවාද කරයි ද එබඳු වූ බුද්ධිමත් පඩුවකු සේවනය කළ යුතු ය. එබඳු කෙනෙකු ඇසුරු කරන්නාට වැඩක් ම වේ. අවැඩක් නොවේ.

9. න භජෙ පාපකේ මිත්තේ - න භජෙ පුරිසාධමේ
භජේථ මිත්තේ කල්‍යාණෙ - භජේථ පුරිසුත්තමේ

**තේරුම :**
පව්ටු, නරක මිතුරන් ඇසුරු නොකළ යුතු ය. අධම පහත් මිනිසුන් ඇසුරු නොකළ යුතු ය. කල්‍යාණ මිත්‍රයන් ඇසුරු කළ යුතු ය. උතුම් මිනිසුන් ඇසුරු කළ යුතු ය.

10. න අත්ත හේතු න පරස්ස හේතු - න පුත්තමිච්ඡේ න ධනං න රට්ඨං
න ඉච්ඡෙ‍්‍යය අධම්මේන සමිද්ධිමත්තනෝ - ස සීලවා පඤ්ඤවා ධම්මිකෝ සියා

**තේරුම :**
යම් නුවණැත්තෙක් තමා නිසා හෝ අනුන් නිසා හෝ පවක් නොකරයි ද වැරදි පිළිවෙළකින් පුතකු හෝ ධනය හෝ රටක් හෝ නොපතයි ද අධර්මයෙන් තමාගේ වැඩි දියුණුවක් බලාපොරොත්තු නොවෙයි ද ඔහු සිල්වතෙකි, බුද්ධිමතෙකි, ධාර්මිකයෙකි.

11. සහස්සමපි චේ වාචා - අනත්ථපදසංහිතා
ඒකං අත්ථපදං සෙය්‍යෝ - යංසුත්වා උපසම්මති

**තේරුම :**
අනර්ථ සිදු කරන පදවලින් යුත් වචන දාහක් වුවත් උතුම් නැත. යමක් ඇසීමෙන් මිනිසා සංසිඳීමට පත් වේ ද? එබඳු එක අර්ථවත් පදය පවා උතුම් ය.

12. යෝ චේ වස්සසතං ජීවේ - කුසීතෝ හීන වීරියෝ
ඒකාහං ජීවිතං සෙය්‍යෝ - විරිය මාරභතෝ දළ්හං

**තේරුම :**
කම්මැළි වූ කායික චෛතසික වීර්ය නැති කෙනෙකුගේ සියක් අවුරුදු ජීවිතයට වඩා දැඩි වීර්යයෙන් යුක්තයාගේ එක දවසක ජීවත්වීම ඉතා උතුම් ය.

13. අචරිත්වා බ්‍රහ්මචරියං - අලද්ධා යොබ්බනේ ධනං
සෙන්ති චාපාතිඛීණාවා - පුරාණානි අනුත්ථුනං

**තේරුම :**
ඇතැම් ගිහි පැවිද්දෝ තරුණ කාලයෙහි ලැබ ගත හැකි ධනයක් නැතහොත් විෂය රසයත් නොලැබ, බ්‍රහ්ම චරියාවත් නොහැසිර, නාකි වූ පසු යම් යම් දේ සිහි කරමින් දුන්නෙන් මිදී ගොස් වැටුණු ඊතලය මෙන් සෝකයෙන් හොවිත්.

14. අත්තානං චේ පියං ජඤ්ඤා - රක්ඛෙය්‍ය නං සුරක්ඛිතං
තිණ්ණමඤ්ඤතරං යාමං - පටිජග්ගෙය්‍ය පණ්ඩිතෝ

**තේරුම :**
තමාට තමා ප්‍රිය නම් තමා හෙවත් ආත්මය මනා ව රැක ගත යුතු ය. පණ්ඩිතයා බාල විය, මැදුම් විය, මහලු විය යන තුන් අවස්ථාවෙන් එක් අවස්ථාවක දී වත් කුසලින් තමා පෝෂණය කර ගත යුතු ය.

15. අත්තනාව කතං පාපං - අත්තජං අත්තසම්භවං
අභිමන්ථති දුම්මේධං - වජිරං වස්මමයං මණිං

**තේරුම :**
දියමන්තිය ගලින් ඇති වූ අන් මැණික් ගල් මෙන් තමා විසින් කරන ලද තමා තුළ ම උපන් තමාගෙන් ම ඇතිවූ පාපය අනුවණ වූ තමා මැඩලයි.

16. සුකරානි අසාධූනි - අත්තනෝ අහිතානිච
යං චේ හිතං ච සාධුං ච - තං වේ පරමදුක්කරං

**තේරුම :**
තමාට අහිත වූ අයහපත් දේ ලෙහෙසියෙන් කරගත හැකි ය. යම් දෙයක් තමාට හිත හෝ යහපත් හෝ වේ නම් එය කිරීම ඒකාන්තයෙන් ඉතා අමාරු ය.

17. ජයං වේරං පසවති - දුක්ඛං සේති පරාජිතෝ
උපසන්තෝ සුඛං සේති - හිත්වා ජය පරාජයං

**තේරුම :**
දිනන්නා පරදින්නා තුළ වෛරය ඇති කරයි. පරදින්නා දුකසේ වෙසේ. (රාගාදි කෙලෙසුන් කෙරෙන් මිදුණු) උපශාන්තයා ජයත්, පරාජයත් හැර සුව සේ වෙසෙයි.

18. තණ්හාය ජායතී සොකෝ - තණ්හාය ජායතී භයං
තණ්හාය විප්පමුත්තස්ස - නත්ථි සෝකෝ කුතෝ භයං

**තේරුම :**
ආශාව නිසා ශෝකය හට ගනියි. ආශාව නිසා බිය හට ගනියි. ආශාවෙන් වෙන් වූවහුට ශෝකයක් නැත. (එසේ නම්) බියක් කොයින් ද?

19. අක්කෝධේන ජිනේ කෝධං - අසාධුං සාධුනා ජිනේ
ජිනේ කදරියං දානේන - සච්චේන අලිකවාදිනං

**තේරුම :**
ක්‍රෝධ කරන්නා ක්‍රෝධ නොකිරීමෙන් (හෙවත් මෛත්‍රිය කිරීමෙන්) දිනිය යුතු ය.අසත්පුරුෂයා සත්පුරුෂකමෙන් දිනිය යුතු ය. මසුරා දීමෙන්, ත්‍යාගයෙන් දිනිය යුතු ය. බොරු කියන්නා සත්‍යයෙන් දිනිය යුතු ය.

20. කායේන සංවරෝ සාධු - සාධු වාචාය සංවරෝ
මනසා සංවරෝ සාධු - සාධු සබ්බත්ථ සංවරෝ
සබ්බත්ථ සංවුතෝ භික්ඛු - සබ්බ දුක්ඛා පමුච්චති

**තේරුම :**
කයෙන් සංවර වීම යහපත් ය. වචනයෙන් සංවර වීම යහපත් ය. සිතෙන් සංවර වීම යහපත් ය. හැම තැන්හි ම සංවරවීම යහපත් ය. හැම තැන්හි සංවර වූ (සදොර ම රැකි භික්ෂුව) සියලු දුකෙන් මිදේ.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණ මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත. පහත සඳහන් ඇගයීම් ද යොදා ගත හැකිය.

1. සදිසා සංග්‍රහය, නූතන සමාජයේ ක්‍රියාත්මක වූ සහ ක්‍රියාත්මක නොවූ අවස්ථා පිළිබඳ මාධ්‍ය වාර්තා ඇසුරෙන් බිත්ති පුවත්පතක් පිළියෙළ කරන්න.
2. ''සුරාපානයේ ආදීනව '' යන මාතෘකාව යටතේ උදෑසන රැස්වීමේ දී පැවැත්වීම සඳහා කතාවක් පිළියෙළ කරන්න.
3. නියමිත ධම්ම පද ගාථා ඇසුරින් ආදර්ශ පාඨ සකසා පාසල් පිරියත තුළ ප්‍රදර්ශනය කිරීමට සිසුන් යොමු කරවන්න.
4. බෞද්ධ ශිෂ්ටාචාරය විෂය හදාරන සිසුන් කණ්ඩායම් කර, නූතනයේ ඇතිවන සේව්‍ය- සේවක ගැටුම් අවම කර ගැනීමට සුදුසු යෝජනාවලියක් සකසා එය පන්ති කාමරයේ ප්‍රදර්ශනය කරන්න.
5. පරාභවයට හේතුවන කරුණු ඇතුළත් ලැයිස්තුවක් පිළියෙළ කරන්න.
6. ''මෙලොව දියුණුවට මංගල කරුණු'' යන මාතෘකාව යටතේ ලිපියක් ලියන්න.

**පරිශීලනයට**

| | | |
|---|---|---|
| සිගාලෝවාද සූත්‍රය | - | දීඝ නිකාය |
| පරාභව සූත්‍රය | - | සුත්ත නිපාතය |
| මංගල සූත්‍රය | - | සුත්ත නිපාතය |
| ධම්ම පදය | - | ඛුද්දක නිකාය |
| ධම්ම පදය | - | පාලි - සිංහල- දෙමළ- ඉංග්‍රීසි සංස්කරණය<br>ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව |

**නිපුණතාව 7.0** : බුදු රජාණන් වහන්සේ ජීවමාන සමයේ සිට කණිෂ්ක රාජ්‍ය සමය තෙක් ශාසන ඉතිහාසයේ සුවිශේෂ සිද්ධි අධ්‍යයනය කර බුදු සසුනේ චිරස්ථිතිය උදෙසා කැප වීමෙන් ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම 7.1** : බුද්ධ කාලීන ධර්ම දූත සේවාව පිළිබඳ සමාලෝචනයක යෙදෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 22 යි.

**ඉගෙනුම් පල** :

- බුද්ධ කාලීන ව පැවති බෞද්ධ ධර්මදූත සේවාවන් විස්තර කරයි.
- බුදු රජාණන් වහන්සේ හා තත්කාලීන ශ්‍රාවක - ශ්‍රාවිකාවන්ගේ ධර්මදූත සේවාව අගය කරයි.
- අර්ථවත් සන්නිවේදනයෙහි යෙදෙයි.
- යහපත් සන්නිවේදනයෙහි වටිනාකම සමාජගත කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

බුද්ධත්වයෙන් පසු ප්‍රථම ධර්ම දේශනයෙන් ආරම්භ වූ බුද්ධ කාලීන ධර්ම දූත සේවාවේ ස්වභාවය තත්කාලීන විශේෂ සිද්ධි හා අවස්ථා ගෙනහැර දක්වමින් බුදු රජාණන් වහන්සේ හා උන් වහන්සේගේ ශ්‍රාවක - ශ්‍රාවිකාවන් සිදු කළ ධර්ම දූත සේවාව පිළිබඳ සමාලෝචනයක් මෙමඟින් අපේක්ෂා කෙරේ.

**විෂය අන්තර්ගතය** :

- බුද්ධ කාලීන ධර්මදූත සේවාව ප්‍රධාන ආකාර දෙකකින් සිදුවූ බව.
- බුදු රජාණන් වහන්සේ විසින් හා උන් වහන්සේගේ අනුගාමිකයන් විසින් සිදු කරන ලද ධර්ම දූත සේවාව එම දෙආකාරය බව.
- බුදු රජාණන් වහන්සේ තම ශාසනයේ ප්‍රථම රහතන් වහන්සේලා හැට නම අරභයා
  ''චරථ භික්ඛවේ චාරිකං බහුජන හිතාය බහුජන සුඛාය ලෝකානුකම්පාය අත්තාය හිතාය සුඛාය දේවමනුස්සානං මා ඒකේන දේවේ අගමිත්ථ දේසේථ භික්ඛවේ ධම්මං ආදි කල්‍යාණං මජ්ඣේ කල්‍යාණං පරියෝසාන කල්‍යාණං සාත්ථං සබ්‍යංජනං කේවල පරිපුණ්ණං සංබලිඛිතං පරිසුද්ධං බ්‍රහ්ම චරියං පකාසේථ''
  යනුවෙන් දේශනා කොට ප්‍රථම ධර්ම දූත සේවාව සමාරම්භ කළ බව.

- මේ අනුව වඩාත් සංවිධානාත්මක, ප්‍රජානුකම්පාවෙන් යුතු ව දුෂ්කරතා විඳ දරා ගනිමින් කැප වීමෙන් ධර්මය ප්‍රචාරය කිරීමට ශ්‍රාවකයන් ආරම්භයේ සිට ම කැප වී කටයුතු කළ බව
- සූත්‍ර පිටකයේ බුද්ධ භාෂිතය මෙන් ම ශ්‍රාවක භාෂිතයන් ද ඇති බව
- සැරියුත්, මුගලන්, ආනන්ද, පුණ්ණමන්තානි, මහා කාශ්‍යප, සුනාපරන්තවාසී පුණ්ණ, මහාකච්චායන ආදි ධර්මධර, විනයධර ජ්‍යෙෂ්ඨ ශ්‍රාවකයන් ද ධර්මදූත සේවාවේ ප්‍රශස්ත කාර්යභාරයක් ඉටු කළ බව
- බුදු රජාණන් වහන්සේගේ මග පෙන්වීම මත සේලා, වජිරා, සෝම වැනි භික්ෂුණීන් වහන්සේලා ද ධර්ම දූත කාර්යයේ යෙදුණු බව.

- ප්‍රථම රහත් හැට නම ධර්ම දූත කාර්යයේ යෙදවූ බුදු රජාණන් වහන්සේ උරුවෙල් දනව්වේ විසූ උරුවේල කාශ්‍යප හා ඔවුන්ගේ අනුගාමිකයන් 500ක් දෙනා ද ගයා කාශ්‍යප හා ඔවුන්ගේ අනුගාමිකයන් 300ක් දෙනා ද නදී කාශ්‍යප හා ඔවුන්ගේ අනුගාමිකයන් 200ක් දෙනා ද ඇතුළු ජටිලයන් 1003 දෙනකුට ධර්ම දේශනා කොට ඒ සියලු ම දෙනා වහන්සේලා ද ධර්මදූත කාර්යයේ යෙදවූ බව.
- එම වර්ෂයේ දුරුතු පුර පසළොස්වක පොහො දින ලක්දිව මහවැලි ගංගා තලාවේ මහියංගණයේ මහානාග වනෝද්‍යානයෙහි පැවති යක්ෂ සමාගම අවස්ථාවට වැඩම කොට ධර්ම දේශනා කළ බව.
- බිම්බිසාර රජතුමා මුණ ගැසීමට රජගහ නුවර වැඩම කළ බුදු රජාණන් වහන්සේ ලට්ඨි වන නම් ස්ථානයක දී රජු ඇතුළු පිරිසට ධර්මය දේශනා කළ බව.
- එහි දී බිම්බිසාර රජු විසින් බුදු රජාණන් වහන්සේ ඇතුළු පිරිසට වේළුවනාරාමය පූජා කරන ලද බවත් එය බුදු සසුනේ ප්‍රථම ආරාම පූජාව බව.
- රජගහ නුවර විසූ සංජය පරිබ්‍රාජකයාගේ අනුගාමිකයන් වූ උපතිස්ස කෝලිත දෙදෙනාගෙන් උපතිස්ස පිරිවැජියා ඇතුළු නුවර දී අස්සජි හිමියන්ගෙන් ධර්මය අසා පැවිදි ව පසු කලෙක සැරියුත්, මුගලන් යන නාමයෙන් සම්බුද්ධ ශාසනයේ අගසවු තනතුරට පත් වූ බව.
- අනතුරු ව රජගහ නුවරින් කිඹුල්වතට වැඩි බුදු රජාණන් වහන්සේ ඇතුළු භික්ෂු පිරිසට ශාක්‍යයන් විසින් නිග්‍රෝධාරාමය පූජා කළ බව
- ශාක්‍යයන්ගේ මානය දුරු කළ බුදු රජාණන් වහන්සේ කිඹුල්වතට වැඩම කොට නන්ද කුමරු, රාහුල කුමරු ඇතුළු ශාක්‍යයන් පැවිදි උපසම්පදා කරවා ශාසනාභිවෘද්ධි කාර්යයේ යෙදූ බව.
- සමකාලීන ව පැවති සාමයික පරිසරය තුළ සිදු කෙරුණු ඉගැන්වීම් නිසා පීඩාවට පත් ව සිටියවුන් බුද්ධ ශාසනයේ ව්‍යාප්තියත් සමඟ විශාල ලෙස බුදු සසුනේ පැවිද්ද ලැබ ධර්මදූත කාර්යයේ යෙදුණු බව
- කෝසල, බිම්බිසාර, සුද්ධෝදන ආදි රජවරුන්ගේ අනුග්‍රාහකත්වය ද අනේපිඬු, බරණැස් සිටු, මිගාර වැනි සිටුවරුන්ගේ අමිල දායකත්වය ද කෝසල මල්ලිකා විශාඛා ආදි මහා උපාසිකාවරුන්ගේ දායකත්වය ද ධර්මදූත සේවාවේ ප්‍රතිපල ලෙස දැක්විය හැකි බව.
- බොහෝ සූත්‍ර දේශනා අවසානයේ දී බුදු රදුන් කළ ධර්ම දේශනා ශ්‍රවණය කළ ශ්‍රාවක පිරිස් ඇගයීමට ලක් කර ඇති බව

  '' අභික්ඛං තං භෝ ගෝතම - සෙය්‍යථාපි භෝ ගෝතම

  නික්බුජ්ජිත්වා උක්බුජ්ජෙය්‍ය ........ යනුවෙන් සඳහන් පරිදි පසු ව බොහෝ පිරිසක් ධර්මාවබෝධය ලබා බුදුසමය වැලඳ ගත් බව.

- කොණ්ඩඤ්ඤ රහතන් වහන්සේ දෝණවත්තු ප්‍රදේශයට වැඩම කොට ඥාති වර්ගයා ඇතුළු ප්‍රදේශවාසීන් සසුන් ගත කිරීමට කටයුතු කළ බව.
- සැරියුත් මුගලන් ආදි මහරහතන් වහන්සේලාගේ පවුලේ සාමාජිකයන් ඇතුළු නෑදෑ පිරිස් සසුන් ගත කළ බව.
- මහා කාශ්‍යප මහරහතන් වහන්සේ ධූතාංගධාරීන් අතර අග තනතුර හොබවමින් ගමින් ගමට ගොස් ධර්ම ප්‍රචාරය කළ බව.
- සිවු ශ්‍රාවක-ශ්‍රාවිකාවන්ගේ විශේෂ හැකියාවන් අගය කරමින් විවිධ අගතනතුරු ප්‍රදානය කිරීම ද ධර්ම දූත මෙහෙය ඵලදායක වීමට හේතු වූ බව.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණ මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත. පහත සඳහන් ඇගයීම් ද යොදා ගත හැකිය.

1. ධර්මදූත සේවාවෙහි දී බුදු රජාණන් වහන්සේ තම අරමුණ ඉටු කර ගැනීම සඳහා බාධක මැඩගෙන ක්‍රියා කළ ආකාරය සනිදර්ශන ව පෙන්වා දෙන්න.
2. තත්කාලීන පැවිදි ශ්‍රාවක -ශ්‍රාවිකාවන් ගෙන් ද එම ගුණාංගය පිළිබිඹු වන අයුරු නිදසුන් මඟින් පෙන්වා දෙන්න.
3. තනතුරු ලාභී උපාසකවරුන් පස්දෙනකු තනතුරු සහිත ව නම් කරන්න.
4. තනතුරු ලාභී උපාසිකාවන් පස්දෙනකු තනතුරු සහිත ව නම් කරන්න.
5. සාමය සමෘද්ධිය අරබයා බුද්ධ කාලීන උපාසක - උපාසිකා පිරිස්වලින් ලැබුණ අනුග්‍රහය ඇගයීමට ලක් කරන්න.
6. බුදු රජාණන් වහන්සේගේ ධර්ම ප්‍රචාරක සේවාව නිසි ලෙස ඉටු කර ගැනීම සඳහා තම දායකත්වය මනා ලෙස ලබාදුන් භික්ෂු-භික්ෂුණී උපාසක- උපාසිකා පිරිස් ඇසුරෙන් ඔබ සිත් ගත් චරිත ඇතුළත් කොට පොත් පිංචක් සකස් කරන්න.

**පරිශීලනයට**

- ථෙර ථෙරී ගාථා - ඛුද්දක නිකාය
- ආනන්ද හාමුදුරුවෝ - ගණේගම සරණංකර හිමි
- ගෞතම බුද්ධ චරිතය - බළංගොඩ ආනන්ද මෛත්‍රිය හිමි
- බුදුහාමුදුරුවෝ - ගණේගම සරණංකර හිමි
- බුදුන් දැකීම - සෙනෙවිරත්න මහලේකම්
- අසූමහා ශ්‍රාවකයෝ - ගයාන් චානුක විදානපතිරණ
- සම්බුදු සිරිත - කේ.ඩී.පී. වික්‍රමසිංහ

**නිපුණතාව 7.0** : බුදු රජාණන් වහන්සේ ජීවමාන සමයේ සිට කණිෂ්ක රාජ්‍ය සමය තෙක් ශාසන ඉතිහාසයේ සුවිශේෂ සිද්ධි අධ්‍යයනය කර බුදුසසුනේ චිරස්ථිතිය උදෙසා කැප වීමෙන් ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම 7.2** : භාරතීය ථේරවාද ධර්ම සංගායනා පිළිබඳ සවිස්තරාත්මක අධ්‍යයනයක යෙදෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 16 යි.

**ඉගෙනුම් පල** :

- ථේරවාද ත්‍රිවිධ සංගායනාවන්හි පසුබිම හා ප්‍රතිඵල අධ්‍යයනය කරයි.
- අභියෝග හමුවේ ක්‍රියා කළ යුතු ආකාරය වටහා ගනියි.
- ශාසනික වගකීම් හා කාර්යභාරයන් ඉටු කරයි.
- ශාසනික සුරක්ෂිතතාව පිණිස ක්‍රියා කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

සම්බුද්ධ පරිනිර්වාණයෙන් පසු සිදුවූ ප්‍රථම, ද්විතීය හා තෘතීය ධර්ම සංගායනාවන්හි පසුබිම, සංගායනාවල මූලික තොරතුරු හා ප්‍රතිඵල පිළිබඳ සමාලෝචනයක් මෙමගින් අපේක්ෂා කෙරේ.

**විෂය අන්තර්ගතය** :

- ''ශාසනයේ අභිවෘද්ධිය අපේක්ෂාවෙන් මහතෙරවරුන් රැස් වී බුද්ධ වචනය පිළිබඳ ව සාකච්ඡා කිරීම හා අවශ්‍ය තීරණවලට එළඹීම සංගායනාවක් පැවැත්වීම යන්නෙන් අදහස් වන බව.
- බුදු රජාණන් වහන්සේ ජීවමාන සමයේ දේශනා කළ දීඝ නිකායේ පාසාදික සූත්‍රයේ සංගායනා පිළිබඳ මඟ පෙන්වීමක් දැකිය හැකි බව. ''ධර්මය සිතින් විතර්කණය කිරීමත්, විවරණය කිරීමත්, මනසින් ප්‍රත්‍යවේක්ෂණය කර බැලීමත්, ධර්මයේ චිරපැවැත්මට උපකාරී වන බව. (පරියපුණන්ති, දෙසෙන්ති, වාචෙන්ති, සජ්ඣායන්ති, විතක්කෙන්ති, විචාරෙන්ති, මනසානුපෙක්ඛන්ති.) අං.නි.11, දුතිය සද්ධම්ම සම්මෝස සූත්‍රය 218-219 පිටු බු.ජ.මු.
- පාසාදික සූත්‍රයේ පෙන්වා දෙන අන්දමට ඔබ සියලු දෙනා ම එක්රැස් වී බ්‍රහ්ම චරියාවෙහි චිරස්ථිතිය පිණිස, අර්ථයෙන් අර්ථය, ව්‍යඤ්ජනයෙන් ව්‍යඤ්ජනය සංගායනා කරන්න වාද නොකරන්න යයි දේශනා කර ඇති බව (තස්මාතිහ චුන්ද සෝ වො මයා ධම්මා අභිඤ්ඤා දෙසිතො, තත්ත සබ්බෙහෙව සංගම්ම, සමාගම්ම, අත්ථෙන අත්ථං, ඛ්‍යඤ්ජනේන ඛ්‍යඤ්ජනං සංගායිකතබ්බං න විවදිතබ්බං යථයිදං බ්‍රහ්මචරියං අද්ධනියං අස්ස චිරට්ඨිතිකං) දී.නි.111, පාසාදික සූත්‍රය, 212 පිට, බු.ජ.මු
- ප්‍රථම සංගීතියේ ප්‍රධාන කාර්යභාරය වූ ධර්ම විනය එක්රැස් කොට, සංග්‍රහ කොට සංගායනා කිරීම පිළිබඳ පූර්වාදර්ශය බුදු රජාණන් වහන්සේ ධරමාණ අවධියේ සිට ම සංවර්ධනය වෙමින් පැවති බවට දීඝ නිකායේ සංගීති හා දසුත්තර යන සූත්‍ර ප්‍රබල සාක්ෂි වන බව.

- ප්‍රථම ධර්ම සංගීතිය පිළිබඳ වඩාත් ම පැරණි මූලාශ්‍රයය චුල්ලවග්ග පාලියේ පංචසතිකක්ඛන්ධකය වන අතර, දීපවංසය, මහාවංසය, සමන්ත පාසාදිකාව හා බෝධි වංශය ආදි මූලාශ්‍රය වල වැඩි විස්තර ඇතුළත් වන බව. චුල්ලවග්ගපාලියට අනුව ප්‍රථම සංගීතිය සිදු කිරීම සඳහා බලපෑ ආසන්නතම හේතු දෙකක් සඳහන් කළ හැකි බව. එනම්, සුභද්‍ර භික්ෂුවගේ අභද්‍ර වචනය හා විසිරී තිබූ ධර්මය හා විනය එක්තැන් කොට ආරක්ෂා කිරීම යනු කරුණු දෙක බව.

- ඇවැත්නි ! ශෝක නොකරවු, නොහඬවු ඒ මහ මහණ අප වෙහෙසට පත් කළේ ය. දැන් ඒකාන්තයෙන් අපට කැමැත්තක් කළ හැකි ය. නොකැමැත්තක් නොකළ හැකි ය. එසේ හෙයින් සොම්නස වුවමනා තන්හි කුමක් පිණිස දොම්නස් ව හඬම් ද? මෙතැන් පටන් අප කැමැත්තක් කරම් හ. නොකැමැත්තක් නොකරම්හ. (අලං ආවුසෝ මා සොචිත්ථ මා පරිදේවිත්ථ සුමුත්තාමයං තේන මහා සමනේන උපද්දුතාච මයං හෝම ඉදං වෝ කප්පති ඉදං වෝ න කප්පති ඉදානිපන මයං යං ඉච්ජිස්සාම තං කරිස්සාම) චුල්ලවග්ග පාලිය 344 පිට බු.ජ.මු.

- ඇවැත්නි ! අනාගතයෙහි ධර්මය යටපත් වී අධර්මය ඉස්මතු විය හැකි ය. විනය යටපත් වී අවිනය ඉස්මතු විය හැකි ය. එම නිසා ධර්මය හා විනය සංගායනා කළ යුතු ය. (හන්දමයං ආවුසෝ ධම්මංච විනයං ච සංගායාම පුරේ අධම්මෝ දිප්පති ධම්මෝ පටිබාහියති. පුරේ අවිනයෝ දිප්පති විනයෝ පටිබාහියති. පුරේ අධම්මවාදිනෝ බලවන්තෝ හොන්ති ධම්ම වාදිනෝ දුබ්බලා හොන්ති. පූරේ අවිනයවාදිනෝ බලවන්තෝ හොන්ති විනය වාදිනෝ දුබ්බලාහොන්ති) චුල්ලවග්ග පාලිය 346 පිට බු.ජ. ත්‍රි.ග්‍ර.මා.

- පූජාවලියේ ප්‍රථම ධම්ම සංගීතිය පැවැත්වීමට හේතුව මෙසේ සඳහන් වන බව. '' බුදු රජාණන් වහන්සේ විසින් ගැයුවා වූ ධර්මය නොයෙක් ජාතියෙහි මල් එක මලස්නෙක සැලුවා සේ ඒ ඒ සත්ත්වයන් උදෙසා දෙසූ හෙයින් පිළිවෙළක් නැති ව අනාගතයෙහි නො පවත්නා ලෙස තැබුයේ ය. එසේ හෙයින් දැන් ම ධර්ම සංගායනාව කරනු කැමතියේ ..................
(පූජාවලිය 649 පිට)

- ප්‍රථම ධර්ම සංගීතියට තුඩු දුන් හේතු හා එහි පසුබිම පිළිබඳ විවිධ තොරතුරු ථේරවාද නොවන බෙහෝ මූලාශ්‍රය වල දැක ගත හැකි ය. ටිබෙට් දුල්වා ග්‍රන්ථය එයට එක් නිදසුනක් බව.

- මීට අමතර ව ප්‍රථම ධර්ම සංගීතිය පැවැත්වීමට තවත් බොහෝ කරුණු හේතු වී යයි සඳහන් කළ හැකි බව.
- බුදු රජාණන් වහන්සේ ධරමාණ අවධියේ දී ම මහ සඟ සමුළු පවත්වා තිබීම. එම ආදර්ශයන් අනුව ධර්ම සංගායනා සිදු කිරීමට ජ්‍යෂ්ඨ ශ්‍රාවකයන් යොමු වූ බව.
- දීඝ නිකායේ මහා පරිනිබ්බාන සූත්‍රයට අනුව තමන් වහන්සේගේ ඇවෑමෙන් ධර්ම විනය ශාස්තෘත්වයෙහි ලා සැලකිය යුතු යැයි පිරිනිවීමට ආසන්න සමයෙහි බුදු රජාණන් වහන්සේ ප්‍රකාශ කොට තිබීම හා ඒ අනුව විසිරී තිබූ ධර්ම විනය ගොනු කොට එහි සුරක්ෂිත බව සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීමේ වැදගත්කම ජ්‍යෂ්ඨ ශ්‍රාවක භික්ෂූන් විසින් අවධානයට යොමු කරන ලද බව.

- පරිනිර්වාණයට ආසන්න සමයේ ඇති වූ තත්ත්වය එනම් ඡන්න තෙරුන් පිළිබඳ ගැටලුව, ආනන්ද හිමියන්ට චෝදනා පහක් එල්ල වීම ආදි වශයෙන් ශාසනය තුළ අර්බුද හා මතභේද උද්ගත වීම නිසා ඒවා මඟහරවා ගැනීමට ජ්‍යෙෂ්ඨ ශ්‍රාවක භික්ෂූන් පෙලඹවූ බව.
- සම්බුද්ධ පරිනිර්වාණයෙන් තෙමසකට පසු ව රජගහ නුවර වේභාර පර්වත ප්‍රාන්තයේ සප්තපර්ණි ගුහා ද්වාරයෙහි ප්‍රථම සංගීතිය සිදු කළ බව.

> ''රාජගහං බෝ මහාගොචරං පහූතසේනාසනං යන්නූන මයං
> රාජගහේ වස්සං වසන්තා ධම්මංච විනයංච සංගායෙය්‍යාම ''

චුල්ලවග්ග පාලිය, 546 පිට

- ප්‍රශ්නෝත්තර ආකාරයෙන් (පුච්ඡා විස්සජ්ජන) මෙම සංගායනාව මහා කාශ්‍යප මහරහතන් වහන්සේගේ මූලිකත්වයෙන් පැවැත්වූ බව.
- රහතන් වහන්සේලා 500ක් දෙනා සහභාගි වූ බැවින් පඤ්චසතිකා නමින් හැඳින්වූ බව.
- සංගීතිය සඳහා සම්පූර්ණ ආරක්ෂාව හා අනුග්‍රහය අජාසත් රජු විසින් සලසන ලද බව.

(සුමංගලවිලාසිනී)

- විනය සාසනයේ ආයුෂය වන බැවින් (විනයෝ නාම සාසනස්ස ආයු) මුලින් ම විනයට අදාළ සියල්ල මහාකාශ්‍යප මහරහතන් වහන්සේ උපාලි හිමියන්ගෙන් විමසූ බව (සුණාතු මේ ආවුසෝ සංඝෝ යදිසංඝස්ස පත්තකල්ලං අහං ආයස්මන්තං උපාලි විනයං පුච්ඡෙය්‍යන්ති) චුල්ලවග්ග පාලියේ 548 පිට

- මහා කාශ්‍යප මහරහතන් වහන්සේ ධර්මය පිළිබඳ ව සියලු දේ විමසීම් කරන ලද්දේ ආනන්ද මහරහතන් වහන්සේගෙන් බව
- විනය පාරාජික පාලි, පාචිත්තියපාලි, චුල්ලවග්ග පාලි, මහාවග්ග පාලි, පරිවාර පාලි යනුවෙන් ග්‍රන්ථ පහකට සංග්‍රහ කළ බව.
- ධර්මය දීඝ නිකාය, මජ්ඣිම නිකාය, සංයුත්ත නිකාය, අංගුත්තර නිකාය හා ඛුද්දක නිකාය යනුවෙන් නිකාය ග්‍රන්ථ පහකට සංග්‍රහ කළ බව.
- විනය මෙන් ම ධර්මය ද පිරිසිදු ව මුඛ පරපුරින් පවත්වා ගෙන යාම සඳහා ජ්‍යෙෂ්ඨ ධර්මධර හා විනයධර මහ තෙරවරුන් ප්‍රධාන උන් වහන්සේලාගේ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවලට පැවරුණ අතර එය භාණක භික්ෂූන් පත් කිරීමේ මුල් ම අවස්ථාව වූ බව ඒ අනුව,

| | | |
|---|---|---|
| දීඝ නිකාය | - | ආනන්ද මහරහතන් වහන්සේ ප්‍රමුඛ ශිෂ්‍යානුශිෂ්‍ය පරපුරට ද, |
| මජ්ඣිම නිකාය | - | සැරියුත් මහරහතන් වහන්සේගේ ශිෂ්‍යානු ශිෂ්‍ය පරපුරට ද, |
| සංයුක්ත නිකාය | - | මහාකාශ්‍යප මහරහතන් වහන්සේ ප්‍රමුඛ ශිෂ්‍යානුශිෂ්‍ය පරපුරට ද, |
| අංගුත්තර නිකාය | - | අනුරුද්ධ මහරහතන් වහන්සේ ප්‍රමුඛ ශිෂ්‍යානුශිෂ්‍ය පරපුරට ද, |
| ඛුද්දක නිකාය | - | සියලු තෙරුන් වහන්සේලාට ද, |

පැවරූ බව

- තමන් වහන්සේගේ ඇවෑමෙන් කුඩා අනුකුඩා ශික්ෂා පද භික්ෂූන්ට අවශ්‍ය නම් වෙනස් කර ගත හැකි යැයි බුදු රජාණන් වහන්සේ විසින් අනුදැන වදාර ලැබ තිබූ නමුදු එම ශික්ෂාපද නම් කොට නොතිබිණි. මෙම සංගායනාවේ දී එම ශික්ෂා පද පිළිබඳ ගැටලුව මතු වූ අතර ඒවා නිශ්චය කිරීමෙන් ඇති විය හැකි තත්ත්වය සැලකිල්ලට ගෙන සංඝයා නොපැනවූ නීති නොපැනවීමටත් පැනවූ නීති කඩ නොකොට ආරක්ෂා කිරීමටත් එකඟතාවකට පැමිණි බව.

  ''සංඝො අපඤ්ඤත්තං න පඤ්ඤපේති, පඤ්ඤත්තං න සමුච්ඡින්දති යථා
  පඤ්ඤත්තේසු සික්ඛා පදේසු සමාදායා වත්තති''

- ඡන්න තෙරුන්ට බ්‍රහ්ම දණ්ඩය පැනවීමට ද පූර්ව බුද්ධාවවාදය අනුව මෙම සංගීතියේ දී පියවර ගන්නා ලද බව.

  ''තේන ආනන්ද සංඝො මමච්චයේන
  ඡන්නස්ස භික්ඛුනෝ බ්‍රහ්මදණ්ඩං ආනාපේතුති''

- විසිරී පැවති ධර්මය හා විනය ඒකරාශි කොට ආරක්ෂා කිරීම ප්‍රථම සංගීතියෙන් සිදු වූ බව.

**දෙවන ධර්ම සංගායනාව**

- දෙවන ධර්ම සංගීතිය පිළිබඳ වඩාත් ම පැරණි මූලාශ්‍රය චුල්ලවග්ග පාලියේ සප්ත සතිකක්ඛන්ධකය වන අතර දීපවංසය, මහාවංසය, සමන්ත පාසාදිකාව හා බෝධිවංසය, නිකාය සංග්‍රහය ආදි මූලාශ්‍රය වල වැඩි විස්තර ඇතුළත් වන බව.
- චුල්ලවග්ග පාළියට අනුව දෙවන ධර්ම සංගායනාවට හේතු වී ඇත්තේ වජ්ජිපුත්තක භික්ෂූන් වහන්සේලා කරන ලද දසවස්තුව පිළිබඳ ඉදිරිපත් කිරීම බව (තේන ඛෝ පණ සමයේන වස්සසත පරිනිබ්බුතේ භගවතී වේසාලී වජ්ජිපුත්තකා භික්ඛු වේසාලියං දසවත්ථූනී දීපෙන්ති)
- කාලාන්තරයක් තිස්සේ භික්ෂූන් අතර වර්ධනය වූ මතභේදවල ප්‍රතිඵලය දස වස්තුව නිර්මාණය වීමට හේතු වූ බව
- එවකට වෘද්ධතම ජ්‍යෙෂ්ඨ භික්ෂුව වූ සබ්බකාමී මා හිමියන්ට දස වස්තුව ගැන සැලවීමෙන් පසු ඒ ගැන විමසීමට යස හිමියන් විශාලා මහනුවරට යැවූ අතර එවිට වජ්ජිපුත්තක භික්ෂූන් දස වස්තුවේ දසවැන්න අනුව මුදල් සම්මාදමේ යෙදී සිටිනු දැක එයට එරෙහි වූ විට එම වජ්ජිපුත්තක භික්ෂූන් යස හිමිට පටිසාරණී හා උක්ඛෙපතිය කර්මයෙන් දඬුවම් පැනවීමට සූදානම් වූ බව
- ද්විතීය සංගීතිය සඳහා මූලික ව ක්‍රියා කළෝ යස තෙරණුවෝ ය. එහෙත් සංගායනා මණ්ඩපයෙහි සබ්බකාමී මහ තෙරණුවන් මූලිකත්වය දැරූ බව.
- රේවත හිමියන් විසින් දස අකැප වස්තුව සබ්බකාමී මහ තෙරණුවන්ගෙන් විමසූ අතර පිළිවෙළින් එකී දස අකැප වස්තුව ම විචාරා අකැප යැයි බැහැර කොට ධර්ම විනය සංගායනා කොට එහි නිර්මල භාවය තහවුරු කරමින් සංගායනාව කළ බව.
- රේවත ස්ථවිරයන් සියලු ම භික්ෂූන් වහන්සේලාගෙන් ත්‍රිපිටකය කටපාඩම් තිබූ අභිධර්මාචාර්යවාදීන් මැනවින් දත් රහතන් වහන්සේලා 700ක් සංගායනාව සඳහා තෝරාගත් බව

- ඒ නිසා ම එම සංගීතිය ''සත්ත සතිකා'' යනුවෙන් හැඳින්වෙන බව.
- දස වස්තුව විනිශ්චය කිරීමට මුලින් ම උබ්බාහිකාවක් පත් කළ අතර එහි දී පෙරදිග (පාචීනක) දිසාව නියෝජනය කරමින් සබ්බකාමී, සාළ්හ, ඛුජ්ජසෝහිත, වාසභගාමි යන රහත් භික්ෂූන් වහන්සේලා හතරනමක් ද බටහිර (පාවෙය්‍යක) දිසාව නියෝජනය කරමින් රේවත, සානවාසී සාම්භූත, කාකණ්ඩපුත්‍ර යස, සුමන යන රහතන් වහන්සේලා හතර නමක් ද වශයෙන් අට නමක් එයට ඇතුළත් වූ බව
- කාලාශෝක රජුගේ පූර්ණ අනුග්‍රහය මේ සඳහා ලැබුණ බව
- උබ්බාහිකාවෙන් දසවස්තුව ප්‍රතික්ෂේප වීමෙන් අනතුරු ව සම්බුද්ධ පරිනිර්වාණයෙන් වසර සියයකට පසු ව දෙවන ධර්ම සංගීතිය විසාලා මහනුවර වාලුකාරාමයේ දී මාස අටක් මුලුල්ලේ පැවති බව
- සංගායනාවේ ප්‍රතිඵල වශයෙන් දස වස්තු ප්‍රතිග්‍රාහික දස දහසක් භික්ෂූන් අලජ්ජි පාපි භික්ෂූන් ලෙස නිගමනය කොට සසුනෙන් නෙරපූ බව.
- නිකායවලම්භන ශාස්ත්‍ර නම් ග්‍රන්ථයේ දැක්වෙන පරිදි මහාදේව හිමියන් විසින් ඉදිරිපත් කරන ලද රහතන් වහන්සේලා පිළිබඳ කරුණු පහ ද දෙවන ධර්ම සංගායනාවට හේතු වූ බව.
- විනය විරෝධීන් සසුනින් නෙරපා, ජ්‍යෙෂ්ඨ භික්ෂූන්ගේ මූලිකත්වයෙන් ශාසන සංශෝධනයක් කිරීම මෙම සංගීතයෙන් සිදු වූ බව
- දස වස්තුව පිළිබඳ සංගීති කාරක භික්ෂූන්ගේ තීරණය නොපිළිගත් වජ්ජි පුත්තක භික්ෂූන් සංගීති කාරක භික්ෂූන්ගෙන් වෙන් ව යාමෙන් මෙතෙක් නොබෙදී පැවති භික්ෂු සංවිධානය බෙදී ගොස් නිකාය භේදයට මුල පිරුණු බව
- වෙන්ව ගිය භික්ෂූන් මහා සාංඝික නමින් නව නිකායයක් පිහිටුවා ගත් අතර මුල් භික්ෂූන් ථෙරිය නමින් ප්‍රකට වූ බව
- නැවතත් මහා සාංඝිකයන් නිකාය 6කට ද, ථෙරවාදීන් නිකාය 12කට ද ආදි වශයෙන් නිකාය 18ක් ලෙස බෙදී ගිය බව.
- මහායාන බුදු දහම ඇති වීමේ මූලාරම්භය දෙවන ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයෙන් සිදු වූ බව.
- ශාසන ඉතිහාසයේ වටිනා සන්ධිස්ථානයක් ලෙස දෙවන ධර්ම සංගායනාව සඳහන් කළ හැකි බව

**තෙවන ධර්ම සංගායනාව**

- දෙවන ධර්ම සංගායනාවෙන් පසු අනුක්‍රමයෙන් වර්ධනය වූ ශාසනික අර්බුදකාරී වාතාවරණය ධර්මාශෝක අධිරාජයා දවස වන විට ප්‍රබල ව වර්ධනය වී තිබූ බව.
- සාම්ප්‍රදායික මූලාශ්‍රයවලට අනුව ධර්මාශෝක රජුගේ ලාභ සත්කාරවලට ගිජුවූ බොහෝ අන්‍ය තීර්ථකයන් ලාභ අපේක්ෂාවෙන් සම්බුදු සසුනට ඇතුළත් වූ බැවින් එම දුශ්ශීල භික්ෂූන්ගේ ක්‍රියා කලාපය තෙවන ධර්ම සංගායනාවට ප්‍රමුඛ හේතුව වූ බව.
- ශික්ෂාකාමී භික්ෂූහු ඔවුන් සමග විනය කර්ම නොකළ හ. සත් වසරක් එසේ විනය කර්ම නොකළ බව දැනගත් පසු ඒ ගැන සොයා බැලීමට ඇමතිවරයකු පත් කළ පසුව, ඔහු විනය කර්ම කරන ලෙස බල කොට භික්ෂූන් මරණයට පත් කිරීම හේතුවෙන් රජු කලකිරී පසු ව මොග්ගලීපුත්ත තිස්ස හිමියන්ගේ මග පෙන්වීම අනුව තෙවන ධර්ම සංගීතිය පැවැත්වූ බව

- සම්බුද්ධ පරිනිර්වාණයෙන් වසර 236ට පසු ව මොග්ගලීපුත්ත තිස්ස මහ රහතන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් සංගායනාව සිදු කළ බව
- මෙම සංගීතියට මොග්ගලීපුත්ත තිස්ස හිමියන් ඇතුළු ධර්මධර විනයධර ථෙරවාදී භික්ෂූන් වහන්සේලා දාහක් දෙනා (1000 ක්) සහභාගි වූ අතර එය ''සාහස්සිකා'' සංගීති නමින් හැඳින්වූ බව
- නව මසක් මුළුල්ලේ (09) පැවත්වූ මෙම සංගායනාවට ආරක්ෂාව හා අනුග්‍රහය ධර්මාශෝක අධිරාජයා සැලසූ බව.
- පැළලුප් නුවර අශෝකාරාමයේ දී සංගීතිය සිදු කළ බව.
- සංගීතිය අවසානයේ භික්ෂු වෙස් ගත් සමයවාදීන් ලෙස සැලකෙන දුසිල් භික්ෂූන් 60,000 ක් සසුනින් නෙරපා දමන ලද බව.
- එම ක්‍රියාමාර්ගය හේතුවෙන් ථෙරවාදී ධර්ම විනය රැක ගැනීමත් ශාසන පාරිශුද්ධිය ඇති කිරීමත් සිදු වූ බව
- තෙවැනි සංගීතියෙන් පසු ථෙරවාදී සම්ප්‍රදායයේ පුනරුදයක් හා අන්තර්ජාතික වශයෙන් ධර්ම ව්‍යාප්තියක් සිදුවූ බව
- සංගීතියෙන් පසු භික්ෂූන් වහන්සේලා විසින් නැවත විනය කර්ම නැතහොත් ශාසනික පිළිවෙත් ආරම්භ කිරීමෙන් ශාසන පුනරුදයක් ඇති වූ බව
- මොග්ගලිපුත්ත තිස්ස හිමියන් විසින් පරවාද මත 500ක් ඛණ්ඩනය කරමින් ස්වකීය මතවාදයන් (ථෙරවාදී) 500ක් උද්දීපනය කරමින් ''කථාවත්ථුප්පකරණය'' රචනා කළ නිසා අභිධර්ම පිටකය ද සම්පූර්ණ වූ බව
- ඒ අනුව තෙවන ධර්ම සංගීතියේ දී විනය, සූත්‍ර, අභිධර්ම වශයෙන් ත්‍රිපිටකය ම අංග සම්පූර්ණ වශයෙන් සංගායනා කළ බව.
- මොග්ගලීපුත්තතිස්ස මහ තෙරුන් වහන්සේගේ අනුශාසනා පරිදි ථෙරවාදී බුදු දහම ලෝක ආගමක් බවට ව්‍යාප්ත කරමින් ධර්මධර, විනයධර ප්‍රබල තෙරවරුන්ගේ නායකත්වයෙන් ප්‍රදේශ නවයකට ධර්මදූත සේවාව යෙදූ බව.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණ මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත. පහත සඳහන් ඇගයීම් ද යොදා ගත හැකි ය.

1. ධර්ම සංගායනාවක් යනු කුමක් දැයි පැහැදිලි කරන්න.
2. සම්බුදු සසුනේ චිර පැවැත්ම උදෙසා පළමු ධර්ම සංගායනාවෙන් සිදුවූ මෙහෙය ඇගයීමට ලක් කරන්න.
3. ''ශාසන ඉතිහාසයේ සන්ධිස්ථානයක් සටහන් කළ සංගායනාවක් ලෙස දෙවන ධර්ම සංගායනාව සැලකේ'' විමසන්න.
4. ශාසන ව්‍යාප්තිය කෙරෙහි තෙවන සංගායනාව උපකාරී වූ අයුරු විමර්ශනය කරන්න.
5. සංගීතිකාරක භික්ෂූන් විනය පිළිබඳ ව දැක්වූ උද්යෝගය අගයන්න.
6. සංගායනාත්‍රයයට අදාළ ව කෙටි ප්‍රශ්න දහයක් සකස් කරන්න.

**පරිශීලනයට :**

- මහාවංසය - සිංහල සංස්කරණය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල
- පූජාවලිය - සංස්කරණය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල
- සිංහල සමන්තපාසාදිකා - සුචරිත ගම්ලත්<br>ඊ.ඒ. වික්‍රමසිංහ
- නිකාය සංග්‍රහය - සංස්කරණය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල
- හියුං සියාං භ්‍රමණ වෘත්තාන්තය - පරි; පොල්වත්තේ බුද්ධදත්ත නාහිමි
- සද්ධර්මරත්නාකරය - සංස්; පී.සී.එස්. ගුණවර්ධන
- පරිනිර්වාණයට පසු සියවස් තුනක් - පාතේගම ඥාණාරාම හිමි
- බෞද්ධ ශිෂ්ටාචාරයේ මූලධර්ම හා වංශකථාව - චන්දිම විජේබණ්ඩාර<br>එච්.එම්. මොරටුවගම
- බුද්ධ ධර්මය - මාපලගම සෝමිස්සර හිමි

**නිපුණතාව 7.0** : බුදු රජාණන් වහන්සේ ජීවමාන සමයේ සිට කණිෂ්ක රාජ්‍ය සමය තෙක් ශාසන ඉතිහාසයේ සුවිශේෂ සිද්ධි අධ්‍යයනය කර බුදු සසුනේ චිරස්ථිතිය උදෙසා කැපවීමෙන් ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම 7.3** : අශෝක රජතුමාගේ හා කණිෂ්ක රජතුමාගේ ශාසනික මෙහෙය ඇගයීමට ලක් කරයි

**කාලච්ඡේද සංඛ්‍යාව** : 16 යි.

**ඉගෙනුම් පල** :

- අශෝක රජතුමාගේ හා කණිෂ්ක රජතුමාගේ ශාසනික සේවාවෙහි වැදගත්කම පෙන්වා දෙයි.
- ශාසනික සේවාවන්හි යෙදීමට පුරෝගාමී වෙයි.
- ශාසන චිරස්ථිතිය උදෙසා කැප වෙයි
- ශාසනමාමක වෙයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

අශෝක අධිරාජ්‍යයාගේ හා කණිෂ්ක රජතුමාගේ ශාසනික සේවාවේ වැදගත්කම අවධාරණය කිරීම මෙමගින් බලාපොරොත්තු වේ

**විෂය අන්තර්ගතය** :

**අශෝක අධිරාජ්‍යයා**

- මෞර්ය වංශයේ තුන් වන පාලකයා වූ අශෝක රජතුමා බෞද්ධ සාහිත්‍යයේ ධර්මාශෝක නමින් ද හින්දු සාමයික ග්‍රන්ථවල අශෝක වර්ධන නමින් ද හැඳින්වෙන බව.
- එහෙත් ඔහු තම සෙල්ලිපිවල නම සඳහන් කර ඇත්තේ දේවානම් පියදසි යනුවෙන් බව
- මස්කි ලිපියේ පමණක් අශෝක යන නම දක්නට ලැබෙන බව
- පියදසි ලාජා, දේවානම්පිය දසි, පියදාස චණ්ඩාශෝක, ධර්මාශෝක යන නම්වලින් ද අශෝක රජු හැඳින්වෙන බව
- අශෝක රජුගේ පියා බින්දුසාර වන අතර මව ධර්මා නම් බිසවක බව.
  (මහාවංසය හා සද්ධර්මරත්නාකරය)
- මහාවංසයේ සඳහන් වන ආකාරයට තම පියා වූ බින්දුසාර රජු රෝගාතුර වීමෙන් අනතුරු ව පාටලීපුත්‍රයට පැමිණ පියාගේ ඇවෑමෙන් රාජාභිෂේකය ලැබූ බව.
  (මහාවංශය පස්වැනි පරිච්ඡේදය 41 ගාථාව)
- කාලිංග යුද්ධයෙන් සිදුවූ මිනිස් ඝාතන නිසා කම්පාවට පත් ව සිටි අශෝක සත් හැවිරිදි නිග්‍රෝධ සාමණේර හිමියන්ගේ ඉරියවු, ගති පැවතුම්, නිරීක්ෂණය කිරීමෙන් පැහැදී මොග්ගලිපුත්ත තිස්ස හිමියන්ගේ මඟ පෙන්වීම අනුව බෞද්ධයකු වූ බව .
  (ලක්දිව මහායාන අදහස් 71-78 පිටු)

- අශෝක රජුගේ අගමෙහෙසිය වූයේ වේදිස නුවර දේවි නම් කුමරිය වන අතර ඔවුන් දෙදෙනාට දාව මහින්ද පුතණුවන් හා සංඝමිත්‍රා නම් දියණියන් ද වූ බව. (ම.ව. 13 පරිච්ඡේදය 9, 10, 11, 12 ගාථා)
- දඹදිව මධ්‍ය දේශය මූලික කොටගෙන බුදුදහම ව්‍යාප්ත කිරීමේ මෙහෙවරක නිරත වූ අශෝක රජතුමා බුදු දහමට ප්‍රමුඛස්ථානයක් පිරිනැමූ අතර තමා ද බෞද්ධයකු ලෙස කටයුතු කළ බව. (ම.ව. 13 වැනි පරිච්ඡේදය)
- සාංචි සාරානාත් යන ස්ථානයන්හි පිහිටුවා ඇති සෙල්ලිපිවල සඳහන් වන අන්දමට භේද භින්න වී සිටි භික්ෂූන් සමගි කළ ශාසන සංශෝධනයක අවශ්‍යතාව පෙන්වාදී එය ක්‍රියාවට නැංවූ බව. (මහාවංසය, සමන්ත පාසාදිකාව, අශෝක සිරිත)
- බුදු සසුනේ චිරස්ථිතිය පැතූ ධර්මාශෝක රජු බෞද්ධ වෙහෙර විහාර අසූහාරදාහක් කරවූ බව. (අසෝක සිරිත පිටු 68)
- සාංචි ස්තූපය එතුමා විසින් ගොඩනංවන ලද ස්තූප අතුරෙන් ප්‍රධාන වන බව
- සෙල්ලිපි, පුවරු ලිපි, ටැම්ලිපි, ස්තම්භ ලිපි ආදිය මඟින් මෙන් ම ධර්ම මහා මාත්‍රවරුන් මඟින් ද බුදු දහමේ එන ඉගැන්වීම් ප්‍රචාරණය කළ බව.
- අශෝක රජු විසින් පිහිටුවනු ලැබූ 13 වන ගිරි ලිපියෙන් ඔහු ධර්ම මහාමාත්‍යවරුන් පිටත් කර හරිනු ලැබූ ප්‍රදේශ පිළිබඳ ව සඳහන් කර ඇති බව. (අසෝක සිරිත පිටු 71)
- මිනිස් ඝාතන නිසා දූඩි කම්පාවට කලකිරීමට පත් අශෝක දික්විජය අතහැර ධර්ම විජය ප්‍රතිපත්තිය අනුගමනය කරන්නට පෙලඹුණ අයුරු කාල්සි ගිරි ලිපියෙන් දක්වා ඇති බව.
- ගිරිනාර් (3) ගිරි ලිපියට අනුව රටවැසියා අතර සදාචාරය වර්ධනය කරනු සඳහා නිලධාරීන් යෙදවූ අශෝක රජු ඒ සඳහා ඔවුන්ට උපදෙස් දුන් පුවත සඳහන් වන බව
- අශෝක රජු බෞද්ධයකු වුව ද අනෙකුත් ආගමිකයන්ට ද අවශ්‍ය පහසුකම් සලසා දුන් බවත් ආජීවකයන්ට ආරාම පූජා කළ පුවත බරාබර් ගුහා ලිපි තුනක සඳහන් වන අතර ගිරිනාර් (07) ගිරි ලිපියේ දක්වා ඇත්තේ සැම ආගමිකයකු කෙරෙහි ම සමානාත්මතාවක් ඇති කර ගත යුතු බව
- සංඝ සාමග්‍රිය ඇතිකොට භික්ෂු සංඝයා ප්‍රතිසංවිධානය කිරීමෙන් අනතුරු ව පැවැත්වූ තුන් වන ධර්ම සංගායනාව ද ධර්මාශෝක රජතුමාගේ ශාසනික සේවාව විදහාපාන බව
- සංගීතිය අවසානයේ මොග්ගලිපුත්ත තිස්ස මහා තෙරණුවන්ගේ උපදෙස් ඇති ව ප්‍රධාන වශයෙන් රටවල් නවයකට ධර්මදූතයන් පිටත් කර යැවූ බව.
- සිය දරු දෙදෙනා සසුන් ගත කිරීමට අශෝක රජු කටයුතු කළ බව
- ලක්දිවට උතුම් බුදු දහම හඳුන්වා දුන් මිහිඳු මහ රහතන් වහන්සේ සහ ශ්‍රී මහා බෝධිය වැඩම කළ සංඝමිත්තා මහ රහත් තෙරණිය ද අශෝක රජුගේ දරුවන් දෙදෙනා වන බව.

**කණිෂ්ක අධිරාජයා**

- කුශාන වංශ පරම්පරාවෙන් පැවත එන කණිෂ්ක රජු ''ද්විතීය ධර්මාශෝක'' යන නමින් හැඳින්වෙන බව. (බෞද්ධ ඉතිහාසය හා සංස්කෘතිය - ධර්මාචාර්ය විභාගය)
- කණිෂ්ක රජු අධිරාජයා බවට පත්වීමෙන් පසු කාශ්මීර, යාර්ඛාන්ඩ්, ඛෝටාන්, චීන තුර්කිස්ථාන් යන භාරතයෙන් පිට ප්‍රදේශ ද ආක්‍රමණය කර පාලනය කළ බව

- දෙසාළිස් වසක් (42) රාජ්‍ය විචාළ බව
- චීන දේශාටක පාහියන් හා හියුංසියාං යන තෙරවරුන් දෙපළ ම කණිෂ්ක රජු ගැන වාර්තා කර ඇති බව.
- උපතින් හින්දු භක්තිකයකු වූ කණිෂ්ක රජු බුදුසමය වැලඳගත් පුවත හියුංසියැං සිය වාර්තාවේ මෙසේ සඳහන් වන බව

  '' ධර්මාධර්ම විවේචනයක් නොකළ මේ රජ පළමුවෙන් බුදු දහම පහත් කොට සැලකී ය. දිනක් පඳුරු සහිත වගුරු බිමක ඇවිදින රජ, සුදු හාවකු දැක ඌ අනුව යන්නේ අඩි තුනක් පමණ උසැති කුඩා සෑයක් ගොඩනගන ගොපලු දරුවකු දුටුවේ ය. ''තෝ කුමක් කෙරෙයි'' දැයි ඇසූ විට, '' මෙවර රාජ්‍යයට පත් වන රජෙක් මගේ ශරීර ධාතුවලින් විශාල කොටසක් පිහිටුවා මේ තැන ස්තූපයක් ගොඩනංවන්නේ'' යැයි. ශාක්‍ය මුනීන්ද්‍රයන් විසින් ප්‍රකාශ කරන ලදි. කණිෂ්කාධිරාජයෝ පුරාකෘත පුණ්‍ය ඇත්තෝ ය. ඒ උත්තම ශාස්තෘවරයාගේ අනාවැකිය සිද්ධ කිරීමට මෙය යෝග්‍ය කාලය වන බව සිහිපත් කරමි යි උත්තර දී ගොපලු දරුවා නොපෙනී ගියේ ය. මේ කීම ඇසූ රජ මහත් ප්‍රීතියට පත් ව බෞද්ධාගමට ගෞරව කරමින් බුද්ධාගම ''වැලඳ ගත්තේ ය.''

  (හියුං සියැං භ්‍රමණ වෘත්තාන්තය, පි. 81)
- කණිෂ්ක රජු විසින් අඩි 500ක් උසට විශාල චෛත්‍යයක් ගොඩනගා සර්වඥ ධාතු නිදන් කළ අතර එහි අටනැළියක පමණ ධාතු ඇතුළත් යැයි සැලකෙන බව.
- කණිෂ්ක රාජ්‍ය සමයේ භාවිත වූ කාසිවල බුදු රුව දැකිය හැකි බව
- පුරුෂ පුරය තම රාජධානිය කරගත් රජු එහි විශාල ආරාමයක් ඉදි කළ බවත් එතුමාගේ අභාවයෙන් පසු ද දීර්ඝ කාලයක් එය සක්‍රිය දායකත්වයක් දැක්වූ බව
- මෙතුමාගේ රාජ්‍ය සභාවේ වසුමිත්‍ර පාර්ශ්ව නාගාර්ජුන, අශ්වඝෝෂ වැනි බෞද්ධ මහා පඬිවරු වාසය කළ බව
- බුද්ධ ශාසනය තුළ විවිධ විෂමතා දැනගත් රජු කුණ්ඩල වන විහාරයේ දී පාර්ශ්ව තෙරණුවන්ගේ ප්‍රධානත්වයෙන් සිවු වන ධර්ම සංඝායනාව පැවැත්වීමට අනුග්‍රහය දැක්වූ බව
- සංගායනාව අවසානයේ දී සාකච්ඡා කළ විභාෂා හා සූත්‍ර ඇතුළත් කර උපදේශ ශාස්ත්‍ර, විනය විභාෂා ශාස්ත්‍ර නමින් ග්‍රන්ථ දෙකක් සම්පාදනය කළ බව
- එම කෘති තඹපත්වල ලියා ශෛලමය මංජුසාවක බහා නිධන් කොට මහා සෑයක් ඉදිකළ බව
- එම චෛත්‍ය වර්තමානයේ ද කාශ්මීරයේ පවතින බව
- සිවුවන ධර්ම සංගායනාවෙන් පසු රජුගේ අනුග්‍රහයෙන් මධ්‍ය ආසියාවේ ධර්ම ප්‍රචාරක සේවාවක් ආරම්භ කළ බව
- සිවුවන ධර්ම සංගායනාව සර්වාස්තිවාදී සංගීතියක් ලෙස ප්‍රසිද්ධියට පත් ව ඇති බව

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණ මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත. පහත සඳහන් ඇගයීම් ද යොදා ගත හැකි ය.

1. අශෝක අධිරාජ්‍යයාගේ මුල් වකවානුව, රාජ්‍ය පාලනය හා බෞද්ධාගමික සේවාව පිළිබඳ සිසුන් සමග සාකච්ඡාවක් මෙහෙයවන්න.
2. අශෝක රජු විසින් ස්ථාපිත කළ ගිරිලිපි, ටැම්ලිපි, පුවරු ලිපි, ස්තම්භ ලිපි ආදියේ අන්තර්ගතය දක්වෙන පොත් පිංචක් නිර්මාණය කරන්න.
3. අශෝක ධර්මය පිළිබඳ ව වාර්තාවක් පිළියෙළ කරන්න.
4. කණිෂ්ක රජුගෙන් බුදු සසුනට වූ සේවාව යන මැයෙන් පුවත්පත් ලිපියක් ලියන්න.
5. සිවු වන ධර්ම සංගායනාවේ තොරතුරු ඇතුළත් වගු සටහනක් නිර්මාණය කරන්න.
6. අශෝක රජතුමාගේ ධර්ම ප්‍රචාරක සේවාව ප්‍රස්තුතීකරණයකින් (Presentation) ඉදිරිපත් කරන්න.

**පරිශීලනයට :**

| | | |
|---|---|---|
| • මහවංසය | - | සිංහල සංස්කරණය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, දෙහිවල. |
| • දීපවංසය | - | සිංහල සංස්කරණය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, දෙහිවල. |
| • සමන්තපාදිකාව (සංස්කරණය) | - | සුචරිත ගම්ලත්<br>ඊ.ඒ. වික්‍රමසිංහ |
| • අසෝක සිරිත | - | ගුණපාල සේනාධීර |
| • මධ්‍ය ආසියාවේ බුදුසමය | - | මංගල ඉලංගසිංහ |
| • බෞද්ධ ඉතිහාසය හා සංස්කෘතිය | - | බෞද්ධ ධර්මාචාර්ය විභාගය |
| • බෞද්ධ ලෝකය | - | බඹරැන්දේ සිරි සීවලී හිමි |
| • ලෝක බෞද්ධ සංස්කෘතිය | - | වැල්ලවත්තේ ආනන්ද හිමි<br>ටී.බී. කාංගහආරච්චි |
| • හියුං සියැං භ්‍රමණ වෘත්තාන්තය | - | පරි: පොල්වත්තේ බුද්ධදත්ත හිමි |
| • අශෝක සෙල්ලිපි | - | බෙල්ලන ඤාණවිමල හිමි |
| • අශෝක සිරිත හා අශෝක සෙල්ලිපි | - | වජිරාරාමවාසී පියදස්සී හිමි<br>ඊ.ඩබ්ලිව්. අදිකාරම් |

**නිපුණතාව 7.0** : බුදු රජාණන් වහන්සේ ජීවමාන සමයේ සිට කණිෂ්ක රාජ්‍ය සමය තෙක් ශාසන ඉතිහාසයේ සුවිශේෂ සිද්ධි අධ්‍යයනය කර බුදුසසුනේ චිරස්ථිතිය උදෙසා කැප වීමෙන් ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම 7.4** : භාරතීය බෞද්ධ විශ්වවිද්‍යාලයයන්හි අධ්‍යාපනය හා පරිපාලන පටිපාටිය හැඳින ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 14 යි.

**ඉගෙනුම් පල** :

- භාරතයෙහි පැවති ඉපැරණි බෞද්ධ විශ්වවිද්‍යාල පිළිබඳ ව අවබෝධ කර ගනියි.
- බෞද්ධ විෂයයන් පිළිබඳ උසස් අධ්‍යාපනයක් හා ඒ සඳහා නිසි අධ්‍යාපන පටිපාටියක් පැවති බව පිළිගනියි.
- අධ්‍යාපනයට අදාළ සැලසුම් සකස් කරයි.
- ගුණ නුවණින් යුතු පුරවැසියකු බිහි කිරීමට දායක වෙයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

භාරතීය බෞද්ධ විශ්වවිද්‍යාලයයන්හි ආධ්‍යාපනික තත්ත්වය කෙසේ පැවතියේ ද? ඒවායේ පරිපාලන පටිපාටිය කෙසේ සැකසී තිබුණේ ද? ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියක් කෙසේ සිදුවූයේ ද යන තොරතුරු සේම ඒවායේ සංවිධානය, සැලසුම්කරණය කෙසේවී ද යන්න මෙමගින් සාකච්ඡා කිරීමට අපේක්ෂිත ය.

**විෂය අන්තර්ගතය** :

**නාලන්දා විශ්වවිද්‍යාලයය**

- භාරතීය බෞද්ධ විශ්වවිද්‍යාලය අතුරින් විශාලතම හා කීර්තිමත් ම විද්‍යායතනය නාලන්දා විශ්වවිද්‍යාලයය බව
- පුරාතන මගධ රාජ්‍යයට අයත් රජගහ නුවර (වර්තමාන රාජගිරි) සිට සැතපුම් අටක් පමණ උතුරින් නාලන්දා ග්‍රාමයේ විශ්වවිද්‍යාලයය පිහිටා ඇති බව
- මෙම විශ්වවිද්‍යාලයෙහි පුරාවිද්‍යාත්මක සාධක හැරුණු කොටගෙන නාලන්දාව පිළිබඳ තොරතුරු පහත සඳහන් මූලාශ්‍රයයන්ගෙන් ලබාගත හැකි බව
    - හියුං සියැං නම් චින ජාතික භික්ෂුව විසින් ලියන ලද වාර්තාවලින් හා චීන ජාතික ඉට් සිංගේ වාර්තා මඟින්
    - එසේ ම නාලන්දාවේ ඉගෙන ටිබෙට් දේශයට ගොස් සිටි සුප්‍රකට පඬිවරුන්ගේ ටිබෙට් වාර්තා හා සෙල්ලිපි මඟින්
    - 15 වැනි සියවසේ දී තාරානාථ විසින් ලියන ලද '' බෞද්ධ ඉතිහාසය '' නම් ග්‍රන්ථය මඟින්

- සැරියුත් හිමියන්ගේ ජන්ම භූමිය ලෙස සැලකෙන නාලන්දාව උන් වහන්සේගේ ආදාහනයෙන් පසු එම ධාතූන් තැන්පත් කොට නාලන්දාවේ වෙහෙරක් ඉදි කළ බව.
- සූත්‍රාගත කරුණුවලට අමතර ව බුදු රජාණන් වහන්සේ ද කිහිප වරක් ම නාලන්දා ප්‍රදේශයේ සංචාරය කර ඇති බව
- ක්‍රි.ව. 415 සිට 455 තෙක් රජ කළ සක්‍රාදිත්‍ය හෙවත් පළමු වන කුමාරගුප්ත රජු නාලන්දාවට අවශ්‍ය කරන ගොඩනැගිලි ඉදි කර දී උසස් අධ්‍යාපන මධ්‍යස්ථානයක් ලෙස නම් කළ බව
- මහා විහාරය නමින් හැඳින්වූ නාලන්දා විශ්වවිද්‍යාලයය සක්‍රාදිත්‍ය රජුගෙන් පසු ඔහු පුත් බුද්ධගුප්ත රජු ද තථාගත ගුප්ත (වික්‍රමාදිත්‍ය) රජු ද පිළිවෙළින් පසුකාලීන ව නාලන්දා විශ්වවිද්‍යාලයයේ දියුණුවට කටයුතු කළ බව.
- තාරානාථගේ වාර්තාවලට අනුව නාලන්දාවේ ඉතිහාසය ක්‍රි.ව. 2 වැනි 3 වැනි සියවස්වල විසූ නාගාර්ජුන - ආර්යදේව යුගය තෙක් විහිදී යන බවත් මෙම මහාදාර්ශනිකයන් දෙදෙනා නාලන්දාවේ විසූ බව
- ක්‍රි.ව. 7 වැනි සියවස වන විට නාලන්දා විශ්වවිද්‍යාලයයේ දසදහසකට නේවාසික පහසුකම් සැලසූ විශාලතම අධ්‍යාපන මධ්‍යස්ථානයක් බවට පත් ව තිබූ බව
- හියුං සියැංගේ වාර්තා අනුව විශ්වවිද්‍යාලයයේ සංඝාරාම හයකින් යුක්ත ව තිබූ අතර මුළු විශ්වවිද්‍යාලයය ම උස් තාප්පයකින් වට කොට තිබී ඇති බව
- සැම සංඝාවාසයක් ම මහල් 5කින් යුක්ත වන අතර විවිධ කැටයම්වලින් කොත්කැරලිවලින් හා මකර තොරණ ආදියෙන් අලංකාර කරන ලද ගොඩනැගිලි විශාල ප්‍රමාණයක් තිබූ බව
- විශ්වවිද්‍යාල භූමිය පුරාවට පලතුරු මල්පොකුණුවලින් යුතු උයන් නිසා භූමිය අලංකාර වී තිබූ බව
- තට්ටු නවයකින් හා මන්දිර තුනකින් යුත් නාලන්දා පුස්තකාලයය රත්නසාගර, රත්නෝදය හා රත්නරඤ්ජන යන නම්වලින් හඳුන්වා ඇති බව
- උස් ගොඩනැගිල්ලක් මුදුනේ ආකාශ වස්තු පර්යේෂණාගාරයක් ද තවත් ගොඩනැගිල්ලක රසායනාගාරයක්, වෛද්‍ය විද්‍යාලයයක් හා රෝගී නේවාසිකාගාරයක් ද තිබූ බව
- ඉතා සුළු ප්‍රමාණයක් කැණීම් කර ඇති විශ්වවිද්‍යාල භූමියෙන් බුද්ධ ප්‍රතිමා, බෝසත් ප්‍රතිමා, දේව ප්‍රතිමා, ශිලාලේඛන, රාජ මුද්‍රා, විශ්වවිද්‍යාලයීය මුද්‍රා ආදිය සොයාගෙන ඇති බව
- හියුං සියැංගේ වාර්තාවට අනුව මෙහි ආචාර්ය, ශිෂ්‍ය, සේවක යන නේවාසික සංඛ්‍යාව දසදහසකට අධික ය. එයින් 1500ට අධික සේවක පිරිසක් සිටි බව
- මෙම විශ්වවිද්‍යාලයයේ ශිෂ්‍යයෝ කොටස් 2කි. පැවිදි හා බ්‍රහ්මචාරී වශයෙන් හැඳින්වූ ගිහි ශිෂ්‍ය පිරිසක් සිටි බව

අධ්‍යාපනය අංශ තුනක් යටතේ සිදු වූ බව

1. පශ්චාත් උපාධි ලැබීමට පැමිණ සිටි සිසු පිරිස
2. ද්විතීයක අධ්‍යාපනය අවසන් කොට ප්‍රථම උපාධිය ලැබීමට පැමිණි වයස අවුරුදු 20 සපිරූ ශිෂ්‍ය පිරිස බව
3. ද්විතීයක අධ්‍යාපනය සඳහා නාලන්දාවට ඇතුළත් වන සිසුන් පිරිස (අවුරුදු 15 පිරුණු ශිෂ්‍යයන්) ඒ සඳහා ඇතුළත් කරගෙන වර්ෂ අටක් පමණ අධ්‍යාපනය හදාරති.

- විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා ඉතා තියුණු පරීක්ෂණයක් පැවැත්වූ බවත් එය සිදු කරනු ලැබුවේ ''ද්වාරපණ්ඩිත'' යන නාමයෙන් පිදුම් ලත් ආචාර්යවරුන් බව
- ඇතුළත් වීමට සංස්කෘත භාෂාව සංස්කෘත ධර්ම ග්‍රන්ථ හා බුදධ ධර්මය පිළිබඳ මනා අවබෝධයක් තිබීම වැදගත් බව
- භාෂා විෂය ධාරාව, දර්ශන විෂය ධාරාව, බුද්ධ ධර්මය විෂය ධාරාව, ලෞකික විෂය ධාරාව හා ලලිත කලා විෂය ධාරාව යනුවෙන් විෂය ධාරා 5ක් ඔස්සේ ඉගැන්වීම් කටයුතු කළ බව
- සංස්කෘත භාෂාව  අනිවාර්ය වූ අතර එහි ශික්ෂා, ඡන්දස්, ව්‍යාකරණ, නිරුක්ති ආදිය ද ඊට ඇතුළත් වූ බව
- බුද්ධ ධර්ම විෂය අනිවාර්ය වූ හෙයින් මහායාන ධර්ම ග්‍රන්ථ හා සෙසු නිකායානුගත ඉගැන්වීම් පිළිබඳ දැනුමක් ලබාදුන් බවත්  මෙම විෂය යටතේ අභිධර්මය හා හේතු විද්‍යාව ද තන්ත්‍රයානයට අයත් පොතපත ද ඉගැන්වූ බව
- ජෛන දර්ශනය ද යෝග, ශාස්ත්‍රය ද බ්‍රාහ්මණ, ආරණ්‍යයක උපනිෂද් යන ග්‍රන්ථ ද සංඛ්‍යා, යෝග, න්‍යාය, වෛශේෂික, පූර්ව මීමාංසා, උත්තර මීමාංසා යන ෂඩ්විධ හින්දු දර්ශනය ද මෙහි උගන්වා ඇති බව
- තාරකා විද්‍යා ආදි වූ ලෞකික විෂයයන් සේම වේලාව මැනීම සඳහා පැතැටිය මගින් මුළු මගධයට ම නිවැරදි වේලාව ලබාදුන් බව
- ලෞකික විෂය ධාරාවට අයත් ආයුර්වේද විෂය යටතේ රෝග හඳුනා ගැනීම, ඖෂධ නියම කිරීම, රසායනික බෙහෙත් වර්ග පිළියෙළ කිරීම, ශල්‍යකර්ම ද විෂය නිර්දේශයට ඇතුළත් කොට තිබූ බව
- වේද මන්ත්‍ර, ජ්‍යොතිෂය, ආයුර්වේදය, සර්ප විද්‍යාව ආදි විෂයයන් ද මෙහි ඉගැන්වූ බව
- දේශන, සාකච්ඡා හා විවාද ආදී ඉගැන්වීම් ක්‍රම ශිල්ප භාවිත වූ අතර ප්‍රශ්න ඇසීමට ගැටලු සාකච්ඡා කිරීමට ශිෂ්‍යයන්ට සම්පූර්ණ නිදහස දී තිබූ බව
- සැම ශිෂ්‍යයකුට ම පෞද්ගලික ගුරුවරයකු සිටි අතර ශිෂ්‍යයාගේ විනය හා හැසිරීම පිළිබඳ භාරකාරත්වය ද එම ගුරුවරයාට ම දුන් බව
- හියුං සියැං පැමිණෙන විට ශීලභද්‍ර හිමියන් නාලන්දාවේ කුලපති හිමියන් වූ අතර ඔහු සීලයෙන්, ගුණයෙන් දැනුමෙන් හා වයසින් පිරිපුන් භික්ෂුවක වූ බව
- කුලපති යටතේ ප්‍රධාන කෘත්‍යාධිකාරී මණ්ඩල දෙකක් පැවතුණ බවත් සමස්ත විශ්වවිද්‍යාලයයට පාලන කටයුතු එම මණ්ඩල දෙකෙන් සිදු කළ බව
- විශ්වවිද්‍යාලයයට සිසුන් ඇතුළත් කිරීම, පාඨමාලා පිළියෙළ කිරීම, ආචාර්යවරුන්ට වැඩ බෙදාදීම, විභාග පැවැත්වීම, පොත් පිටපත් කිරීම, පොත් සම්පාදනය කිරීම එක් මණ්ඩලයකින් සිදු වූ බව
- ගොඩනැගිලි ඉදිකිරීම, ප්‍රතිසංස්කරණ කටයුතු, නේවාසිකයනට ආහාර, ගිලන්පස, වස්ත්‍ර සැපයීම. නේවාසික පහසුකම්  වෙන් කිරීම, සේවකයන් පාලනය කිරීම, ගම්වර පාලනය, ධාන්‍ය රැස් කිරීම ආදි පරිපාලන කටයුතු දෙවැනි මණ්ඩලයක් සිදු කළ බව
- විශ්වවිද්‍යාලයයේ අධ්‍යාපනය සම්පූර්ණයෙන් ම නිදහස් වූ අතර ආහාර හා නේවාසික පහසුකම් ද නොමිලයේ  ලබාදුන් බව

- නාලන්දාවේ ප්‍රථම කුලපති කවුරු ද යන්න නිශ්චිත නොවූවත් නාගර්ජුන හිමියන් එහි විසූ බව ද ආර්යදේව හිමි ද මෙහි කුලපතිවරයකු ලෙස කටයුතු කළ බව
- රාහුල භද්‍ර, අසංග, වසු බන්ධු දින්නාග, ගුණමති, ස්ථිරමති, ජයදේව, චන්ද්‍ර කීර්ති, ප්‍රභාමිත්‍ර, චන්ද්‍රගෝමින්, ජිනමිත්‍ර, ධර්මපාල, ශීලභද්‍ර, ධර්ම කීර්ති, ශාන්තරක්ෂිත, කමලශීල, බුද්ධ කීර්ති යන හිමිවරුන් නාලන්දාවේ කීර්තිමත් ආචාර්යවරුන් වූ බව
- මෙසේ ලොව සුපතළ කීර්තිමත් විද්‍යායතනයක් වූ වර්ෂ දෙදහසක් ...... විරාජමාන වූ නාලන්දා විශ්වවිද්‍යාලයය 13 වැනි සියවසේ දී මුස්ලිම් ආක්‍රමණිකයකු වූ භක්තියාර් බල්ජි විසින් භික්ෂූන් සමූල ඝාතනය කොට වටිනා ධර්ම ග්‍රන්ථ හා සියලු සම්පත් සහිත ගොඩනැගිලි ගිනිබත් කරන ලද බව
- මේ අවස්ථාවේ දී ඇතැම් භික්ෂූන් වටිනා පොතපත ද රැගෙන ටිබෙටයට පලා යන්නට ඇතැයි විශ්වාස කරන බව

**වික්‍රමශිලා විශ්වවිද්‍යාලයය**

- මගධ දේශයේ නාලන්දාවට සමීපයේ පිහිටි වික්‍රමශිලා විශ්විවිද්‍යාලයය කෝල්ගොං නගරයෙන් සැතපුම් 6ක් පමණ උතුරින් ද භාගල් පුරයෙන් සැතපුම් 24ක් නැගෙනහිරින් ද පිහිටා ඇති අතර නාලන්දා විශ්වවිද්‍යාලයයේ සහෝදර ආයතනයක් සේ ආරම්භ වී ඇත.
- නාලන්දා විශ්වවිද්‍යාලයයේ තන්ත්‍රයාන බුදුසමය පිළිබඳ මහාචාර්ය ධුරය හෙබවූ කම්පාල තෙරණුවන් පළ කළ අදහසට ගරු කළ ධර්මපාල රජතුමා (ක්‍රි.ව. 770-810) වික්‍රමශිලාවේ ප්‍රථම සංඝාරාමය ඉදි කළ බව
- මෙහි නඩත්තුව සඳහා ධර්මපාල රජතුමා විසින් ගම්වර පූජා කරන ලද බව
- පසු ව රජ පැමිණි නයපාල රජු හා කීර්තිපාල රජු මෙහි අභිවෘද්ධියට කටයුතු කර ඇති බව
- මනා සැලසුම් සහගත ව නිර්මිත වික්‍රමශිලාව මධ්‍යයෙහි ප්‍රධාන දේශන ශාලාව ඉදි කළ අතර එය ''විද්‍යාගෘහ'' නමින් ප්‍රචලිත ව පැවති බව
- විද්‍යා ගෘහයට ඇතුළුවීමට දොරටු හයක් වූ අතර ඒ සෑම දොරටුවක ම සංඝාවාසයක් ඉදි කර තිබූ බව
- විශාල තාප්පයකින් වටකොට තිබූ මුළු විශ්වවිද්‍යාලය භූමිය අලංකාර වූ අතර එක් එක් සංඝාරාමයට ''ද්වාරපණ්ඩිත'' නමින් හැඳින්වුණු පඬිවරුන් හයදෙනෙකු සිටි බව
- වික්‍රමශිලාවේ ප්‍රවේශය ද්වාරපණ්ඩිතවරුන් විසින් පවත්වනු ලබන පරීක්ෂණයක් මඟින් සිදු වූ බව
- ක්‍රි.ව. 983 -995 අතර කාලය තුළ පහත සඳහන් ද්වාරපණ්ඩිතවරුන් විද්‍යාමණ්ඩප භාර ව කටයුතු කර ඇති බව

| | | |
|---|---|---|
| 1. රත්නාකර ශාන්ති | - | පෙරදිග දොරටුව |
| 2. වාගීශ්වර කීර්ති | - | බටහිර දොරටුව |
| 3. නරෝපා | - | උතුරු දොරටුව |
| 4. ප්‍රඥාකරමති | - | දකුණු දොරටුව |
| 5. රත්න වජ්‍ර | - | පළමු වැනි දොරටුව |
| 6. ඥාන ශ්‍රී මිත්‍ර | - | දෙවැනි දොරටුව |

- වික්‍රමශිලාවෙහි අධ්‍යයන කටයුතු භාර ආචාර්යවරුන් 108 දෙනකු ද වෙනත් පරිපාලන කටයුතු සඳහා ආචාර්යවරුන් හා සම පුද්ගලයන් හයදෙනෙකු ඇතුළු 114 දෙනෙකු ද සිට ඇති බව.
- වික්‍රමශිලා විශ්වවිද්‍යාලයයේ විෂයමාලාව, නාලන්දා විශ්වවිද්‍යාලයයේ විෂයමාලාවට සමාන බවත් ශ්‍රාවකයාන බුදුසමය, මහායාන බුදුසමය සාමාන්‍ය පරිදි ඉගැන්වීම සිදුවූ අතර තන්ත්‍රයාන බුදුසමය පිළිබඳ සුවිශේෂ ව ඉගැන්වීම් කටයුතු සිදු වූ බව
- වික්‍රමශිලා විශ්වවිද්‍යාලයාධිපතීන් අතරින් දීපංකර, ශ්‍රී ඥාන හිමියන් හෙවත් අතීශ හිමියන් (ක්‍රි.ව. 890-1053) ඉතා කීර්තිමත් හා දෙස් විදෙස් ගෞරවාදරයට පාත්‍ර වූ ප්‍රධාන හිමිපාණන් වූ බව
- මෙම හිමිපාණන් ටිබෙට් දේශයේ වසර 15ක් පමණ ධර්මදූත මෙහෙවරෙහි යෙදී ඇති බව
- වික්‍රමශිලා විශ්වවිද්‍යාලයයේ කටයුතු සිදු කළ මණ්ඩල ගණනාවක් තිබූ බව
  1. ආචාර්ය මණ්ඩලය 2. අධ්‍යාපන මණ්ඩලය 3. පරිපාලන මණ්ඩල 4. විනය මණ්ඩලය
  5. ප්‍රවේශ මණ්ඩලය

- මෙම විශ්වවිද්‍යාලයයේ අභිධර්ම, ව්‍යාකරණ, තන්ත්‍රයාන යන විෂයයන් සඳහා වෙන් වෙන් වූ ගොඩනැඟිලි තිබූ බව
- ජගත් කීර්තියට පත් මෙම විශ්වවිද්‍යාලයය මඟින් උපාධි, පශ්චාත් උපාධි පිරිනැමූ අතර දෙස් විදෙස් ශිෂ්‍යයන් අධ්‍යාපනය ලද බව
- අටදහසක් පමණ ශිෂ්‍යයන් හා ආචාර්යවරුන් උපාධි උත්සවයට ප්‍රධාන ශාලාවට රැස් ව සිටි බව හියුංසියැගේ වාර්තාවල සඳහන් වන බව
- ක්‍රි.ව. 800 පමණ සිට කීර්තිමත් වූ හා ජගත් ගෞරවාදරයට පත් මෙම විශ්විවිද්‍යාලයය 12 වැනි සියවසේ නාලන්දා විශ්වවිද්‍යාලයය විනාශ කළ මුස්ලිම් ආක්‍රමණිකයන් ද විනාශ කළ බව

**වලභි විශ්වවිද්‍යාලයය**

- ක්‍රි. ව. 475 - 775 අතර විසූ මෛත්‍රික රජවරුන් ඉන්දියාවේ බටහිර ප්‍රාන්තයේ අගනුවර වූ වලභියෙහි ඉදි කළ මහා විහාරය පසුකාලයේ අධ්‍යාපන මධ්‍යස්ථානයක් ලෙස ප්‍රචලිත වී අවසානයේ ශ්‍රාවකයාන බුදුසමයේ කේන්ද්‍රස්ථානය ලෙස වලභි විශ්වවිද්‍යාලය වශයෙන් ගෞරවාදරයට පාත්‍ර වූ බව
- වලභි විශ්වවිද්‍යාලයය පිළිබඳ ව හියුං සියැංගේ භ්‍රමණ වෘත්තාන්තයේ මෙසේ සඳහන් වන බව. (''වලභියෙහි) ජනගහනය ඉතා අධික ය. රට ධනවත් ය. සියක් ලක්ෂයකට වඩා ධනය ඇති සිටු පවුල් සිය ගණනක් මෙහි වසත්, පිටරටවලින් ගෙනෙන දුර්ලභ අගනා ද්‍රව්‍යයෝ මෙහි රාශි වශයෙන් දක්නට ලැබෙත්. භික්ෂූන් 6000ක් පමණ වසන සංඝාරාම සියයක් පමණ ඇත්තේ ය. නා නා දේව භක්තිකයන්ගේ දෙවස්ථාන සිය ගණනක් ද ඇත්තා හ. බුදු රදුන් ජීවමාන කළ නොයෙක් විට මෙරටෙහි සැරි සැරූ සේක. උන් වහන්සේ නැවති සිටි තැන්වල අශෝක අධිරාජ්‍යයන් විසින් ස්තුපයෝ ගොඩනංවන ලද හ.

  (හියුං සියැං භ්‍රමණ වෘත්තාන්තය - පි.334 - 335 / බෞද්ධ ධර්මාචාර්ය විභාගය - පිටු 93)

- හියුං සියැං තෙරුන්ගේ වාර්තා අනුව මෙම විශ්වවිද්‍යාලයයේ සංඝාරාම 100ක් (සීයක්) තිබූ අතර භික්ෂූන් වහන්සේලා 6000නමක් වැඩ වාසය කළ බව.
- සම්මිතිය බෞද්ධ නිකායයේ ඉගැන්වීම් පුළුල් වශයෙන් ඉගැන්වූ වලභි විශ්වවිද්‍යාලයයට දෙස් විදෙස් ශිෂ්‍යයයන් බොහෝ පිරිසක් පැමිණ අධ්‍යාපනය ලැබූන යි ඉට්සිංගේ වාර්තාවේ සඳහන් වන බව.
- අතිවිශාල පුස්තකාලයයක් තිබූ මෙම විශ්වවිද්‍යාලයයට පුස්තකාලයයීය අරමුදලක් ද තිබූ බව ගුහසේන රජතුමා විසින් පිහිටුවන ලද සෙල්ලිපියක සඳහන් වන බව.
- පුළුල් විෂයමාලාවක් ක්‍රියාත්මක වූ මෙහි සම්මිතිය නිකායික ඉගැන්වීම්වලට ප්‍රධාන තැනක් හිමි වූ අතර පොදු වශයෙන් බුද්ධ ධර්මය තුලනාත්මක ව ඉගැන්වූ බව.
- චතුර්වේදය, බ්‍රාහ්මණ, ආරණ්‍යක, උපනිෂද් ආදි කොට ඇති හින්දු දර්ශන ඉගැන්වීම් ද හින්දු ධර්මශාස්ත්‍ර, දේශපාලන විද්‍යාව, වාණිජ විද්‍යාව සහ කෘෂිකර්මය, ආර්ථික විද්‍යාව, චිකිසා විද්‍යාව ආදි ලෞකික විෂයයන් ද ඉගැන්වූ බව
- වලභි විශ්වවිද්‍යාලයයේ උපාධිධාරීන් ඉගෙනුම් කටයුතුවලින් පසු ව ස්වකීය නිපුණත්වය, රාජ්‍ය සභා ඉදිරියේ දී ප්‍රදර්ශනය කළ වග ඉට්සිං වාර්තාවේ සඳහන් වන බව
- වාද විවාද හා උත්සව අවස්ථාවන්හි දී මොවුන් සිය කුශලතා ප්‍රදර්ශනය කොට වලභි විශ්ව විද්‍යාලයයට කීර්තිය ගෙන දුන් බව
- නාලන්දා විශ්වවිද්‍යාලයයෙන් පෝෂණය වූ එහි ආදි ගුරුවරුන් වන සුප්‍රකට ගුණමතී හා ස්ථිරමතී යන පඬිවරුන් දෙදෙනා වලභි විශ්විද්‍යාලය ගොඩනැගූ නිසා නාලන්දා පරිපාලන රටාවට සමීප වූ පරිපාලන රටාවක් මෙහි තිබූ බව
- අධ්‍යාපනය, පරිපාලනය, පරීක්ෂණ, පුස්තකාල ආදි සියලු කටයුතු නාලන්දාවට අනුරූප වන පරිදි මෙහි ක්‍රියාත්මක වු බව
- වලභි විශ්වවිද්‍යාලයය ප්‍රධාන හීනයාන අධ්‍යාපන මධ්‍යස්ථානය ලෙස කටයුතු කළ බව
- ක්‍රි.ව. 475 සිට 1200 දක්වා අඛණ්ඩ ව කීර්තිමත් හීනයාන විද්‍යස්ථානයක් ලෙස පැවති වලභි විශ්වවිද්‍යාලයය 13 සියවසේ සිදුවූ මුස්ලිම් ආක්‍රමණ නිසා විනාශ වූ බව

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණ මැන බැලීමට සුදුසු අකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත. පහත සඳහන් ඇගයීම් ද යොදා ගත හැකි ය.

(1) නාලන්දා, වික්‍රමශිලා හා වලභි යන විශ්වවිද්‍යාලවල ප්‍රවේශය, පරිපාලන ව්‍යූහය, විෂයමාලාව හා එහි මූලික වූ හිමිවරුන්, රජවරු පිළිබඳ වගුවක් නිර්මාණය කරන්න.

(2) ඉහත විශ්වවිද්‍යාලය තුනෙන් එකක විෂයමාලාව පිළිබඳ ව පුවත්පතකට ලිපියක් සකසන්න.

(3) භාරතීය විශ්වවිද්‍යාලයයෝ යන මැයෙන් පොත් පිංචක් නිර්මාණය කරන්න.

**පරිශීලනයට :**

| | | |
|---|---|---|
| • හියුං සියැංගේ භ්‍රමණ වෘත්තාන්තය | - | පරි: පොල්වත්තේ බුද්ධදත්ත හිමි |
| • බෞද්ධ ශිෂ්ටාචාරයේ මූලධර්ම හා වංශකථා | - | චන්දිම විජේබණ්ඩාර<br>එච්.එම්. මොරටුවගම |
| • බෞද්ධ ඉතිහාසය හා සංස්කෘතිය | - | බෞද්ධ ධර්මාචාර්ය විභාගය |
| • පුරාණ ඉන්දියාවේ බෞද්ධ විශ්වවිද්‍යාල | - | කේ.එච්.එම්. සුමතිපාල |

**නිපුණතාව 8.0** : ශ්‍රී ලංකාවේ ආගමික, දේශපාලන හා සමාජීය සංවර්ධනය උදෙසා බෞද්ධ ශිෂ්ටාචාරය පදනම් වූ ආකාරය විමර්ශනය කරමින් ඊට අනුගත වෙයි.

**නිපුණතා මට්ටම 8.1** : ප්‍රාග් මහින්ද යුගයේ ශ්‍රී ලංකාවේ පැවති ඇදහිලි හා විශ්වාස මහින්දගමනයෙන් පසු බුදු සමයට අනුව හැඩගැසුණු ආකාරය පැහැදිලි කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 20 යි.

**ඉගෙනුම් පල:**

- ප්‍රාග් මහින්ද යුගයේ පැවති ආගමික ඇදහිලි හා විශ්වාසයන් බුදු සමයට අනුව හැඩගැසුණු ආකාරය අවබෝධ කොට ගනියි.
- බෞද්ධාගමික පිළිවෙත් අගය කරයි.
- බෞද්ධාගමික පිළිවෙත් විෂයයෙහි කැපවී කටයුතු කරයි.
- බෞද්ධාගමික පිළිවෙත්වල අගය පෙන්වා දෙයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

ප්‍රාග් මහින්ද යුගයේ ලංකාවේ පැවති ආගමික විශ්වාස හා ඇදහිලි, පුද සිරිත් පිළිබඳ හඳුන්වා දෙමින් බුදු දහමේ සම්ප්‍රාප්තියෙන් පසු ඒවා අර්ථාන්විත ව යොදා ගනිමින් බෞද්ධාගමික වත්පිළිවෙත් හා සාරධර්ම සඳහා යොමු වූ අයුරු මූලාශ්‍රය අනුසාරයෙන් පැහැදිලි කිරීමක් මෙයින් අපේක්ෂිත ය.

**විෂය අන්තර්ගතය :**

**ප්‍රාග් මහින්ද යුගයේ ශ්‍රී ලංකාවේ පැවති ඇදහිලි හා විශ්වාස**

- මහින්දාගමනයට පෙර ශ්‍රී ලංකාවේ ආගමික විශ්වාස හා ඇදහිලි පැවති බව මහාවංසයේ සඳහන් ව ඇති බව
- යකුන් ඇදහීම, වෘක්ෂ ඇදහීම, දේවතාවුන් ඇදහීම, මළවුන් ඇදහීම, නාගයන් ඇදහීම, තාරකා වන්දනය හා බ්‍රාහ්මණ, ජෛන, පරිබ්‍රාජක, ශිව ආදි ආගම් ඇදහිලි පැවති බව.
- කාලවේල, චිත්තරාජ, මහේජ, ජුතින්ධර, වෛශ්‍රවණ, කාලසෝදර, පශ්චිම රාජිනී, වළවාමුඛී යන යක්ෂ- යක්ෂණියන් ඇදහූ බව
- පණ්ඩුකාභය රජු කාලවේල යක්ෂයා උදෙසා නුවරින් නැගෙනහිර දිශාවේ දෙවොලක් ද චිත්තරාජ යක්ෂයා උදෙසා අභය වැවේ යටි කොනේ දෙවොලක් ද වළවාමුඛී යක්ෂණියට රජ ගෙදරයන ඇතුළත ම දෙවොලක් ද කරවූ බව
- යක්ෂ - යක්ෂණියන් උදෙසා අවුරුද්දක් පාසා පණ්ඩුකාභය රජ බලිබිලි දුන් බව
- වෛශ්‍රවණ දෙවියා නුග ගසටත්, ව්‍යාධ දෙවියා තල් ගසටත් අරක් ගෙන සිටිතැයි විශ්වාස කළ බව

- බුදු රජාණන් වහන්සේගේ ප්‍රථම ලංකා ගමනේ දී කේශධාතු ලබා ගත්තේ යැයි සැලකෙන සුමන දෙවියන් ද ලෝකුරුවන්ට අධිපති සේ සැලකෙන කම්මාර දෙවියන් ද දඩයම්කරුවන්ගේ අධිපති සේ සැලකෙන ව්‍යාධ දෙවියන් ද අනුරාධපුරයට පමණක් අධිපති යැයි සැලකෙන පුරදේව දෙවියන් ද සිරිලක් දිවයිනට අධිපති යැයි සැලකෙන උපුල්වන් දෙවියන් ද ගෞරවාදරයට ලක් වූ දෙවිවරුන් බව

- මෙලොව දී යම් පවුලකට, කුලයකට, හිතවත් ව සිටිය අය මියගිය පසු යක්ෂ ආත්මවල ඉපදී පෙර ආත්මයේ නෑදෑ හිතමිතුරන් රැකබලා ගන්නේ යැයි විශ්වාසයෙන් මළවුන් ඇදහීම සිදු කළ බව.
- ජීවතුන් අතර වෙසෙද්දී පණ්ඩුකාභය රජ පවුලට අමූල්‍ය සේවයක් කළ චිත්තරාජ, කාලවේල යන හිතෛෂී සේවකයන් දෙදෙනා මළ පසු ඔවුන්ට භූතාත්ම ලෙස සලකා පූජා පැවැත්වූ බව
- මළවුන් ඇදහීම එකල සමාජයෙහි පැවති ජනප්‍රිය ඇදහිල්ලක් වූ බැවින් මිහිඳු මහරහතන් වහන්සේ ලක්දිවට වැඩ දෙවන දිනයේ දී පේතවත්ථුව හා විමානවත්ථුව තේමා කර ගනිමින් රජගෙදර කාන්තාවන්ට ධර්මය දේශනා කළ බව.
- බුද්ධ චරිතය හා සම්බන්ධ චූලෝදර, මහෝදර හා මණිඅක්ඛික නා රජවරුන් පිළිබඳ සඳහන් වීමෙන් නාග වන්දනය පැවති බව.
- උපතිස්ස, පණ්ඩුල, චන්ද්‍ර ආදි බ්‍රාහ්මණ පුරාවෘත්තයන්ගෙන් අදහස් වන්නේ එකල බ්‍රාහ්මණ ආගම තිබිණැයි විශ්වාස කළ බව
- පණ්ඩුකාභය රජු විසින් සොත්ථිසාලා ගෘහය කරවීමෙන් ඉහත කරුණ තව දුරටත් තහවුරු වන බව
- පණ්ඩුකාභය රජු විසින් ජෝතිය, ගිරි හා කුම්භණ්ඩ යන නිගණ්ඨයන් සඳහා වාසස්ථාන කරවීමෙන් එකල ජෛන ආගම සඳහා වාසස්ථාන පැවතිණැයි හෙළිවන බව.
- පණ්ඩුකාභය රජු විසින් ශිවිකා ශාලාවක් කරවීමෙන් ද මුටසිව වැනි රාජ නාම භාවිතයෙන් ද ශිව ආගම පැවතිණැයි හෙළි වන බව
- මක්ඛලී ගෝසාලගේ අනුගාමිකයන් සේ සැලකෙන ආජීවකයන්ට ද සත්‍ය ගවේෂක තාපස පිරිසක් වූ පරිබ්‍රාජකයන්ට ද පණ්ඩුකාභය රජු ආරාම ඉදි කරදීමෙන් එම ආගමික කොටස් ද ලක්දිව එකල සිටි බව
- ඓතිහාසික මූලාශ්‍රයයන්ට අනුව ප්‍රාග් මහින්ද යුගයේ ලංකාවේ බෞද්ධයන් ද සිටි බව

**එම ඇදහිලි හා විශ්වාස බුදුසමයට අනුව හැඩ ගැසුණු ආකාරය ආකාරය**

- වෘක්ෂ වන්දනාව බෝධි වන්දනාවට පරිවර්තනය වූ බව
- මළවුන් පිදීම මළවුන් සඳහා පින් දීමට පරිවර්තනය වූ බව
- දෙවියන්ට බලිබිලි පූජා කිරීම වෙනුවට දෙවියන්ට පින් දීම ආරම්භ වූ බව
- ස්තූපය, ප්‍රතිමාව ආදි බෞද්ධ ස්මාරක ආරම්භ වී ඒ සඳහා වන්දනයට යොමු වූ බව

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණ මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත. පහත සඳහන් ඇගයීම් ද යොදා ගත හැකි ය.

1. ප්‍රාග් මහින්ද ලංකාවේ පැවති ආගමික ඇදහිලි හා විශ්වාස ගවේෂණයේ දී පදනම් කරගත හැකි මූලාශ්‍රය නාමාවලියක් සකසන්න.
2. පැරණි ලක්දිව බ්‍රාහ්මණ බලය පැතිර පැවැති අයුරු යුග වකවනු සහිත ව කෙටි සටහනකින් දක්වන්න.
3. වන්දනයට ලක් වූ ඇතැම් යක්ෂයන් පසුව දෙවියන් ලෙස පුද- පූජාවට ලක් වූ බවට නිදසුන් දෙකක් දක්වන්න.
4. පණ්ඩුකාභය රජතුමා එකල පැවැති ආගම් හා ඇදහිලි කෙරෙහි දැක්වූ අනුග්‍රහය විමසීමට ලක් කරන්න.
5. මහින්දාගමනයට පෙරාතු ව මෙරට බුදුසමය පවතින්නට ඇතැයි උපකල්පනය කිරීමට අදාළ සාධක පෙළගස්වන්න.
6. ප්‍රාග් මහින්ද ලංකාවේ පැවති ආගමික සංකල්ප බුදු සමය නිසා අර්ථසම්පන්න ලෙස වෙනස් වූ ආකාරය පැහැදිලි කරමින් පවත්වනු ලබන කතාවක පිටපත පිළියෙළ කරන්න.

**පරිශීලනයට :**

- මහාවංශය (සිංහල) - බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය
- ලක්දිව බුදුසමයේ ඉතිහාසය - වල්පොල රාහුල හිමි
- බෞද්ධ ශිෂ්ටාචාරයේ ඉතිහාසය - චන්දිම විජේබණ්ඩාර, එච්.එම්. මොරටුවගම
- පැරණි ලක්දිව බෞද්ධ ඉතිහාසය - ඊ. ඩබ්. අදිකාරම්
- ශ්‍රී ලංකාවේ සංස්කෘතික උරුමය - එච්.එම්. මොරටුවගම
- පුරාතන ලංකාවේ සමාජ ඉතිහාසය - ආචාර්ය හේම එල්ලාවල
- දහම් අමා සඟරාව - ගන්තුනේ අස්සජි හිමි
- අනුරාධපුර යුගය - අමරදාස ලියනගමගේ, රණවීර ගුණවර්ධන
- බෞද්ධ ශිෂ්ටාචාරය මූලධර්ම හා වංශකථාව - චන්දිම විජේබණ්ඩාර, එච්.එම්. මොරටුවගම
- අනුරාධපුර සංස්කෘතිය - ඒ.වී. සුරවීර
- අපේ සංස්කෘතිය - බද්දේගම විමලවංශ හිමි

**නිපුණතාව 8.0 :** ශ්‍රී ලංකාවේ ආගමික, දේශපාලන හා සමාජීය සංවර්ධනය උදෙසා බෞද්ධ ශිෂ්ටාචාරය පදනම් වූ ආකාරය විමර්ශනය කරමින් ඊට අනුගත වෙයි.

**නිපුණතා මට්ටම 8.2 :** රාජ්‍ය පාලනයේ දී ශ්‍රී ලාංකේය රජවරුන් බුදු සමයෙන් ලද ආභාසය හා ඔවුන් සිදු කළ ශාසනික සේවාව හැඳින ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 20 යි.

**ඉගෙනුම් පල :**

- ශ්‍රී ලාංකේය රාජ්‍ය පාලනය විෂයයෙහි බෞද්ධ ආභාසය හා ඉපැරණි රාජ්‍ය පාලකයන්ගේ ශාසනික මෙහෙය විස්තර කරයි.
- ශ්‍රී ලාංකේය රජවරුන් බුදුසමයේ චිරස්ථිතිය හා සංවර්ධනය පිණිස ක්‍රියා කළ බව පිළිගනියි.
- බුදු සසුනේ චිරස්ථිතියට හා සංවර්ධනයට දයක වෙයි.
- ශ්‍රී ලාංකේය දේශපාලන අනන්‍යතාව ප්‍රදර්ශනය කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

ශ්‍රී ලාංකේය රාෂ්ට්‍ර පාලනය, බුදුසමයට අනුව හැඩගැසුණු අයුරු හඳුන්වා දෙමින් දේවානම්පියතිස්ස, දුටුගැමුණු, වළගම්බා, මහසෙන් යන රජවරුන් ආගමික, දේශපාලන, අංශ කෙරෙහි තම ජීවිතය කැප කළ ආකාරය පිළිබඳ දැනුම්වත් කිරීමක් මෙමඟින් අපේක්ෂිත ය.

**විෂය අන්තර්ගතය :**

**රාජ්‍ය පාලනය කෙරෙහි බෞද්ධ ආභාසය**

- බෞද්ධ දේශපාලන චින්තනය අනුව රජය ධර්ම රාජ්‍යයක් වන අතර රජතුමා ධර්මාධිපතියකු වන බව
- රජ බෞද්ධයකු පමණක් නොව බෝධි සත්වයෙකු ද විය යුතු බව
- රජු ශාසනයේ ආරක්ෂකයා මෙන් ම ලෞකික නායකයා වශයෙන් ද සලකන ලද බව
- පංචශීලය, දශරාජ ධර්මය, සතර සංග්‍රහ වස්තුව, සප්ත අපරිහානීය ධර්ම, සතර අගතියෙන් වෙන් වීම ආදිය රජුගේ ධර්ම චර්යා විය යුතු බව
- දේවානම්පියතිස්ස රජු මිහිඳු මාහිමියන්ගෙන් ද දුටුගැමුණු රජු ගෝධගත්තතිස්ස හිමියන්ගෙන් ද වළගම්බා රජු කුපික්කල තිස්ස හිමියන්ගෙන් ද ආදි වශයෙන් රජවරුන් භික්ෂූන් වහන්සේලාගෙන් අනුශාසනා ලබාගෙන ක්‍රියා කළ බව.

**දේවානම්පියතිස්ස, දුටුගැමුණු, වළගම්බා, මහසෙන් යන රජවරුන්ගේ ශාසනික සේවාව**

- දේවානම්පියතිස්ස රජතුමා, මිහිඳු මහරහතන් වහන්සේ පිළිගෙන පළමුවෙන් ම බුදුදහම වැලඳගත් ලක් රජතුමා වූ බව
- මිහිඳු මහරහතන් වහන්සේ දක ගැනීමට රාජඅංගණයට පැමිණි විශාල ජනකායකට ධර්ම ශ්‍රවණය සඳහා පහසුකම් සැලසූ බව
- මහා විහාර සීමා පිහිටුවා මහා විහාරය ඉදි කර බුදු සසුනට පිළිගැන්වූ බව

- අනුලා දේවිය පැවිදිවීමට කැමැත්ත දැක්වූ නිසා මිහිඳු මාහිමියන්ගේ අනුශාසකත්වය යටතේ සංඝමිත්තා මහරහත් මෙහෙණිය ශ්‍රී මහා බෝධි ශාඛාව වැඩමවාගෙන ඒමට අරිට්ඨ කුමරු ප්‍රධාන පිරිස යැවූ බව
- විනය සංගායනාවක් පවත්වා ශාසන චිරස්ථිතියට දායක වූ බව
- චේතියගිරියේ අටසැටලෙන ඉදි කර වස් විසීමට පහසුකම් සැලසූ බව
- බුදු රජාණන් වහන්සේගේ දකුණු අකු ධාතූන් වහන්සේ තැන්පත් කර ථූපාරාම ස්තූපය ඉදි කළ බව
- ඉසුරුමුණි විහාරය, නාගදීපයේ ජම්බුකෝල විහාරය, තිස්සමහා විහාරය, ප්‍රාචීනාරාමය, භික්ෂුණීන් සඳහා හත්ථාළ්හක මෙහෙණවර (අශෝකාරාමය) ආදි වෙහෙර-විහාර කරවූ බව
- දුටුගැමුණු රජු, බුදු දහම කෙරෙහි අධික ප්‍රසාදයෙන් හා ගෞරවාදරයෙන් ක්‍රියා කළ බව
- පිය රජු ඉදිරියේ භික්ෂූන්ට පිටු නොපාන බවට ප්‍රතිඥා දුන් බව
- ''මගේ මේ ව්‍යායාමය හුදෙක් රජ සැප පිණිස නොව සම්බුදු සසුනේ චිරස්ථිතිය පිණිස ය'' යනුවෙන් කළ ප්‍රකාශය අනුව බුදු සසුනේ චිරස්ථිතිය මුළු හදවතින් ම ප්‍රාර්ථනා කරමින් ඒ අනුව ක්‍රියා කළ බව
- මහාථූපය ඇතුළු වෙනත් ස්තූප, සංඝාරාම, ලෝහපාසාද උපෝසථාගාරය ආදිය කිරීමෙන් සම්බුදු සසුන කෙරෙහි කැප වීමෙන් ක්‍රියා කළ බව
- ආහාරපාන ගැනීමට පළමු ව, භික්ෂූන් වහන්සේලාට දන් දීමේ සිරිත නොකඩවා පවත්වාගෙන ආ බව
- කඨින පූජාව, අරියවංස උත්සවය, වෙසක් උත්සවය ආදිය පැවැත්වීමෙන් බෞද්ධ සංස්කෘතිය පෝෂණය කළ බව
- වළගම්බා රජතුමා, තමා පත් ව සිටි දුෂ්කර අවස්ථාවල දී උදවු උපකාර කළ මහාවිහාරවාසී කුපික්කල මහාතිස්ස හිමියන්ට අභයගිරි විහාරය කරවා පූජා කොට එහි අභිවෘද්ධියට ක්‍රියා කළ බව
- දිවයිනේ විවිධ ප්‍රදේශවල විහාරාරාම ඉදි කිරීමෙන් බෞද්ධ සංස්කෘතියේ සංවර්ධනයට දායක වූ බව
- මහසෙන් රජතුමා අනුරාධපුරයේ ජේතවන විහාරය ඉදි කොට භික්ෂූන් වහන්සේලාට සඟසතු කොට පූජා කළ බව
- භික්ෂූන් වහන්සේලාට වැඩ වාසය කිරීමට දක්ඛිණගිරි විහාරය ඉදි කරවා පූජා කළ බව

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණ මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත. පහත සඳහන් ඇගයීම් ද යොදා ගත හැකි ය.

1. ශාසන ප්‍රතිෂ්ඨාපනය විෂයයෙහි දේවානම්පියතිස්ස රජතුමාගෙන් ලැබුණු අනුග්‍රහය සාකච්ඡා මණ්ඩලයක් මඟින් අගයන්න.
2. ශාසන උන්නතිය කෙරෙහි දුටුගැමුණු රජතුමා ගත් ක්‍රියාමාර්ග විමසීමට ලක් කරන්න.
3. ''වළගම්බා රාජ්‍යය සමය ශාසන ඉතිහාසයේ සන්ධිස්ථානයක් සටහන් කළ වකවනුවකි.'' පැහැදිලි කරන්න.
4. මහාවිහාරය සම්බන්ධ ව මහසෙන් රජතුමාගේ ක්‍රියාවලිය කෙසේ වී දැයි විමසන්න.
5. අනුරාධපුර යුගයේ රජය හා භික්ෂුව අතර පැවැති සබඳතාව නිදසුන් මඟින් පැහැදිලි කරන්න
6. දේවානම්පිය තිස්ස, දුටුගැමුණු, වළගම්බා, මහසෙන් රජවරුන් සම්බන්ධ ව බෞද්ධ ශිෂ්ටාචාරය පළමු ප්‍රශ්න පත්‍රයට අදාළ බහුවරණ ප්‍රශ්න අටක් සකස් කරන්න.

**පරිශීලනයට :**

- මහාවංසය (සිංහල) - බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය
- පැරණි ලක්දිව බෞද්ධ ඉතිහාසය - ඊ.ඩබ්. අදිකාරම්
- ලක්දිව බුදුසමයේ ඉතිහාසය - වල්පොල රාහුල හිමි
- බෞද්ධ ශිෂ්ටාචාරය මූලධර්ම හා වංශකථාව - චන්දිම විජේබණ්ඩාර, එච්.එම්. මොරටුවගම
- අනුරාධපුර යුගය - අමරදාස ලියනගමගේ, රණවීර ගුණවර්ධන

**නිපුණතාව** 8.0 : ශ්‍රී ලංකාවේ ආගමික දේශපාලනික හා සමාජීය සංවර්ධනය උදෙසා බෞද්ධ ශිෂ්ටාචාරය පදනම් වූ ආකාරය විමර්ශනය කරමින් ඊට අනුගත වෙයි.

**නිපුණතා මට්ටම** 8.3 : මහාවිහාරය හා අභයගිරිය කේන්ද්‍ර කර ගනිමින් බිහිවූ ආගමික, සමාජීය හා සංස්කෘතික ප්‍රවණතා හැඳින ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 20 යි.

**ඉගෙනුම් පල** :
- මහා විහාරය හා අභයගිරිය කේන්ද්‍ර කර ගනිමින් ලක්දිව ඇති වූ විවිධ ප්‍රවණතාවන් හඳුනා ගනියි.
- මහා විහාරය හා අභයගිරිය ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ බෞද්ධ මධ්‍යස්ථාන බව පිළිගනියි.
- ආගමික මූලස්ථානයන්හි කාර්යභාරයන් හා වගකීම් අවබෝධ කොටගෙන කටයුතු කරයි.
- ශ්‍රී ලාංකේය බෞද්ධ සංස්කෘතියේ අනන්‍යතාව සමාජගත කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**
මහා විහාරය හා අභයගිරිය ශ්‍රී ලංකාවේ බිහි වූ ප්‍රමුඛ බෞද්ධ මධ්‍යස්ථාන බව හඳුන්වා දෙමින්. එම මධ්‍යස්ථාන නිසා සමාජගත වූ ශ්‍රී ලාංකේය බෞද්ධ සංස්කෘතියට අනුව ලක්වැසියා ක්‍රියා කිරීමට යොමු වූ අයුරු පිළිබඳ දැනුම්වත් කිරීමක් මෙයින් අපේක්ෂිත ය.

**විෂය අන්තර්ගතය** :
**මහා විහාරය හා අභයගිරිය කේන්ද්‍ර කොටගෙන බිහි වූ ආගමික සමාජීය හා සංස්කෘතික ප්‍රවණතා**
**මහා විහාරය**
- මිහිඳු මාහිමියන් දෙවනපෑතිස් රජතුමා සමඟ නුවර වටා තැනින් තැන වඩිමින් මහාවිහාර සීමා නියම කළ බව හා මහාවිහාරය, ලංකාවේ පැරණිතම සංස්කෘතික මධ්‍යස්ථානය ලෙස ආරම්භ කළ බව.
- මහා විහාරයට අනුබද්ධ ව, කාලප්පාසාදය, පියගු පිරිවෙන, ගුත්තවංක පිරිවෙන ආදි ගොඩනැගිලි රජවරුන් විසින් තනවන ලද බව මහාවංසය, නිකාය සංග්‍රහය ආදි වංසකතාවල සඳහන් වන බව.
- ධාරණ ශක්තියෙන් මෙන් ම ප්‍රඥාවෙන් ද අගතැන්පත්, බුද්ධිමත් භික්ෂූන් වහන්සේලා මෙන් ම ධර්ම විනයධර භික්ෂූන් වහන්සේලා මහා විහාරයෙහි වැඩ වාසය කළ බව
- දෙවනපෑතිස් රාජ්‍ය සමයයෙන් පසු දුටුගැමුණු ආදි රජවරුන් මහා විහාරයේ සංවර්ධනය වෙනුවෙන් කැප වීමෙන් ක්‍රියා කළ බව
- විනය සංගායනාවක් පැවැත්වීම, අටුවා හෙළ බසින් තැබීම හා ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම ආදි ක්‍රියාකාරකම් මගින් ථෙරවාදී සම්ප්‍රදායය ආරක්ෂා කිරීමේ කේන්ද්‍රස්ථානය ලෙස කටයුතු කළ බව
- මූලායතන පිහිටුවා බෞද්ධ ආරාමික අධ්‍යාපනය ආරක්ෂා කළ බව හා පෝෂණය කළ බව

- පර්සියාව, ග්‍රීසිය, බුරුමය, චීනය වැනි රටවලින් ද, ඉන්දියාවේ විවිධ පෙදෙස්වලින් ද භික්ෂූන් වහන්සේලා පැමිණ සිප් සතර හැදෑරූ අන්තර්ජාතික ථෙරවාදී බෞද්ධ කේන්ද්‍රස්ථානය වූ බව
- එය ශ්‍රී ලාංකේය වංශකථාවල මෙන් ම ෆාහියන්ගේ වාර්තාවලින් සනාථ වන බව
- මහා විහාරයේ අනුදැනුමෙන් සංඝමිත්තා තෙරණිය වැඩම කරවීම හා ඒ සමඟ මූර්ති, චිත්‍ර, කැටයම්, රන්කරු, ගෘහ නිර්මාණය ආදි විවිධ ශිල්පීය නිපුණතාවන් ලැබූ දහඅට කුලයක කලා ශිල්පීන් පැමිණි බව හා නව බෞද්ධ සංස්කෘතියක් ශ්‍රී ලංකාවේ ඇති වූ බව

**අභයගිරිය**

- ක්‍රි.පූ. 89 දී දෙවන වරට වළගම්බා රජු රාජ්‍යත්වයට පත්වීමෙන් පසු ගොඩනැගූ ආරාමය බව
- අභයගිරි විහාරය ස්ථාපනය වීමෙන් පසු විවිධ ශාසනික ගැටලු උද්ගත වූ බව
- ගජබා රජතුමා (ක්‍රි.ව. 114-136) අභයගිරියේ ප්‍රයෝජනය සඳහා ගාමිණීතිස්ස ජලාශය තැනවීම ද, කනිට්ඨතිස්ස රජතුමා (ක්‍රි.ව.167-186) අභයගිරිවාසී මහානාග තෙරුන්ට රත්නප්‍රාසාද මන්දිරය ද සිරිමෙවන් රජතුමා අභයගිරි විහාරය විශාල කිරීම හා බෝධිඝරය පිහිටුවීම ද ආදි වශයෙන් විවිධ රජවරුන් අභයගිරි විහාරයේ වර්ධනය සඳහා රාජානුග්‍රහය දැක්වූ බව.
- විදේශීය උගතුන් පිළිගැනීම, මූළායතන මඟින් රටපුරා අධ්‍යාපනය ව්‍යාප්ත කළ බව, නව දාර්ශනික සංකල්ප පිළිගැනීම ආදියෙන් නව ගමන් මඟකට යොමු වූ බව
- අභයගිරිය අන්තර්ජාතික බෞද්ධ මධ්‍යස්ථානයක් වශයෙන් ප්‍රකට ව පැවති බව ෆාහියන් වාර්තාවෙන් තහවුරු වන බව
- විවිධ පූජා විධි, පෙරහැර පිරිත් පින්කම් ආදිය කෙරෙහි අභයගිරිය මූලිකත්වයක් ගත් බව

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණ මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත. පහත සඳහන් ඇගයීම් ද යොදා ගත හැකි ය.

1. මහා විහාරය යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද යි කෙටියෙන් පැහැදිලි කරන්න.
2. මහා විහාරයට අනුබද්ධ ව අනුරාධපුර යුගයේ ලක්දිව පිහිටි විහාරාරාම පහක් නම් කරන්න.
3. මහා විහාරීය භික්ෂූන් වහන්සේලා ථෙරවාදී බුදු සසුන ආරක්ෂා කිරීමට ගත් ක්‍රියාමාර්ග වෙන් වෙන් ව දක්වන්න.
4. අභයගිරි විහාරය ගොඩනැඟීමෙන් අනතුරු ව ශාසනික වශයෙන් ඇති වූ අර්බුදකාරී තත්ත්වය සාකච්ඡා කරන්න.
5. ජනතා ආකර්ෂණය ලබා ගැනීම සඳහා අභයගිරිය අනුගමනය කළ ක්‍රියාමාර්ග ලැයිස්තුගත කරන්න.
6. මහාවිහාරය හා අභයගිරිය ජගත් කීර්තියට පත් ව තිබූ බවට නිදසුන් සපයන්න.

**පරිශීලනයට :**

- මහාවංසය (සිංහල) - බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය
- ලක්දිව බුදුසමයේ ඉතිහාසය - වල්පොල රාහුල හිමි (316 පිටුව)
- පැරණි ලක්දිව බෞද්ධ ඉතිහාසය (165 පිටුව) - ආචාර්ය ඊ.ඩබ්ලිව්. අදිකාරම්
- බෞද්ධ ධර්මාචාර්ය විභාගය - එච්. එම්. මොරටුවගම
- බෞද්ධ ඉතිහාසය හා සංස්කෘතිය - එච්. එම්. මොරටුවගම

**නිපුණතාව 8.0** : ශ්‍රී ලංකාවේ ආගමික දේශපාලනික හා සමාජීය සංවර්ධනය උදෙසා බෞද්ධ ශිෂ්ටාචාරය පදනම් වූ ආකාරය විමර්ශනය කරමින් ඊට අනුගත වෙයි.

**නිපුණතා මට්ටම 8.4** : බුදු සමයෙන් හැඩගැසුණු සිරිත් විරිත් හා සාරධර්ම ශ්‍රී ලාංකේය සමාජය තුළ තහවුරු වූ ආකාරය විමර්ශනයට ලක් කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 20 යි.

**ඉගෙනුම් පල** :

- බෞද්ධ සාරධර්මවලින් පෝෂණය වූ ශ්‍රී ලංකාවේ සිරිත් විරිත් අධ්‍යයනය කරයි.
- බෞද්ධ සාරධර්ම සාර්ථක ජීවිතයකට පදනම බව සැකහැර තහවුරු කර ගනියි.
- බෞද්ධ සිරිත් - විරිත්වලින් හා සාරධර්මවලින් පිරිපුන් සාර්ථක දිවිපෙවෙතක් ගත කරයි.
- යහපත් සිරිත් විරිත් හා සාරධර්ම පිරි සමාජයක් බිහි කිරීමට පුරෝගාමී වෙයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

බුදුදහම පැමිණීමෙන් පසු ශ්‍රී ලාංකිකයන්ගේ පෞද්ගලික ජීවිතය හා සමාජ ධර්ම බෞද්ධ සාරධර්මවලට අනුව හැඩගැසී වර්ධනය වූ ආකාරය හඳුන්වාදෙමින් ඔවුන් ආචාරශීලී ධාර්මික යුතුකම් හා වගකීම් ඉටු කරන පිරිසක් බව දැනුම්වත් කිරීම මෙමගින් අපේක්ෂිත ය.

**විෂය අන්තර්ගතය** :

**පුද්ගලයාගේ උපතේ සිට මරණය තෙක් ජීවිතයේ වැදගත් අවස්ථා සමඟ බැඳුණු බෞද්ධ සිරිත් විරිත්**

- කළ යුතු දේ කරමින් යහපත් හැසිරීම්වල නිරත ව ගුණධර්ම පිරීම, ''සිරිත්'' වන බව හා වැරදි හැසිරීම්වලින් බැහැර ව නොකළ යුතු දේ නොකිරිම විරිත් වන බව.
- සතුන්ට කරුණා මෛත්‍රිය දැක්වීම, අන් සතු දේ ගැනීමෙන් වැළකී අන් සතු දේ ආරක්ෂා කිරීම, කාම මිථ්‍යාචාරයෙන් වැළකී ශිෂ්ට සම්මත අඹුසැමි සබඳතා පවත්වාගෙන යෑම
- ප්‍රාණඝාතයෙන් වැළකී සතුන්ට කරුණාව මෛත්‍රිය දැක්වීම, අදත්තාදානයෙන් වැළකී අන්සතු දේ ආරක්ෂා කිරීම, කාමමිථ්‍යාචාරයෙන් වැළකී ශිෂ්ට සම්මත අඹුසැමි සබඳතා පවත්වාගෙන යාම, මුසාවාදයෙන් වැළකී සත්‍ය චචන කථා කිරීම, මද්‍යසාර භාවිතයෙන් වැළකී සාමකාමී සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් ගත කිරීමට ශ්‍රී ලාංකිකයා යොමු වී ඇති බව
- දරු සම්පත් අපේක්ෂා කරන කාන්තාව තෙරුවන් වැඳ දෙවියන්ට පින් දී තමාට පින්වත් දරුවෝ ලැබෙත්වායි ප්‍රාර්ථනා කිරීමේ චිර චාරිත්‍රයක් ඇති බව
- නැකැත් තරු විචාරා සුදුසු කල් බලා පිළිසිඳ ගැනීම අපේක්ෂා කළ යුතු බව
- නිසි කල පැමිණි පසු සෙස්සන්ගේ අනුග්‍රහය ඇති ව ගැබ්පෙළහැර දැක්වීම හෙවත් නිසි රක්ෂාවරණය සැලසූ බව
- බුදු රජාණන් වහන්සේ වදාළ පරිදි අංගුලිමාල පිරිත දේශනා කරවාගෙන ආශීර්වාද ලබාගත් බව.
- උපන් දරුවා ප්‍රථමයෙන් දොරට වැඩීමේ චාරිත්‍රය හෙවත් විහාරස්ථානයට කැඳවාගෙන ගොස් බෝ සෙවණේ තබා පිරිත් සජ්ඣායනා කරවා ගන්නා බව

- නම් තැබීමේ දී දේශීය ඌරුවක් ඇති බෞද්ධ නමක් තැබීමට අදාළ නැකත් චරිත්‍රාදිය තෝරගත් බව
- නිසි ලට දරුවාගේ ආරක්ෂාව පිණිස පංචායුධය, ධර්ම චක්‍රය, බෝ පත්‍රය ආදි ආකෘති කර පැලඳවූ බව
- සුදුසු වයස එළඹි විට බෞද්ධ පුද සිරිත් පවත්වා දරුවාට ඉඳුල් කටගෑම සිදු කළ යුතු බව.
- නිසි කල පැමිණි පසු විහාරස්ථානයේ ස්වාමීන් වහන්සේ හෝ වෙනත් පිළිගත් වැඩිහිටියකු හෝ ලවා බෞද්ධ චාරිත්‍රවලට අනුව අකුරු කියවීම කරන බව
- පවින් වැළකීම හා යහපතෙහි යෙදවීම ආදී බෞද්ධ සිරිත්වලට දරුවා යොමු කළ බව
- ආවාහ විවාහ කටයුතුවල දී ත්‍රිවිධ රත්නයේ ආශීර්වාදය ලබා ගන්නා බව
- ගෘහස්ථ ජීවිතයේ සියලු වැදගත් අවස්ථාවල දී ත්‍රිවිධ රත්නය මුල් කොටගෙන පුද සිරිත් පැවැත්වීම, දන් පැන් පූජා කිරීම, ධර්මයේ ආශීර්වාදය ලබා ගැනීම සිදු කරන බව
- අවමංගල්‍ය අවස්ථාවල දී බෞද්ධ චාරිත්‍ර ධර්මවලට අනුව භික්ෂූන් වහන්සේලා වැඩම කරවා මතකවස්ත්‍ර පූජා කිරීම, අනිත්‍ය ප්‍රතිසංයුක්ත ධර්ම ශ්‍රවණය කරවා පැන් වඩා පින් අනුමෝදන් කිරීම ආදි චාරිත්‍ර පවත්වන බව
- ප්‍රාප්ති, දානමය පින්කම් ලෙස සත්දින දානය තුන්මස් දානය හා වාර්ෂික දානය ආදිය වශයෙන් සන්ධිස්ථාන දිනවල පින්කම් පවත්වන බව

**ශාසන මාමකත්වය, දන් දීම, ආගන්තුක සත්කාරය, වැඩිහිටියන්ට සැලකීම, පරෝපකාරය, අවිහිංසාව, ගිලානෝපස්ථානය**

- ''මාගේ මේ ව්‍යායාමය කිසි කලෙකත් රජසැප පිණිස නොව සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය සඳහා ය'' ආදි වශයෙන් දුටුගැමුණු රජතුමා ශාසන මාමකත්වයෙන් ක්‍රියා කර ඇති බව.
- ලක්දිව රජවරුන් ඇතුළු ලක් වැසියන් භික්ෂූන් වහන්සේලාට සිවුපසයෙන් උපස්ථාන කිරීම, ආරාම ප්‍රතිසංස්කරණය කිරීම, කඨින චීවර පූජාව පැවැත්වීම, බෞද්ධ ආගමික උත්සව පැවැත්වීම ආදිය ශාසන මාමකත්වය නිසා සිදු කළ බව
- තමා සතු දේ පරිත්‍යාග කිරීම ''දානය'' වන බව හා ආමිසදානය, අභයදානය, ධර්මදානය පත්තිදාන ආදි වශයෙන් දානය විවිධ වන බව
- පූජා බුද්ධියෙන් හා අනුග්‍රහ බුද්ධියෙන් දන් දීම සිදු කරන ලද බව
- සියලු දානයන්ගෙන් ධර්ම දානය උතුම් බව
- ආගන්තුක සත්කාරය සිංහල බෞද්ධ සංස්කෘතියේ වැදගත් සිරිතක් වශයෙන් සිදු කරන ලද බව
- දුර බැහැර නෑදෑයන් හෝ හිතවතුන් හෝ ගෙදරට පැමිණන විට ගෙහිමියා හෝ ගෘහිණිය හෝ පෙරමගට ගොස් පිළිගැනීම සිදු කරන බව
- ආගන්තුක සත්කාරය සිදු කිරීමේ දී විවිධ ආචාර සමාචාර විධි පවත්වන බව
- සිංහල බෞද්ධ සිරිත්වලට අනුකුල ව ආගන්තුක සත්කාරය සිදූ කරන බව
- වැඩිහිටියන්ට සැලකීමේ දී හුනස්නෙන් නැගිටීම, ඇඳිලි බැඳ කතා කිරීම, අභිවාදනය ආදිය සිදු කරන බව.

- වැඩිහිටියන්ගේ අවවාද අනුශාසනා පිළිපැදීමට යොමුවන බව හා ඔවුන්ගේ කටයුතු ඉටුකරදීමට පෙලඹෙන බව
- පරෝපකාරය සඳහා යොමු වන්නන් සමාජයේ නිතර ප්‍රශංසාවට ලක් වන බව
- දුටුගැමුණු, විජයබාහු, පරාක්‍රමබාහු ආදි ප්‍රමුඛ පෙළේ රජවරුන් පවා ජීවිත පරිත්‍යාගයෙන් පරෝපකාරයේ යෙදුණු බව.
- මංමාවත් ඉදි කිරීම, ගිලන්හල් තැනීම, ආරෝග්‍යශාලා ඉදි කිරීම, ළිංපැන් පොකුණු තැනීම, දන්සැල් පැවැත්වීම, උයන්වතු වගාව, පාලම් හේ දඬු තැනීම, විශ්‍රාමශාලා තැනීම ආදිය පරෝපකාරිත්වයට අයත් වන සත්කාර්යයන් බව
- අත්තම් ක්‍රමය යටතේ ශ්‍රමය සාමූහික ව බෙදාගත් බව
- කුඩා සතකු වුව ද මැරීම බරපතළ වරදක් ලෙස සලකනවා පමණක් නොව, සතුන්ට හිරිහැර කිරීම, පීඩා කිරීම හා හිංසා කිරීම ද බරපතළ වරදක් ලෙස සලකමින් අවිහිංසා සහගතව ලක්වැසියන් හැසිරෙන බව.
- කෘෂිකර්මාන්තය සඳහා උපයෝගී කර ගන්නා මී හරකුන් වෙත පවා මහත් කරුණාවක් දක්වන බව
- ගිලනුන්ට උපස්ථාන කිරීම, බෞද්ධයකුගේ උසස් චාරිත්‍ර ධර්මයක් මෙන් ම එය උසස් සමාජ සේවයක් වන බව

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණ මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත. පහත සඳහන් ඇගයීම් ද යොදා ගත හැකි ය.

1. පුද්ගලයාගේ උපතේ සිට මරණය දක්වා වූ කාලය තුළ සමාජයේ වැදගත් අවස්ථාවන් හා බැඳුණු චාරිත්‍ර පිළිවෙළින් සටහන් කරන්න.
2. ලාංකේය පැරණි ජන සමාජය පරෝපකාරය විෂයයෙහි දක්වූ උද්යෝගය ප්‍රකට කරමින් කරන කතාවේ පිටපත සකස් කරන්න.
3. පන්තියේ සිසුන් කණ්ඩායම් කර ආගන්තුක සත්කාරය, වැඩිහිටියන්ට සැලකීම, ගිලානෝපස්ථානය යන ගුණාංග ක්‍රියාවට නැංවීමේ දී අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග පිළිබඳ ලේඛනයක් සකස් කරවන්න.
4. පැරණි ජන සමාජය පඤ්චසීල ශික්ෂණයෙන් යුතු ව ක්‍රියා කළ අයුරු ඇගැයීමට ලක් කරන්න.
5. දෙලොව පින් වැඩෙන සමාජ සත්කාරයන් ලේඛන ගත කරන්න.
6. ගම හා පන්සල අතර එදවස පැවැති බැඳීම ඇගැයීමට ලක් කරන්න.

**පරිශීලනයට :**

| | |
|---|---|
| අපේ සංස්කෘතිය | - බද්දේගම විමලවංශ හිමි |
| බෞද්ධ සංස්කෘතිය | - දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය |

| | | |
|---|---|---|
| **නිපුණතාව 9.0** | : | බුදු දහම පැතිර ගිය ආසියාතික රටවල ජන ජීවිතය බෞද්ධ සාරධර්මවලින් පෝෂණය වූ අයුරු ගවේෂණය කරමින් බෞද්ධ උරුමය රැක ගැනීමට දයක වෙයි |
| **නිපුණතා මට්ටම 9.1** | : | මියන්මාරයට (බුරුමයට) හා තායිලන්තයට (සියමට) බුදු දහම සම්ප්‍රාප්ත වීම හා එම රටවල ජන ජීවිතය බෞද්ධ සාරධර්මවලින් පෝෂණය වූ ආකාරය ගවේෂණය කරයි |
| **කාලච්ඡේද සංඛ්‍යාව** | : | 20 යි. |
| **ඉගෙනුම් පල** | : | |

- මියන්මාර හා තායිලන්ත සංස්කෘතිය බුදු සමයෙන් පෝෂණය වූ අයුරු ගවේෂණය කරයි.
- මියන්මාර හා තායිලන්ත බෞද්ධ සංස්කෘතියේ විශිෂ්ට ලක්ෂණ අගය කිරීමට පෙලඹෙයි.
- මියන්මාර හා තායිලන්ත බෞද්ධ සංස්කෘතිය ආදර්ශනය කරයි.
- අන්තර්ජාතික ව බෞද්ධ සංස්කෘතිය ව්‍යාප්ත කිරීමෙහි ලා දායක වෙයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

මියන්මාරය හා තායිලන්තය බෞද්ධ සංස්කෘතියේ විශිෂ්ට ලක්ෂණත් එම රටවල සංස්කෘතිය බුදු සමයෙන් පෝෂණය වූ ආකාරයත් හඳුන්වා දෙමින්, දෙරටෙහි ම වැසියා බෞද්ධ සංස්කෘතියට අනුගත ව හැඩ ගැසී ධර්මය ව්‍යාප්ත කිරීමෙහි ලා පුරෝගාමී ව ක්‍රියා කළ බව දැනුම්වත් කිරීමක් මෙමඟින් අපේක්ෂිත ය.

**විෂය අන්තර්ගතය :**

**මියන්මාරයට බුදු දහම හඳුන්වාදීම**

- අග්නිදිග ආසියාතික රටක් වන මියන්මාරය අතීතයේ දී බ්‍රහ්ම දේශය, මරම්ම දේශය වශයෙනුත් මෑතක් වන තුරු බුරුමය වශයෙනුත් හැඳින්වූ බව.
- මෙරටට බුදු දහම ලැබීම පිළිබඳ ව ජනප්‍රවාද හා ඓතිහාසික වශයෙන් දෙයාකාරයකින් තොරතුරු ලැබෙන බව
- බුරුම ජනතාව බුදු රදුන් වෙනුවෙන් සඳුන් දැවයෙන් ආරාමයක් ඉදි කර පූජා කළ බවත්, මොන් ජාතික තපස්සු භල්ලුක වෙළෙඳුන් බුදු රදුන්ගේ කේස ධාතු තැන්පත් කර සිංගුත්තර කඳු මුදුනෙහි ස්තූපයක් ඉදි කළ බවත් බුරුම රාජ වංශය ශාක්‍ය වාංශිකයන්ගෙන් පැවතෙන්නක් බවත් ජනප්‍රවාදයන්හි දැක්වෙන නිසා බුදු රදුන් ජීවමාන සමයෙහි ම බුරුම දේශයට බුදුසමය සම්ප්‍රාප්ත වන්නට ඇතැයි විශ්වාස කරන බව
- ඓතිහාසික මූලාශ්‍රය වලට අනුව අශෝක රජුගේ ධර්මප්‍රචාරක සේවයේ ප්‍රතිඵලයක් වශයෙන් සෝන හා උත්තර යන හිමිවරුන්ගේ මාර්ගයෙන් එරටට බුදුදහම ලැබී ඇති බව
- ක්‍රි.ව. 5 වන සියවසෙහි සිට බුරුමයේ ප්‍රෝම් (Prome) සහ හිමව්ෂා (Hmawza) ආදි නගරවලත් ක්‍රි.ව. 11 වන සියවසට පෙර පේගු (හංසවතී) හා ථෙටෝන් (සුධම්මවතී) රාජධානිවලත් බුදු දහම සමෘද්ධිමත් ව පැවති බව.

.

- බුරුමයට ස්ථිර වශයෙන් බුදු දහම ලැබී එය තහවුරු වුයේ ක්‍රි.ව. 11 වන සියවසේ බලයට පත් අනෞරථ හෙවත් අනුරුද්ධ රාජ වකවනුවේ සිට බව

**මියන්මාර සංස්කෘතිය බුදු සමයෙන් පෝෂණය වීම**

- නොදියුණු සිරිත් විරිත් හා ගස්, ගල් වැනි ස්වාභාවික වස්තු වන්දනයට යොමු ව සිටි බුරුම ජනතාව, එයින් මිදී නිදහස් චින්තන ශක්තියෙන් යුක්ත සමගි සම්පන්න පිරිසක් බවට පත්වූයේ බුරුමයට බුදුදහම ලැබීමෙන් පසුව බව
- කුලභේදය නොසලකන එක ම ථෙරවාදී රාජ්‍ය බවට විරුදාවලිය ලැබූ බව
- ආසියාවේ වෙනත් කිසි දු කාන්තාවකට නොමැති තරමේ නිදහසක් බුරුම කාන්තාවට හිමි වී ඇත්තේ ද බුදදහමේ ආලෝකය නොමඳ ව එම ජීවිතවලට ලැබුණු නිසා බව
- බුරුම ජනතාවගේ ජීවිතය හැඩගස්වන ප්‍රධාන බලවේගය බවට බුදුදහම පත් ව ඇති අයුරු නිදසුනක් වශයෙන් එරට සැම පිරිමියකු ම තාවකාලික ව පැවිද්ද ලබා ගැනීම සමාජයෙහි විශේෂ පිළිගැනීමකට යොමු ව තිබීමෙන් පිළිබිඹු වන බව.
- රාජ්‍ය ආගම බුද්ධාගම වූ අතර එය ආරක්ෂා කිරිමට රජය බැඳී සිටින බව
- අනුරුද්ධ රජතුමාගේ මැදිහත් වීමෙන් ත්‍රිපිටකය බුරුම බසට පරිවර්තනය කිරීම හා ආරක්ෂා කිරීම සිදු වූ අතර බලයට පත් වූ බොහෝ රජවරුන් විසින් එය පවත්වා ගෙන යාම නිසා බෞද්ධ ග්‍රන්ථ විශාල ප්‍රමාණයක් ආරක්ෂා වූ බව
- බුද්ධ ධර්මය පිළිබඳ ශාස්ත්‍රීය ප්‍රබන්ධයන් මඟින් බුරුම අධ්‍යාපනයට බෞද්ධ ආභාසය ඇති කිරීම හා මණ්ඩලේ නුවර ඒ සඳහා ප්‍රධාන මධ්‍යස්ථානය වශයෙන් තෝරාගත් බව
- දරුවන්ගේ මූලික අධ්‍යාපන මධ්‍යස්ථානය බවට එරට විහාරස්ථාන පත්ව ඇති අතර කියවීම, ලිවිම, ගණිතය ඇතුළු මූලික විෂයයන් පිළිබඳ අවබෝධයක් එහිදී ලබා දී ඇති බව
- බුරුමයේ කලාශිල්ප අතර දාගැබ්වලට විශේෂ තැනක් හිමි වන අතර පැගෝඩා නමින් මෙම ස්තූප හඳුන්වන බව
- බෞද්ධ උත්සව, පොහෝ දින ශීල සමාදාන කටයුතු, ඉතා උනන්දුවෙන් මෙරට සිදු කෙරෙන අතර බෞද්ධ ජන ජීවිතයේ සැම අංශයකට ම බෞද්ධ බලපෑම නොඅඩුව ලබාගෙන ඇති බව

**තායිලන්තයට බුදුදහම හඳුන්වාදීම**

- බටහිර ජාතීන්ගේ ආධිපත්‍යයට යටත් නොවූ ආසියාවේ එක ම රට වූ තායිලන්තය නිදහස් දේශය යන නමින් විරුදාවලියට පත් වන අතර එය අතීතයේ සියමය ලෙස ද හැඳින් වූ බව.
- තෙවන ධර්ම සංගායනාවෙන් පසුව නව රට සසුන් පිහිටුවීමේ දී ස්වර්ණ භූමියට වැඩම කළ සෝණ - උත්තර හිමිවරුන් විසින් තායිලන්තයට බුදුසමය හඳුන්වා දෙන ලදැයි එරට ජනතාවගේ පිළිගැනීමට ලක් ව ඇති බව
- යුග හතරක් ඔස්සේ තායිලන්තයේ බුදුදහම ව්‍යාප්ත වූ බව

- ක්‍රි.පූ. 329 දී නකොම් පටොම් නගරය ආශ්‍රිත ව ථෙරවාදී බුදුදහම ව්‍යාප්ත ව පැවති බව ඉතිහාසගත ව සඳහන් වන අතර මින් සියවස් කිහිපයකට පසු ව බැංකොක් නගරයට බටහිරින් පිහිටි පොංටන් හා පාපයෝම් යන ස්ථානයන්හි දී හමු වී බෞද්ධ පුරාවස්තු මඟින් පළමු යුගයට අදාළ තොරතුරු තහවුරු කෙරෙන බව
- දෙවන යුගයෙහි ආරම්භය ලෙස සැලකෙන ක්‍රි.ව. 700 දී පලම්භාන් රජුගේ අනුග්‍රහයෙන් මහායාන බුදුසමය ව්‍යාප්ත වූ අවධිය ලෙස සැලකෙන බව.
- ක්‍රි.ව. 11 වන සියවසෙහි බුරුමයෙහි පාලක අනෞරථ රජුගේ අනුග්‍රහයෙන් බුද්ධ ධර්මය ව්‍යාප්ත වීම තෙවන අවධිය ලෙස සැලකෙන බව
- ශ්‍රී සූර්යවංශ රාම මහා ධාර්මික අධිරාජතුමන් ක්‍රි.ව. 1361 දී සියම් භික්ෂු පිරිසක් ලංකාවට එවා මෙරට දී බුදුදහම මැනවින් ඉගෙන ගැනීමෙන් අනතුරු ව නැවත එරටට ගෙන්වා ගෙන බුදුදහමේ අභිවෘද්ධියක් ඇති කරලීමට කටයුතු කිරීම හතර වන අවධිය ලෙස සැලකෙන බව
- හියුං සියැංගේ වාර්තාවලට අනුව ක්‍රි.ව. 7 වන සියවසේ ද්වාරවතී රාජ්‍යයේ බුදුසමය සමෘද්ධිමත් ව පැවති බව
- මොන්කුත් රාජ්‍ය සමයේ සියම් නිකාය පමණක් පැවති අතර පසු ව මෙම නිකාය මහා නිකාය හා ධම්ම යුත්තික නිකාය වශයෙන් කොටස් දෙකකට වෙන් වූ බව

**තායි සංස්කෘතිය බුදු දහමින් පෝෂණය වීම**

- බුදුදහම නඩත්තු කිරීම, ආරක්ෂා කිරීම රාජ්‍ය යුතුකමක් ලෙස සැලකෙන අතර රජයේ ප්‍රධානයා බෞද්ධයකු විය යුතු බව.
- බෞද්ධ විහාරාරාම පාලනය කිරීම, රජයේ පාලනයට යටත් වන අතර විහාරස්ථානවල ආගමික කටයුතු සඳහා අවශ්‍ය සියලු වියදම් රජය විසින් දරන බව
- ක්‍රමවත් සංඝ සංවිධානයක් පවතින අතර එහි ප්‍රධානයා රජය විසින් පත් කරන ලද සංඝ රාජයන් වහන්සේ නමක් වන බව
- තායි පිරිමින් ටික කලකට හෝ පැවිදි වී සිටීම චිරාගත සම්ප්‍රදායයක් වන අතර පැවිදි වීම හා උපැවිදි වීම උත්වශ්‍රීයෙන් සිදුවන බව ද, එම තාවකාලික පැවිද්දේ දී හමුවන සහතිකය විවාහ වීමේ දී හා රැකියා ලැබීමේ දී විශේෂ සුදුසුකමක් සේ සලකන බව ද සඳහන් වන බව
- මනා ගිහිපැවිදි සම්බන්ධතාවක් පවතින අතර තායි භික්ෂූන් වහන්සේගේ ශිෂ්‍යයන් තුළ ආධ්‍යාත්මික අවශ්‍යතා සපුරාලීමට කටයුතු කරන අතර ම ලෞකික ජීවිත ගැටලුවලට ද විසඳුම් සැපයීම සිදු කරන බව
- තායි ජනතාව දෛනික ව ආගමික කටයුතුවල නිරත වීමට අවශ්‍ය පූජාසනයක් කාමරයක සකස් කරගෙන එම පූජා කටයුතුවල නිරත වන බව
- තායි රටේ ලොකු කුඩා සැම අයෙකුගේ ම ගෙලෙහි බුද්ධ රූපයක් පැළඳගෙන සිටීම සුලබ දසුනක් වන අතර එය සකස් කරනු ලබන්නේ භික්ෂූන් වහන්සේ විසින් බව
- තායි විහාරස්ථානවල පැවිදි පිරිස් මෙන් ම බහුල ව ළමයින් ද වාසය කරන බව
- වාර්ෂික ව පැවැත්වෙන උත්සව අතර වෙසක් උත්සවය හා කඨින පූජෝත්සවය ප්‍රමුඛ තැනක් ගන්නා බවත් කඨින චීවරය ගෙන යන පෙරහැර ජාතික ක්‍රීඩාවලින් සමන්විත වන බවත් තායි රජතුමා කිසියම් විහාරයක කඨින පිනකමට සහභාගි වීම අනිවාර්ය බවත් දැක්වෙන බව

- අධ්‍යාපනය කලා ශිල්ප හා සාහිත්‍යය ද බුදු දහමින් පෝෂණය වී සංස්කෘතිය පෝෂණය කරලීමට දායකත්වයක් ලබා දී ඇති බව

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණ මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත. පහත සඳහන් ඇගයීම් ද යොදා ගත හැකි ය.

1. මියන්මාරයට බුදුදහම ලැබුණු ආකාරය පිළිබඳ විස්තරයක් කරන්න.
2. අනෞරථ හෙවත් අනුරුද්ධ රජතුමාගේ ශාසනික සේවාව ඇගැයීමට ලක් කරන්න.
3. තායිලන්තයට බුදුදහම ලැබුණ ආකාරය විමසීමට ලක් කරන්න.
4. බෞද්ධ සංස්කෘතියේ බලපෑමෙන් මියන්මාරයේ හා තායිලන්තයේ ඇති වූ සුවිශේෂ සංස්කෘතික ලක්ෂණ වගුගත කරන්න.
5. තායි සංඝ සංවිධානයේ සැකැස්ම පෙළගස්වන්න.
6. මෙම රටවල් දෙක ඇසුරින් බහුවරණ ප්‍රශ්න පහක් සකස් කරන්න.

**පරිශීලනය :**

- තායිලන්තයේ බෞද්ධ සංස්කෘතිය - බෝයගම විමලසිරි හිමි
- බුරුම බෞද්ධ සංස්කෘතිය - වැලිමඩගම කුසලධම්ම හිමි
- සංක්ෂිප්තලෝහක බෞද්ධ සංස්කෘතිය- වැල්ලවත්තේ ආනන්ද හිමි, ටී. බී. කාන්ගහආරච්චි
- දෙදහස් පන්සිය වසරක බොදුසමය - වී.පී.බාපත් (පරිවර්තනය - පද්මා ගුණසේකර)
- බෞද්ධ ශිෂ්ටාචාරයේ ව්‍යාප්තිය - පූජ්‍ය උඩුගම සුමංගල හිමි, පූජ්‍ය යටියන විමලබුද්ධි හිමි

**නිපුණතාව 9.0** : බුදු දහම පැතිර ගිය ආසියාතික රටවල ජන ජීවිතය බෞද්ධ සාරධර්ම වලින් පෝෂණය වූ අයුරු ගවේෂණය කරමින් බෞද්ධ උරුමය රැක ගැනීමට දයක වෙයි

**නිපුණතාව 9.2** : චීනයට හා ජපානයට බුදු දහම සම්ප්‍රාප්ත වීම හා එම රටවල ජන ජීවිතය බෞද්ධ සාරධර්මවලින් පෝෂණය වූ ආකාරය ගවේෂණය කරයි

**කාලච්ඡේද සංඛ්‍යාව** : 24 යි.

**ඉගෙනුම් පල** :

- චීන හා ජපන් සංස්කෘතීන් බුදු සමයෙන් පෝෂණය වූ අයුරු ගවේෂණය කරයි.
- චීන හා ජපන් බෞද්ධ සංස්කෘතියෙහි විශිෂ්ට ලක්ෂණ අගය කිරීමට පෙලඹෙයි.
- චීන හා ජපන් බෞද්ධ සංස්කෘතිය ආදර්ශනය කරයි.
- අන්තර්ජාතික ව බෞද්ධ සංස්කෘතික හුවමාරුවකට දායක වෙයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

බුදුසමයෙන් චීන හා ජපන් සංස්කෘතීන් පෝෂණය වූ ආකාරය හඳුන්වා දෙමින් එම දෙරටෙහි ම වැසියා බෞද්ධ සංස්කෘතියේ විශිෂ්ට ලක්ෂණ අගයමින් ක්‍රියා කළ බවට දැනුම්වත් කිරීමක් මෙමඟින් අපේක්ෂිත ය.

**විෂය අන්තර්ගතය** :

**චීනයට බුද්දහම හඳුන්වාදීම සහ එරට සංස්කෘතිය බුදු සමයෙන් පෝෂණය වූ ආකාරය**

- කොන්ෆියුසියස් ධර්මයත් තාඕ ධර්මයත් බුද්ධ ධර්මයත් දිගු කාලයක සිට චීනයේ පවතින නිසා ආගම් තුනේ රට යන විශේෂ නාමයකින් චීන දේශය හඳුන්වන බව
- චීනයට බුදු දහම හඳුන්වාදීම පිළිබඳ ව විවිධ අදහස් පවතින අතර වැඩි දෙනෙකුගේ මතය පරිදි හැන්මින්දි (HanMing Di) අධිරාජයාගේ යුගයේ, භාරත ධර්ම දූතයන් වූ කාශ්‍යප මාතංග සහ ධර්ම රක්ෂ යන හිමිවරුන් විසින් බුදු දහම හඳුන්වා දෙනු ලැබ ඇති බව
- අශෝක රජු දවස භාරතයෙන් භික්ෂූන් වහන්සේලා දහඅට නමක් දහම් පොත් රැගෙන චීනයට පැමිණි බවත් එකල පාලකයන් ඒ හිමිවරුන් සිර කර තැබූ බවත් හදිසියේ ම පැමිණි රන්වන් පැහැගත් පුරුෂයකු ඔවුන් මුදවාගත් බවත් චීන ජනකතාවක දැක්වෙන බව
- ඉන්දියාවෙන් වැඩම කළ ධර්මාකර භික්ෂූන් වහන්සේ විසින් විනය කටයුතු සඳහා ධවල අශ්වාරාමයේ සීමාමාලකයක් පිහිටුවා ක්‍රි.ව. 250 දී භික්ෂු ශාසනය ආරම්භ කළ බව.
- ශ්‍රී ලංකාවේ දේවසාර භික්ෂුණිය ප්‍රධාන භික්ෂුණීන් වහන්සේලා විසින් සංඝවර්මන් නම් තෙරුන්ගේ සහය ඇති ව ක්‍රි.ව. 433 දී භික්ෂුණී ශාසනය ආරම්භ කළ බව
- මහා ප්‍රඥා පාරමිතා ශාස්ත්‍රය, ශත ශාස්ත්‍රය වැනි ඉතා වැදගත් ධර්ම ග්‍රන්ථ මාධ්‍යමික සම්ප්‍රදායයේ ගුරුවරයා ලෙස සැලකෙන කුමාරජීව හිමියන් විසින් චීන බසට පරිවර්තනය කර බුද්දහම හඳුන්වා දීමට ක්‍රියා කළ බව

- කොන්පියුසියස් දහම හා තාඕ දහම සමග බුදුසමය සංසන්දනය කරමින් බුදුදහමේ ඇති ශ්‍රේෂ්ඨත්වය පිළිබඳ ව ''හැං'' යුගයේ අවසාන භාගයේ දී මෝ - ත්සි විසින් ග්‍රන්ථයක් සම්පාදනය කරන ලද බව
- අක්ෂ-කාඕ, සංඝවර්මන් සහ සංඝපාල යන ප්‍රසිද්ධ පරිවර්තක භික්ෂූන් වහන්සේලා දහම් පොත් චීන බසට පරිවර්තනය කරමින් බුදුසමය හඳුන්වාදීමට ක්‍රියා කළ බව
- මධ්‍ය ආසියාවේ චුපාලන් නැමති භික්ෂුව චීනයට වැඩම කර කාශ්‍යප මාතංග හිමියන් සමඟ එක් ව ලෝයාංහි පිහිටි ධවල අශ්වාරාමයේ වැඩ වාසය කරමින් බෞද්ධ පොත්පත් චීන බසට පරිවර්තනය කළ බව
- ෆාහියන් භික්ෂුව ඉන්දියාවේ හා ශ්‍රී ලංකාවේ සංචාරය කරමින් රැස් කරගත් ධර්ම විනය ග්‍රන්ථත් හියුං සියැං නාලන්දා විශ්වවිද්‍යාලයයේ ශිල්ප හදාරා රැස් කරගත් ග්‍රන්ථත් චීනයට ගෙන ගොස් පරිවර්තන කාර්යයෙහි නියැළුණු බව
- ක්‍රි,ව. 6 වන සියවසේ දී භාරතයේ සිට බෝධි ධර්ම හිමියන් පැමිණ චාන්ෂෙන් (Chan zen) හෙවත් ධ්‍යාන සම්ප්‍රදායය මඟින් චීන ජනයාගේ ආධ්‍යාත්මික ශක්තිය අවධි කළ අතර චීනය පුරා සෙන් (Zen) තියෙන්ටයි (Tien Tai) හෙවත් සද්ධර්ම පුණ්ඩරික සම්ප්‍රදායය, සුඛාවතී ව්‍යූහ සම්ප්‍රදායය, විනය සම්ප්‍රදායය ආදි බෞද්ධ නිකායයන් බොහෝ ගණනක් ව්‍යාප්ත කළ බව
- තාඕ සහ කොන්පියුසියස් දහම මත පදනම් වූ දේශීය ආචාර ධර්ම පද්ධතිය සමඟ බෞද්ධ ආචාර ධර්ම පද්ධතිය සංකලනය වී නව ජන ජීවිතයක් හා ආචාර ධර්ම පද්ධතියක් සකස් වූ බව
- චිත්‍ර, මූර්ති කැටයම්, ගෘහ නිර්මාණ ශිල්පය වැනි කලාශිල්පවල වස්තු විෂය බෞද්ධ මුහුණුවරක් ගෙන ඒවා බෞද්ධ ආභාසයෙන් සංවර්ධනය වූ අතර භාෂාව සහ සාහිත්‍යය බුදුදහමින් පෝෂණය වූ බව
- ආගමික සිද්ධාන්ත පදනම් කර ගනිමින් චීනයේ සං ලුං සුං නිකායය, චාන් නිකායය, තියෙන්තායි නිකායය, සුඛාවතී ව්‍යූහ නිකායය, විනය නිකායය, තන්ත්‍ර යානය, අවතංසන නිකායය වැනි විවිධ බෞද්ධ නිකායයන් පහළ වූ බව

**ජපානයට බුදුදහම හඳුන්වාදීම සහ එරට සංස්කෘතිය බුදු සමයෙන් පෝෂණය වූ ආකාරය**

- ජපානයට බුදුදහම ලැබීමට පෙරාතු ව පැවතියේ ස්වභාවධර්මයේ කල්පිත දෙවිවරුන් හා මළවුන් ඇදහීම මුල් කර ගත් ෂින්තෝ ආගම වන අතර එය එරට දේශීය ආගම වශයෙන් සැලකෙන බව
- චීනයේ පැවති කොම්පියුසියස් දහම ද මෙරට ප්‍රාග් බෞද්ධ ආගමක් ලෙස පැවති බව
- ජපානයට නිල වශයෙන් බුදුදහම ක්‍රි.ව. 552 දී හඳුන්වා දෙනු ලැබ ඇත්තේ අසල්වැසි කොරියාවේ කුදාරා රාජ්‍යයේ පාලකයා විසින් බව
- එවකට ජපානයේ පාලකයා වූ කිම්මෙයි අධිරාජයා වෙත දූත කණ්ඩායමක් මඟින් බෞද්ධ පොත්පත් රැසක්, ලෝහ බුදු පිළිමයක් හා බුදුදහම පිළිබඳ ප්‍රසංසාත්මක ලිපියක් එවූ බව
- මේ වකවනුවේ සෝගා, මොනොනොබේ සහ නකතෝමී යනුවෙන් වංශවත් ගෝත්‍රික කණ්ඩායම් තුනක් ජපානයේ පාලන කටයුතුවලට සම්බන්ධ ව ක්‍රියා කළ අතර ඔවුන් සියලු දෙනා ම ෂින්තෝවාදීන් වූ බව

- ජපානයට බුදුදහම ලැබීමෙන් අනතුරු ව සෝගාවරුන් බුදුදහම පිළිගැනීමට යොමු වූ අතර සෙසු ගෝත්‍ර දෙක දැඩි ෂින්තෝවාදීන් වූ බැවින් අභිනව දහම ප්‍රතික්ෂේප කළ බව
- බුදුදහම පිළිගත් සෝගාවරුන් ප්‍රතිමා මන්දිරයක් ඉදි කර බුද්ධ ප්‍රතිමා වන්දනයට යොමු ව කටයුතු කරන විට එරටට වසංගත තත්ත්වයක් උදා වූ බව
- එවිට බුදුදහමට විරුද්ධ වූ සෙසු ගෝත්‍රික දෙක ෂින්තෝ දෙවිවරුන් උරණ වී එම වසංගත තත්ත්වය ඇති කළ බව ප්‍රකාශ කරමින් බුදු මැඳුර බිඳ දමා පිළිම වහන්සේ අසල දිය අගලකට වීසි කොට ධර්ම ග්‍රන්ථ ගිනිබත් කළ බව
- පසු ව මොනයම් හේතුවක් නිසා හෝ වසංගතය දුරු වී ආගමික ගැටුම් නිරාකරණය වූ බව
- වසංගතය දුරු වී ටික කලක් ගත වීමෙන් අනතුරු ව නැවත වතාවක් කොරියාවෙන් භික්ෂු පිරිසක්, ගෘහ නිර්මාණ ශිල්පීන් ද සමග පැමිණීමෙන් පසු සෝගාවරුන් යළිත් බුදුදහම පිළිගැනීමට යොමු වූ බව
- එම අවස්ථාවේ ද නැවත වසංගතය හටගත් කල්හි පෙර පරිදි ම මොනොනොබේ හා නකතෝමි යන ගෝත්‍රික දෙපිරිස සෝගාවරුන් සමඟ ගැටුම් ඇති කරගෙන බුදුපිළිම හා පිළිමගෙවල් කඩා දැමූ බව
- එවිට වසංගතය දුරු වීම වෙනුවට උත්සන්න වීමක් සිදු වූ අතර බුදුදහමට පක්ෂපාතිත්වය දැරූ සෝගාවරුන් එය තම වාසියට හරවාගෙන බුදුදහමට කළ විනාශය නිසා එම තත්ත්වයක් ඇති වූ බව ප්‍රකාශ කරමින් ජනමතයක් ගොඩනඟාගෙන බුදුපිළිම වන්දනයට යොමු වීමත් සමඟ වසංගතය සම්පූර්ණයෙන් ම දුරු වී සමෘද්ධිමත් කාලයක් උදා වූ බව
- ක්‍රි.ව. 585 දී පමණ බලයට පත් යොමෙයි අධිරාජයා බෞද්ධයකු වීම එරට බුදුසමයේ සංවර්ධනයට බොහෝ සෙයින් හේතු වූ බව
- ක්‍රි.ව. 592 දී බලයට පත් වූ සුයිකෝ අධිරාජිනියගේ යුවරජු ලෙස කටයුතු කළ ෂෝතෝකු තයිෂි කුමරුගේ ශාසන සංවර්ධන ක්‍රියාකාරකම් නිසා එරට බුදුසමයේ ස්වර්ණමය යුගය උදා වූ බව
- ජපානයේ රාජ්‍ය ආගම බවට බුදුදහම පත් කරමින් විහාරා ම ඉදිකරමින් ධර්ම ශාස්ත්‍රීය කටයුතුවල නිරත වෙමින්, ආගමික ව්‍යාප්තිය සඳහා සුවිශේෂී සේවාවන් රැසක් සිදු කළ නිසා ෂෝතෝකු තයිෂි හෙවත් උමයාදෝ කුමරු ජපන් අශෝක, දෙවැනි අශෝක යන විරුදාවලියට ලක් වූ බව
- ජපන් බෞද්ධ ඉතිහාසය මූලික වශයෙන් නරා, හෙයියන්, කමාකුරා හා මෙයිජි හෙවත් නූතන යුගය වශයෙන් බෙදීමකට ලක් කොට බුදු දහමේ විවිධ පරිවර්තනීය ලක්ෂණ විමසීමකට ලක් කෙරෙන බව
- ක්‍රි.ව. 710 දී ගෙම්මෝයෝ අධිරාජිනිය නරා ප්‍රදේශය සිය අගනුවර කර ගැනීමෙන් පසු ව මෙම යුගයේ ආරම්භය සටහන් වන බව
- බුදුදහමේ ශීඝ්‍ර දියුණුවක් මේ යුගයේ ඇති වූ අතර අභිධර්ම කෝෂ (කුසා) සත්‍ය සිද්ධි (ජොජිත්සු) විනය (රිත්සු) යෝගාචාර (හොස්සෝ) මාධ්‍යමික (සන්රොන්) අවතංසක (කෙංගොන්) ආදි වශයෙන් බෞද්ධ සම්ප්‍රදායන් හයක් මේ යුගයේ දී බුදුදහමට එකතු වූ බව
- මෙකල ග්‍යෝහී නම් උගත් භික්ෂුවකගේ ආගමික, සාමාජික සේවාවන් ඇගයීමකට ලක් වී ඇති බව
- ජපානයේ ප්‍රසිද්ධ තොද්යි-ජි විහාරය, වෛරෝචන බුද්ධ ප්‍රතිමාව ගොඩනැඟුණේ ද නරා යුගයේ බව

- ජපන් ඉතිහාසයේ දෙවන යුගය ආරම්භ වන්නේ ක්‍රි.ව. 8 වන සියවසේ අගභාගයේ අගනුවර නරා ප්‍රදේශයෙන් ක්යෝතෝ ප්‍රදේශයට රැගෙන යෑමෙන් පසු ව බව
- සාම අගනුවර යන අදහසින් හෙයියන්ක්‍යෝ නමින් ව්‍යවහාර වූ බව
- ක්වම්මු අධිරාජයා විසින් ආරම්භ කරන ලද නව අගනුවර වසර දාහකට වැඩි කලක් පැවති අතර මුල් සියවස් තුනේ දී බුදු දහමේ ශීඝ්‍ර සංවර්ධනයක් පැවැති බව
- මෙම අවධියේ ශාසන සංවර්ධනයට දායක වූ භික්ෂූන් වහන්සේලා අතර සයිෂෝ (දෙන්ග්‍යෝදයිෂි) සහ කුකයි (කෝබෝදයිෂි) භික්ෂූන් වහන්සේ දෙනම ප්‍රධානත්වයේ ලා සැලකෙන බව
- සයිෂෝ භික්ෂුව (දෙන්ග්‍යෝදයිෂි) ඇති කළ තෙන්දයි නිකායයත්, කුකායි භික්ෂුව (කෝබෝදයිෂි) ආරම්භ කළ ෂින්ගොන් නිකායයත් සමඟ නරා යුගයටත් වඩා වැඩියෙන් බුදුසමයෙහි සංවර්ධනයක් ඇති වූ බව
- විශේෂයෙන් ෂින්තෝ දහමත්, බුදුදහමත් අතර මිත්‍ර සම්බන්ධතාවක් ගොඩනගා ගැනීමට මේ නිකායික ක්‍රියාකාරකම් හේතු වූ අතර බුදුදහම විදේශයකින් පැමිණි දහමක් නොව ෂින්තෝ දහම මෙන් ජපානයේ වර්ධනය වූ ස්වදේශීය ආගමක් බවට පත් වූයේ හෙයියන් යුගයේ බව
- කමාකුරා අගනුවර පදනම් කරගෙන ජපන් ඉතිහාසයේ තෙවන යුගය ආරම්භ වන අතර මේ වකවනුවේ බෞද්ධාගමික නිකායයන් ගණනාවක් බිහි වූ බව
- එම නිකායයන් අතුරින් නෙම්බුත්සු සම්ප්‍රදායය, නිචිරෙන් සම්ප්‍රදායය හා සෙන් බෞද්ධ සම්ප්‍රදායය ජපන් සංස්කෘතිය පෝෂණය කිරීම සඳහා නවාංග රුසක් එකතු කිරීමට දායකත්වය සැපයූ අතර මෙයිනුත් සෙන් බෞද්ධ සම්ප්‍රදායය ප්‍රමුඛ වන බව
- කමාකුරා යුගයේ අවසාන කාලයේ බුදුසමය තරමක් පසුබෑමකට ලක්වීම හේතුවෙන් කොම්පියුසියස් හා ෂින්තෝ දහම ද නැවත ජනප්‍රියත්වයට පත් වෙමින් ගොඩනැගුණ බව
- ක්‍රි.ව. 1868 දී මෙයිජි හෙවත් නූතන යුගයේ ආරම්භය සටහන් වන්නේ බුදුදහමට මෙබඳු පරිසරයක් ගොඩනැගුණු වකවනුවක බව
- ක්‍රි.ව. 19 වන හා 20 වන සියවස්වල ඇතිවුණ සාමාජික, සංස්කෘතික විපර්යාසයනුත් දෙවන ලෝක සංග්‍රාමයත් මෙයිජි යුගයේ මුල් අවස්ථාවේ ශාසන පරිහානියට හේතු වූ බව
- පසු කාලයේ නව අභියෝගයන්ට හා කාලයට ගැළපෙන ලෙස බෞද්ධ ඉගැන්වීම් නවීන දෘෂ්ටිකෝණයකින් විග්‍රහ කිරීමට බෞද්ධ උගතුන් පෙලඹුණු බව
- 1952 ලෝක බෞද්ධ සම්මේලන සභාව ජපානයේ පැවැත්වීමත් සමඟ නැවත වතාවක් ජපානයේ බුදුදහමෙහි නව පිබිදීමක් ඇති වූ බව

**ජපන් සංස්කෘතිය බුදුදහමින් පෝෂණය වීම**

- බුදුදහම පැමිණීමට පෙර ජපානයේ දියුණු සංස්කෘතියක් පැවතුණු බවට සාක්ෂය හමු නොවන බව
- ජපානය තුළ විවිධ ක්ෂේත්‍රයන්හි සංවර්ධනය කෙරෙහි බුදුදහම බෙහෙවින් ම බලපා ඇති නිසා බුදුදහමින් තොර ජපන් සංස්කෘතියක් ගැන කතා කළ නොහැකි බව
- මහායාන බුදුසමය ඇසුරින් සමාජ ගත කෙරුණ බෝධිසත්ත්ව සංකල්පය මඟින් එරට ජනතාව අතර ආචාරශීලී බව, අනතිමානිත්වය හා ධෛර්යසම්පන්න බව ආදි බෝධිසත්ත්ව සාරධර්ම ගොඩනැගුණ බව

- ගිහි පැවිදි දෙපිරිස අතර විශාල වෙනසක් දක්නට නොලැබීම, ජපන් කාන්තාවගේ තත්ත්වය වර්ධනය වී පිරිමින්ට හා සමාන අයිතිවාසිකම් භුක්තිවිඳින පිරිසක් බවට පත්වීම, මෘත ශරීර භූමදානය කිරීමේ සාම්ප්‍රදායික ක්‍රමයෙන් බැහැර ව ආදාහන චාරිත්‍රයට යොමු වීම, ජපන් බෞද්ධ ආරාම සංඝාරාම වශයෙන් ද අධ්‍යාපන මධ්‍යස්ථාන (තෙරකෝයා) වශයෙන් ද සෞඛ්‍ය මධ්‍යස්ථාන වශයෙන් ද වැඩිහිටි නිවාස වශයෙන් ද ජනතාවගේ බහුවිධ අවශ්‍යතාවන් ඉටු කිරීමට යොමු වූ ස්ථානයක් බවට පත් වී ඇති බව
- හනමත්සූරි නම් වූ බුදු රදුන්ගේ උපන්දින උත්සවය, මළවුන් පිදීමට බෞද්ධ අර්ථකථන සපයමින් ඇති වූ බොන් උත්සවය, බුද්ධත්වයට පත්වූ දිනය සැමරීමේ ජෝදෝ උත්සවය, පරිනිර්වාණය සිහි ගන්වන නෙහට උත්සවය, තේ පානෝත්සවය වැනි උත්සව මඟින් ජපන් ජනතාවගේ කෘතගුණ සැලැකීමේ පුරුද්ද, වැඩිහිටියන්ට සැලකීමේ පුරුද්ද, පුද්ගල සංයමය හා සදාචාර සංවර්ධනය කිරීමට යොදාගෙන ඇති බව
- ජපන් කලාශිල්ප බුදුසමය නිසා නව මුහුණුවරක් ගත් අතර ඒ මඟින් ඔවුන්ගේ චිත්ත සමාධිය ප්‍රගුණ කෙරෙන බව
- සෙන් බුදුදහමේ ආභාසය ගොඩනැඟුණ ඉකෙබානා නම් වූ මල්සැකසුම කලාව නෝ, කබුකි, ඔකුම් නාට්‍ය කලාව, බුන්රකු නම් වූ රූකඩ කලාව, සුමියේ චිත්‍ර කලාව, හයිකු නම් වූ කාව්‍ය කලාව, උද්‍යාන සැකසුම් කලාව, ජිගතු නම් වූ සංගීතය, තේපානෝත්සවය, කඩු ශිල්ප, සමුරායි සටන් කලාව විශේෂ ශිල්ප කලා ගණයට ඇතුළත් වන බව
- ජපානයේ ගෘහ නිර්මාණ ශිල්පයේ ද කිසියම් වෙනසක් ඇති කිරීමට බුදුදහම බලපා ඇති බව
- ෂින්තෝ දේවස්ථාන මඟින් ඉපැරණි ගෘහ නිර්මාණ ශිල්පය පිළිබඳ අවබෝධයක් ලබාගත හැකි අතර, එයට වඩා දියුණුවට බෞද්ධ පන්සල්, චීන හා ඉන්දියානු ගෘහ නිර්මාණ කලාවට අනුව ගොඩනැඟුණු බව
- නරා නුවර අබියස ඇති හොර්යූජි විහාරය එයට කදිම සාක්ෂ්‍යයක් වන අතර මෙය ලෝකයේ ඇති පැරණි ම දැව මුවා ගොඩනැගිල්ල ලෙස සැලකෙන බව
- ඊට අමතර ව හොකොජී විහාරය, යකුෂි ජී විහාරය, තෝදඉජී විහාරයේ ද උසස් ගෘහ නිර්මාණ ශිල්පයට අනුව නිර්මාණය වී ඇති බව
- ජපන් මූර්ති ශිල්පය ද බුදු දහම ලැබීමත් සමඟ සංවර්ධනය වූ බව
- කොරියාවෙන් ජපානයට බුදුදහම ලැබුණේ බුරුම ප්‍රතිමාවක් ද සහිතව බැවින් බෞද්ධ මූර්ති ශිල්පයේ ආරම්භය මෙසේ සටහන් වන අතර පසු කාලයේ එහි සංවර්ධනය සඳහා චීන මූර්ති ශිල්පයේ ද ආභාසය නොමඳ ව ලැබී ඇති බව
- ඒ අනුව හොර්යූජි විහාරස්ථානයේ ඇති භේසජ්ජ ගුරු බුද්ධ ප්‍රතිමාව, තෝදඉජී විහාරයේ ඇති රෝෂණ පිළිමය (වෛරෝචන බුදු රදුන්ගේ පිළිමය) මෑතක් වන තුරු ලෝකයේ විශාලතම ලෝකඩ බුදුපිළිමය ලෙස ගැනුණු දඉබුත්සු ප්‍රතිමාව නිදසුන් ලෙස දැක්විය හැකි බව
- මේ ආකාරයට ජපන් සංස්කෘතියෙහි සැම අංශයක ම විශාල වෙනසක් ඇති කිරීමට බුදුදහම බලපා ඇති බව

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණ මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත. පහත සඳහන් ඇගයීම් ද යොදා ගත හැකි ය.

1. චීනයට බුදුදහම ලැබුණ ආකාරය පැහැදිලි කරන්න.
2. ධර්ම ශාස්ත්‍රීය සේවාවේ නිරත වූ චීන භික්ෂූන් වහන්සේලාගේ තොරතුරු එක්රැස් කොට පොත් පිංචක් සකස් කරන්න.
3. ජපානයට බුදුදහම ලැබුණු ආකාරය පැහැදිලි කරන්න.
4. චීනයේ හා ජපානයේ බෞද්ධ සංස්කෘතික විශේෂතා වගුගත කොට දක්වන්න.
5. ෂෝතෝකු තයිෂි හෙවත් උමයාදෝ කුමරුගෙන් ජපන් බුදු දහමේ උන්නතියට ලැබුණ අනුග්‍රහය ඇගැයීමට ලක් කරන්න.
6. ජපානයේ සෙන් දහමෙහි දැකිය හැකි සුවිශේෂ ලක්ෂණ ලේඛනගත ව දක්වන්න.

**පරිශීලනයට :**

- ලෝක බෞද්ධ සංස්කෘතිය - චීනය - වැල්ලවත්තේ ආනන්ද හිමි සහ ටී.බී.කාන්ගහආරච්චි
- ජපන් බුදුදහම හා සංස්කෘතිය - වල්පොල විමලඥාණ හිමි
- සංක්ෂිප්ත ලෝක බෞද්ධ සංස්කෘතිය - වැල්ලවත්තේ ආනන්ද හිමි, ටී.බී. කාන්ගහආරච්චි
- බෞද්ධ ශිෂ්ටාචාරයේ ව්‍යාප්තිය - උඩුගම සුමංගල හිමි, යටියන විමලබුද්ධි හිමි
- බෞද්ධ ලෝකය - බඹරැන්දේ සිරිසීවලී හිමි
- ජපන් බුදුදහම - සනත් නානායක්කාර
- ජපන් සෙන් කතා - චන්දිම විජේබණ්ඩාර, එච්.එම්. මොරටුවගම
- ආසියාවේ බෞද්ධ ඉතිහාසය - මංගල ඉලංගසිංහ
- දිනමිණ වෙසක් කලාපය (1992) - සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම
- චීන බුදුදහමට පෙරවදනක් - තිස්ස කාරියවසම්
- ජපන් බුදුදහමේ ගමන්මග - ජී.ඒ. සෝමරත්න
- චීනයේ බුදුදහමේ ඉතිහාසය - පරිවර්තනය හිරිපිටියේ පඤ්ඤාකිත්ති හිමි

**නිපුණතාව 10.0 :** බුදුසමයෙන් පෝෂණය වූ භාරතීය, ශ්‍රී ලාංකේය කලා ශිල්ප හා සාහිත්‍යය ඇගයීමට ලක් කරමින් ඒවා සංරක්ෂණයටත් සංවර්ධනයටත් දායක වෙයි.

**නිපුණතා මට්ටම 10.1 :** බුද්ධ ප්‍රතිමා හා ස්තූප නිර්මාණයට අදාළ භාරතීය හා ශ්‍රී ලාංකේය කලා සම්ප්‍රදාය හැඳින ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 34 යි.

**ඉගෙනුම් පල :**

- බුද්ධ ප්‍රතිමා හා ස්තූප නිර්මාණකරණයෙහි ලා පාදක වූ විවිධ සම්ප්‍රදායයන් හා ඒවායේ සුවිශේෂතා අධ්‍යයනය කරයි.
- බෞද්ධ කලා නිර්මාණ අගය කරයි.
- බෞද්ධ කලා කෘති සුරක්ෂිත කිරීමට දායක වෙයි.
- බෞද්ධ කලා කෘති නිර්මාණය කිරීමෙහි ලා පුරෝගාමී වෙයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

භාරතීය හා ශ්‍රී ලාංකේය බුද්ධ ප්‍රතිමා කලාවේත්, ස්තූප කලාවේත් ආරම්භය හා විකාශය පිළිබඳ ව ගවේෂණය කිරීම ද බුද්ධ ප්‍රතිමා කලාවේ සම්ප්‍රදායයන් හා විවිධ ස්තූප ආකෘති මෙන් ම එහි ව්‍යූහය අධ්‍යයනය කිරීම ද මෙයින් අපේක්ෂිත යි.

**විෂය අන්තර්ගතය :**

- බුද්ධ ප්‍රතිමාවේ ආරම්භය
- ගන්ධාර සම්ප්‍රදායය හා මථුරා සම්ප්‍රදායය
- ශ්‍රී ලංකාවේ බුද්ධ ප්‍රතිමා
- බුද්ධ ප්‍රතිමාවල ආසන හා මුද්‍රා
- භාරතීය ස්තූප කලාව, සාංචි හා භාරුත් ස්තූප
- ශ්‍රී ලාංකේය ස්තූප කලාවේ ආරම්භය
- විවිධ ස්තූප ආකෘති
- ශ්‍රී ලාංකේය ස්තූපයේ අනන්‍යතා ලක්ෂණ
- ස්තූපයේ සංකේතාර්ථ

**බුද්ධ ප්‍රතිමාවේ ආරම්භය :**

- බෞද්ධ කලා ශිල්පයන්හි ආරම්භය ඈත අතීතයට දිවයන බව
- මෞර්ය යුගයේ බිහි වූ කලා නිර්මාණ එයට සාක්ෂ්‍ය සපයන බව
- බෞද්ධ කලාවේ ශ්‍රේෂ්ඨ නිර්මාණයක් ලෙස සැලකෙන බුද්ධ ප්‍රතිමාව උද්දේශික චෛත්‍යයට ඇතුළත් වන බව

- උද්දේසික වශයෙන් බුද්ධ ප්‍රතිමා නිර්මාණය කොට වන්දනාමාන කිරීම මුල් අවධියේ සිදු නොවුණ අතර එය සිදු වී ඇත්තේ බුද්ධ පරිනිර්වාණයෙන් සියවස් කීපයක් ඉක්මගිය පසු ව යැයි සැලකෙන බව
- මානව රූපීව බුද්ධ ප්‍රතිමාව නිර්මාණය කිරීමට ප්‍රථම ඒ වෙනුවට විශේෂ සංකේත කිහිපයක් භාවිතයට ගෙන ඇති බවට සාධක සාංචි, භාර්හුත් හා අමරාවතී කැටයම් මඟින් හෙළිදරව් වන බව
- සංකේත භාවිතයෙන් බුද්ධ වන්දනාව කෙරෙහි යොමු වන්නට ඇත්තේ කෙලෙසුන් ප්‍රහීණ කළ බුදු රජාණන් වහන්සේගේ ප්‍රතිරූපයක් නිර්මාණය කිරීමට පැවති බිය හා අසීමිත ගෞරවය අපහසු යැයි සැලකීම ආදී කරුණු නිසා විය හැකි බව
- පැරණි කලා ශිල්පීන්ගේ අපොහොසත්කම හෝ ත්‍රිපිටකාගත තහනමක් හෝ නිසා බුද්ධ ප්‍රතිමා නිර්මාණය කිරීමෙන් වැළකී නො සිටිය බැව් ආනන්ද කුමාරස්වාමි හා ගංගුලි සඳහන් කර ඇති බව
- අංගුත්තර නිකායේ "ඒක පුග්ගලෝ භික්ඛවේ උප්පජ්ජමානෝ උප්පජ්ජති අදුතියෝ අසහායෝ අප්පටිමෝ අප්පටිසමෝ අප්පටිභාගෝ අප්පටි පුග්ගලෝ අසමෝ දිපදාන අග්ගෝ කතමෝ ඒක පුග්ගලෝ තථාගතෝ අරහං සම්මා සම්බුද්ධෝ" යනුවෙන් දැක්වෙන පරිදි ''මහණෙනි එක් පුද්ගලයෙක් ලොව උපදින්නේ ය, ඔහු අද්විතීය ය, අසහාය ය, අප්‍රතිම ය, අප්‍රතිභාගය, අප්‍රති පුද්ගලය ය, අසමසම ය, ඒ තථාගත වූ අර්හත් සම්මා සම්බුදු රජාණන් වහන්සේ ය'' යනුවෙන් විස්තර කරන ප්‍රකාශය කලාකරුවා බුද්ධ ප්‍රතිමා නිර්මාණය කෙරෙහි යොමු නොවීමට හේතු වූවා යැයි අනුමාන කළ හැකි බව
- ප්‍රථම වරට බුදු පිළිම නෙළීම ආරම්භ කළේ කවර කලෙක කවරකු විසින් ද යන්න පිළිබඳ ව විවිධ මත පවතින බව
- ප්‍රවාද කථා, සාහිත්‍ය මූලාශ්‍රය හා පුරාවිද්‍යාත්මක සාධක පදනම් කරගෙන යථෝක්ත මත ඉදිරිපත් වී ඇති බව
- සාහිත්‍යාගත මූලාශ්‍රයයක් වන කෝසලබිම්බ වර්ණනාවේ දැක්වෙන පරිදි කොසොල් රජතුමා බුදුරදුන් ජීවමාන කාලයේ ම සඳුන් ලී අරටුවකින් බුද්ධ ප්‍රතිමාවක් නිමවා වැඳුම් පිදුම් කළ බව
- කාලිංගබෝධි ජාතකයට අනුව අනේපිඬු සිටුතුමා බුද්ධ ප්‍රතිමාවක් නෙළීමට බුදු රදුන්ගෙන් අවසර ලබාගත් බව
- සමන්තපාසාදිකාවේ දැක්වෙන ආකාරයට අශෝක රජතුමා මහාකාල නම් නාගරාජයකු විසින් මවන ලද බුද්ධ ප්‍රතිමාවකට සත් දිනක් වැඳුම් පිදුම් කළ බව
- ඇතැම් මූලාශ්‍රයයනට අනුව බුද්ධ ප්‍රතිමාවේ ආරම්භය බුද්ධ කාලයේ ම සිදු වූ බවට සාධක ඇති අතර ඒ පිළිබඳ ව උගතුන් විසින් විවිධ මත පළ කර ඇති බව
- පුරාවිද්‍යාත්මක සාක්ෂ්‍ය අනුව බුදු රදුන්ගේ රූපය මානවාකාරයෙන් නිර්මාණය වී ඇත්තේ ක්‍රි.පූ.පළමු වන සියවසේ හෝ ක්‍රි.ව.පළමු වන සියවසේ හෝ කණිෂ්ක රාජ්‍ය සමයේ බව
- කණිෂ්ක රජුගේ රුව සහිත කාසිවල බුදු රදුන්ගේ රුව ද නිරූපණය කර ඇති බව

- පෙෂාවෝරයේ ඔහු විසින් ම නිම කරවන ලද ෂා-ජි- කි-ධෛරී ධාතු කරඬුවෙහි ද බුද්ධ රූපයක් කැටයම් කර ඇති බව
- කණිෂ්ක රාජ්‍ය වකවනුවේ ම ගන්ධාර හා මථුරා යන ප්‍රදේශවල ද බුද්ධ ප්‍රතිමා නිර්මාණය කිරීම ආරම්භ වූ  බවට සාධක ඇති බව
- මෙම සම්ප්‍රදාය දෙකෙන් පළමු ව ප්‍රතිමා නිර්මාණය වූයේ කුමන ප්‍රදේශයේ ද යන්න පිළිබඳ ව ද මතවාද පවතින බව
- වින්සන්ට් ස්මිත්, පර්සි බ්‍රවුන්, පුෂේ වැනි විද්වතුන් ගන්ධාර ප්‍රදේශයේ බුද්ධ ප්‍රතිමා නිර්මාණය පළමු ව සිදු වූ බව ප්‍රකාශ කරන අතර ආනන්ද කුමාරස්වාමි, හැවල් වැනි අය මථුරා ප්‍රදේශයේ පළමු ව බුද්ධ ප්‍රතිමා නිර්මාණය වූවා යැයි ප්‍රකාශ කරන බව
- ගන්ධාරයේ ඇති වූ බුදු පිළිමය ග්‍රීක-රෝම කලාවේ ආභාසය ඇති ව ඇපලෝ දේව රූප ගුරු තන්හි  තබාගෙන නිර්මාණය කර ඇතැයි සැලකෙන බව
- මථුරා ප්‍රතිමා නිර්මාණය කර ඇත්තේ භාරතීය යක්ෂ රූපවල රෞද්‍ර ස්වරූපය ක්‍රමයෙන් ඉවත් කර සිවුරක් පෙරවීමෙන් යැයි සැලකෙන බව
- මෙම සම්ප්‍රදාය දෙකෙහි සුවිශේෂ වෙනස්කම් රැසක් දක්නට ලැබෙන බව

| **ගන්ධාර පිළිමය** | **මථුරා පිළිමය** |
|---|---|
| 1. මහා කාරුණික ලීලාව දක්වයි. | 1. ශාක්‍ය සිංහ ලීලාව දක්වයි. ඇතැම් විට පාමුල සිංහ රුවක් ඇත. |
| 2. ආභංග හෙවත් මඳක් නැමුණු කෝමල සිරුර නිරූපණය කරයි. | 2. සමභංග හෙවත් ඍජු ව  දෙපා මඳක් දුරස් කොට තබාගෙන ඇත. |
| 3. අත් සංවර ව සිරුරට ළං ව ඇත. | 3. අත් සිරුරට ඈත් ය. ඇතැම් විට ඉණට අත් ගසා ගත් අයුරු දැක්වේ. |
| 4. නෙත් අඩවන් ය, තොල් සිහින් ය, පරිමානුකූල පිම්බී කම්මුල් ය. (මනා ව සැකසුණු කම්මුල් වලින් යුක්ත ය) | 4. නෙත් විවෘත ය, තොල් මහත් ය, කම්මුල් ඇත. |
| 5. හිසකේ ස්වාභාවික ය. | 5. හිසකේ ශෛලිගත ය, කැරලි ගැසී ඇත. |
| 6. සිවුර ග්‍රීක ටෝගාවකට සම ය, රැලි ස්වාභාවික ය. | 6. විනිවිද පෙනෙන තරම් දුහුල් සිවුරකි, රැලි අඩු ය, ඝන ය,  ශෛලිගත ය. |
| 7. පද්මාසනය, කුඩා නෙළුම් මලක් මත දුෂ්කර ව වැඩ සිටින විලාසයකි. | 7. පද්මාසනය, නෙළුම් මල මත පහසුවෙන් වැඩ සිටින විලාසයකි. |

- පසු කාලයේ ගන්ධාර, මථුරා සම්ප්‍රදාය දෙකෙහි ම ආභාසය ඇති ව දකුණු ඉන්දියාවේ අමරාවතී සම්ප්‍රදායය බිහි වූ බව

**ශ්‍රී ලංකාවේ බුද්ධ ප්‍රතිමා**

- මහාවංස සඳහනට අනුව මෙරට බුද්ධ ප්‍රතිමා නිර්මාණය කිරීම දේවානම් පියතිස්ස රාජ්‍ය වකවානුව තෙක් ඈතට දිවයන බව
- දේවානම් පියතිස්ස රජතුමා ථූපාරාමයේ තැන්පත් කළ උරුශිලා ප්‍රතිමාව පසුව කනිට්ඨ තිස්ස රජතුමා පාචීන තිස්ස පබ්බත විහාරයේ තැන්පත් කළ බව
- දුටුගැමුණු රජතුමා රුවන්මැලි සෑ ගර්භයේ රනින් කළ බුද්ධ ප්‍රතිමාවක් තැන්පත් කළ බව
- මුලින් බුද්ධ ප්‍රතිමා නිර්මාණය කිරීමේ ගෞරවය ලාංකේය කලාකරුවන්ට හිමි යැයි මත පළ වී ඇති බව
- ඩී. ටී. දේවේන්ද්‍ර, සිරි ගුණසිංහ, නන්දදේව විජේසේකර යන විද්වතුන් එම මතය ඉදිරිපත් කරන්නන් අතර ප්‍රමුඛත්වයක් ගන්නා බව
- එහෙත් ක්‍රි.ව.දෙවන ශතවර්ෂයට පෙර නෙළන ලදැයි සැලැකෙන පිළිම කිසිවක් ලංකාවේ පුරාවිද්‍යාඥයන්ට තව ම හමු වී නැති බව
- මහ ඉලුප්පල්ලමින් හමු වී ඇත්තේ දැනට හමු වී ඇති පැරණි ම ලාංකේය හිටි පිළිමය යැයි සැලකෙන බව
- ලාංකේය ප්‍රතිමා කලාව සඳහා අමරාවතී ආභාසය ලැබී ඇතැයි ඇතැම් විද්වතුන්ගේ අදහස වන නමුත් ස්වාධීන නිර්මාණයක් වශයෙන් එය විකාශය වී ඇති බව
- ඉරියව් අනුව ඉපැරණි බුද්ධ ප්‍රතිමා හිටි පිළිම, හිඳි පිළිම හා සැතපෙන පිළිම හෙවත් ඕත් පිළිම වශයෙන් ත්‍රිවිධාකාර වන අතර පිළිම නෙළීම ආබද්ධ හා අනාබද්ධ වශයෙන් දෙයාකාර වන බව
- මෙම ඉරියව් තුනට අදාළ අනුරාධපුර හා පොළොන්නරු යුගයට අයත් සුවිශේෂ ප්‍රතිමා කිහිපයක් ලෙස අවුකන, රැස්වෙහෙර, බුදුරුවගල, මාළිගාවිල, ගල් විහාරය, තොළුවිල, මහමෙවුනාව, තන්තිරිමලේ යන ස්ථානයන්හි පිහිටි ප්‍රතිමා හඳුන්වා දිය හැකි බව
- ලාංකේය කලා කරුවා බුද්ධ ප්‍රතිමා නිර්මාණය සඳහා කළුගල්, මැටි, බදාම, ලෝහ, කිරි ගරුඬ, ඇත් දත් හා දැව යන මාධ්‍ය යොදාගත් බව

**බුද්ධ ප්‍රතිමාවේ මුද්‍රා සහ ආසන**

- බුද්ධ ප්‍රතිමාවන්හි මුද්‍රා යන්නෙන් අදහස් කරන්නේ අත් සහ ඇඟිලි උපයෝගී කරගෙන සිදු කරනු ලබන සන්නිවේදන ක්‍රියාවලියක් බව
- බුද්ධ ප්‍රතිමාව සම්බන්ධ ව විවිධ විද්වතුන් විසින් මුද්‍රා රැසක් හඳුන්වා දෙනු ලැබුව ද මෙහිදී සාම්ප්‍රදායික ව ඉදිරිපත් කෙරෙන මුද්‍රා හයක් පමණක් සැලකිල්ලට ගැනෙන බව
- සමාධි, ධර්මචක්‍ර, අභය, විතර්ක, භූමිස්පර්ශ හා වරද එම මුද්‍රා වන බව

**සමාධි මුද්‍රාව හෙවත් ධ්‍යාන මුද්‍රාව**

- වීරාසනයෙන් හෝ පද්මාසනයෙන් හෝ හිඳ උකුළ මත විවෘත කළ වම් අත්ල උඩ දකුණු අත්ල පිහිටුවා සංසුන් ව සිටින ඉරියව්ව සමාධි මුද්‍රාව බව
- භාවනානුයෝගී පුද්ගලයකු හිඳගෙන සිටින්නේ මෙම ඉරියව්වෙන් බව
  "නිසීදති පල්ලංකං ආභුජිත්වා උජුංකායං පනිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා" (පලක් බැඳ උඩුකය කෙළින් පිහිටුවා කමටහනට අභිමුඛ ව සිටී) යනුවෙන් පාලි මූලාශ්‍රයයන්හි සඳහන් වන්නේ මෙම මුද්‍රාව වන බව

- ලක්දිව ප්‍රකට මහමෙවුනාවේ සමාධි පිළිමය, තොලුවිල සමාධි පිළිමය, ගල් විහාරයේ සමාධි පිළිමය ආදි පිළිම රැසක් මෙයට ඇතුළත් වන බව
- ලක්දිව හිඳි පිළිමවල බහුල ව මෙම මුද්‍රාව දැකිය හැකි බව
- මෙම මුද්‍රාව මඟින් සිත එකඟ කර ගැනීම පිළිබිඹු කෙරෙන බව

ධර්ම චක්‍ර මුද්‍රාව

- හිඳි පිළිමවල දක්නට ලැබෙන මුද්‍රාවක් බව
- දකුණු අත්ල පිටතට හරවා පපුවේ මට්ටමට තබාගෙන එහි දබර ඇඟිල්ලේ තුඩු දෙක කවයක් සැදෙන සේ එකට තබා ඇතුළට හැරුණු වම් අතේ ඇඟිල්ලක් ස්පර්ශ කරන අයුරින් පැවැතීම මෙහි ලක්‍ෂණය බව
- ඉන්දියාවේ ප්‍රසිද්ධ සාරානාත් ප්‍රතිමාවේ මෙම මුද්‍රාව දක්නට ලැබෙන බව
- ධර්ම දේශනා විලාසය, ධර්මය පැහැදිලි කිරීම පිළිබිඹු වන බව

අභය මුද්‍රාව

- හිටි පිළිමවල බහුල ව දැක්වෙන බව
- බුද්ධ ප්‍රතිමා තැනීමේ ආරම්භක අවස්ථාවේ පටන් ම දක්නට ලැබෙන මුද්‍රාවක් බව
- දකුණු අත උඩට නමා ඇඟිලි සම්පූර්ණයෙන් ම දිගහැර අත්ල ඉදිරිපසට සිටින සේ විවෘත ව තැබීම මෙහි ලක්‍ෂණය බව
- ලෝක සතුන්ගේ බිය දුරු කිරීම මෙයින් සංකේතවත් කෙරෙන බව
- ලක්දිව අවුකන, රැස්වෙහෙර, බුදුරුවගල හිටි පිළිම මෙම මුද්‍රාවෙන් යුක්ත බව

විතර්ක මුද්‍රාව

- ගැටලුවක් විසඳීම හෝ ධර්මය පැහැදිලි කරදීම හෝ සංකේතවත් කෙරෙන බව
- ව්‍යාඛ්‍යාන මුද්‍රාව, ඥාන මුද්‍රාව, සනිදර්ශන මුද්‍රාව යන නම්වලින් ද මෙය හැඳින්වෙන බව
- අත්ල පපු ප්‍රදේශයට සමීප වන පරිදි දකුණු අත උඩට නමා දබර ඇඟිල්ල මහපට ඇඟිල්ල උඩට කවයක් ඇතිවෙන ආකාරයෙන් තැබීම මෙහි මූලික ලක්‍ෂණය වන බව
- එසේ ම අත්ල ඉදිරිපසට විවෘත ව තබා ඉතිරි ඇඟිලි තුන දිගහැර තිබීම ද මෙහි ලක්‍ෂණයක් වන බව
- මෙම මුද්‍රාවෙන් යුක්ත බුද්ධ ප්‍රතිමාවක් බදුලු දිස්ත්‍රික්කයෙන් හමු ව දැනට කොළඹ කෞතුකාගාරයේ තැන්පත් කර ඇති බව

භූමි ස්පර්ශ මුද්‍රාව

- මෙය බුද්ධ හා බෝධිසත්ත්ව ප්‍රතිමාවන්ට පමණක් අනන්‍ය වූ මුද්‍රාවක් බව
- හිඳි පිළිමවලට පමණක් ආවේණික මුද්‍රාවක් බව
- දකුණු අත දකුණු දණ හිස උඩින් අත්ල ඇතුළට සිටින ආකාරයෙන් සියලු ඇඟිලි දිග හැර පොළොව දෙසට යොමු කර සිටිමත් වම් අත උකුළ මත අත්ල උඩට සිටින ආකාරයෙන් තිබීමත් මෙහි ලක්‍ෂණය බව

- බෝමැඩ මාර පරාජයේ දී බුදු රජාණන් වහන්සේ පාරමිතා පිරූ බවට මහ පොලව සාක්ෂ්‍ය දැරීම සංකේතවත් කිරීම සඳහා මෙම මුද්‍රාව යොදා ගැනෙන බව
- මෙම මුද්‍රාවෙන් යුක්ත ප්‍රතිමා ශ්‍රී ලංකාවෙන් සොයා ගැනීම අසීරු බව

වරද මුද්‍රාව

- දකුණු අත පහත් කොට ඉදිරියට දිග හැර අත්ල උඩු අතට හරවා ඇඟිලි දිග හැර තිබීම මෙම මුද්‍රාවේ ලක්ෂණය බව
- වරද මුද්‍රාව බෙහෙවින් ම දක්නට ලැබෙන්නේ හිටි පිළිමවල බව
- මෙම මුද්‍රාවෙන් අර්ථ කිහිපයක් සංකේතවත් කෙරෙන බව
- වරදානය හෙවත් පොරොන්දු ඉටු කිරීම ද පරිත්‍යාගශීලී ගුණය ද මෙයින් මූර්තිමත් කෙරෙන බව
- මෙම මුද්‍රාවෙන් යුක්ත පිළිම ශ්‍රී ලංකාවෙහි දුර්ලභ වන නමුදු ගඩලාදෙණි විහාරයේ ලෝකඩ බුද්ධ ප්‍රතිමාවේ මෙම මුද්‍රාව දැකිය හැකි බව
- මෙම මුද්‍රා හයට අමතර ව තවත් මුද්‍රා වර්ග ගණනාවක් ගැන ඇතැම් උගතුන් විසින් පෙන්වා දෙනු ලැබ තිබුණ ද ඒවා අතරින් තරමක් ප්‍රචලිත වූවක් ලෙස පරදුක්ඛ දුක්ඛිත මුද්‍රාව සැලකිය හැකි බව
- පොළොන්නරුවේ ගල් විහාරයේ හිටි පිළිමයේ මුද්‍රාව පරදුක්ඛ දුක්ඛිත මුද්‍රාව ලෙස ආචාර්ය පරණවිතානයන් සඳහන් කරන බව
- දෑත් වැළමිටෙන් නමා පපුව හරහා කතිරයක් සේ බැඳගෙන සිටින විලාසය මෙහි ලක්ෂණය වන බව
- අනුන්ගේ දුකෙහි දී ඇති වන ධර්ම සංවේගය සංකේතවත් කිරීමක් මේ මඟින් සිදුකෙරෙන බව
- පොළොන්නරු ගල් විහාරයේ හිටි පිළිමයේ ඇත්තේ ත්‍රෛලෝක්‍ය විජය මුද්‍රාව ලෙස කඹුරුපිටියේ වනරතන හිමියන් හඳුන්වා දී ඇති බව

ආසන

- යම් තැනක හිඳී නම් එය ආසනය යනුවෙන් හැඳින්වෙන බව
- පාළියෙහි මෙය පැහැදිලි කෙරෙන්නේ "ආසති එත්තාති ආසනං" යනුවෙන් බව
- ප්‍රතිමා කලාවට අනුව ආසන යනු හිඳගැනීමට භාවිත ආධාරකය නොව හිඳ ගැනීමේ දී දෙපා තබා ගන්නා විලාසය බව
- එහෙත් බුද්ධ ප්‍රතිමා කලාවේ දී ප්‍රධාන වශයෙන් පද්මාසන, වීරාසන, භද්‍රාසන හා වජ්‍රාසන යනුවෙන් ආසන වර්ග හතරක් දැක්වෙන බව

පද්මාසනය

- පද්මයක ආකාරයට හිඳ ගැනීම පද්මාසනය බව
- දණහිස් නමා පතුල් උඩු අතට සිටින පරිදි දකුණු පාදය වම් කලවා උඩත් වම් පාදය දකුණු කලවා උඩත් සිටින ආකාරයෙන් හිඳීම මෙහි ලක්ෂණය බව
- කමලාසන හා ධ්‍යානාසන යන නම් ද මේ සඳහා භාවිත කෙරෙන බව
- බුදු රජාණන් වහන්සේ වැඩ සිටින ආකාරය දැක්වීමට ප්‍රතිමා ශිල්පීන් බහුල ව මෙම ආසන ක්‍රමය යොදාගෙන ඇති බව
- සමාධිය සංකේතවත් කිරීම සඳහා මෙය භාවිත කෙරෙන බව

- ලංකාවේ පද්මාසනයෙන් යුතු ප්‍රතිමා සොයා ගැනීම දුර්ලභ වන අතර ඉන්දියාව, බුරුමය, තායිලන්තය, ඉන්දුනිසියාව වැනි රටවල බහුල ව දක්නට ලැබෙන බව

**වීරාසනය**

- වම් පාදය දකුණු පාදය යටින් හා දකුණු පාදය වම් පාදය උඩින් සිටින අයුරින් තබා හිඳ ගැනීම මෙම ආසනයේ ලක්‍ෂණය බව
- මෙය ඉන්දීය ජාතිකයන් සාමාන්‍ය බිම හිඳ ගන්නා ක්‍රමය ලෙස දැක්විය හැකි බව
- ලංකාවේ හිඳි පිළිමවල බහුල ව දක්නට ඇත්තේ මෙම ආසනය බව
- තොලුවිල, මහමෙවුනා උයන, ගල් විහාරය ඇතුළු ඉපැරණි ස්ථානවල පිහිටි සමාධි ප්‍රතිමා මෙම ආසනයෙන් යුක්ත බව
- අධිෂ්ඨානය මේ මඟින් සංකේතවත් කෙරෙන බව

**භද්‍රාසනය**

- වචනාර්ථයට අනුව යහපත් වූ සුභ ආසනය යන අදහස ගැබ් වී ඇති බව
- තරමක් උසට තනන ලද විශේෂ ආසනයක් මත හිඳ කලවා දෙපසට විහිදුවා ආසනයෙන් පහතට වැටෙන පා දෙක පීඨයක මත පිහිටන අයුරින් දැක්වෙන්නේ භද්‍රාසනය බව
- දෙපතුල් තබා ඇති පීඨිකාව පද්මයක ආකාරයට නිමවා ඇති බව
- මෙම ආසනය යුරෝපීය ක්‍රමයට හිඳගැනීම යනුවෙන් ද හැඳින්වෙන බව
- අම්බලන්තොට රිදියාගම විහාර භූමියෙන් භද්‍රාසනයෙන් යුතු පිළිමයක් හමු වී ඇති බව
- ඉන්දුනීසියාව, ජාවා යන රටවල මෙම ආසනය බහුල ව දැකිය හැකි බව
- මෙම ආසනය මඟින් අකම්පාතාව සංකේවත් කෙරෙන බව

**වජ්‍රාසනය**

- දණහිස නවා දෙපතුල් උඩු අතට දෙකලවා මත තබා සිටීම මෙම ආසනයේ ලක්‍ෂණය බව
- බොහෝ විට මෙය පද්මාසනයට සමාන වන බව
- බුද්ධත්වාබෝධය අපේක්‍ෂාවෙන් දැඩි වීර්යයෙන් යුක්ත ව බෝමැඩ වැඩ සිටින ආකාරය නිරූපණය කිරීම සඳහා මෙම ආසන ක්‍රමය භාවිතා කෙරෙන බව
- එබැවින් වජ්‍රාසනය මඟින් වීර්ය සංකේතවත් කෙරෙන බව
- ලංකාවේ මෙම ආසනයට අදාළ ප්‍රතිමා සොයා ගැනීම දුර්ලභ වුවද පොළොන්නරුවේ ගල් විහාරයේ ඇති හිඳි පිළිමය වජ්‍රාසනයෙන් යුක්ත වූවක් යැයි ආචාර්ය ආනන්ද කුමාරස්වාමි පවසන බව
- මහායාන බුද්ධ ධර්මය පැතුරුණු ටිබෙට්, චීන, ජපන් යන රටවල වජ්‍රාසනය බහුල ව දක්නට ලැබෙන බව

**භාරතීය ස්තූප කලාව**

- අනුස්මරණීය පුද්ගලයන් වෙනුවෙන් කිසියම් නිර්මාණයක් බිහි කොට ඔවුනට උපහාර දැක්වීම ලෝකයේ බොහෝ ශිෂ්ටාචාරයන්හි පැවැති බව
- මිසරයේ දක්නට ලැබෙන පිරමීඩ මෙන් ම මෙසපොටේමියාවේ සිංගුරත් එයට සාක්‍ෂ්‍ය සපයන බව

- භාරතයේ පවත්නා ස්තූප කලාව ද අනුස්මරණීය උතුමන්ට උපහාර දැක්වීමක් වශයෙන් ඉදිරිපත් වූ බව
- ප්‍රාග් බෞද්ධ යුගයේ පටන් ස්තූප ගොඩ නැගීම පැවැති බවට නිදසුන් ජෛන ආගමික ස්තූපවලින් හෙළි වන බව
- පර්ගිසන් සඳහන් කරන පරිදි ස්තූප ඉන්දියාවේ ශ්මශාන (සුසාන, සොහොන) ප්‍රභව කොට ඇති බව
- ස්තූපයේ ආරම්භය පිළිබඳ ව පර්ගිසන්ට අමතර ව ඒ.එම්.හෝර්කාට්, වී.එස්.අග්‍රවාල්, ජෝන් මාර්ෂල්, රෝලන්ඩ් සිල්වා ආදි උගතුන් ගණනාවක් කරුණු ඉදිරිපත් කොට ඇති බව
- ස්තූපය බෞද්ධයන්ගේ ද ප්‍රධානතම සංකේතයක් වන අතර එහි ආරම්භය බුද්ධ කාලය තෙක් ඈතට දිව යන බව
- සැරියුත් මුගලන් අගසවු දෙනම මෙන් ම මහා ප්‍රජාපතීගෝතමී තෙරණිය ආදි ශ්‍රාවක ශ්‍රාවිකාවන්ගේ ධාතු තැන්පත් කර ස්තූප ඉදි කිරීමට බුදු රදුන් උපදෙස් දුන් බව
- බුදු රදුන්ගෙන් දහම් අසා රහත් ඵලයට පත් බාහිය දාරුචීරිය, එළදෙනක විසින් ඇන මරණයට පත් කරනු ලැබීමෙන් අනතුරු ව එම දේහය ඇඳක තබා ගෙන ගොස් දවා ස්තූපයක් කරවන ලෙසට බුදු රදුන් උපදෙස් දුන් බව
- මහා පරිනිබ්බාණ සූත්‍රයේ දී උදේනි, ගෝතමක, සත්තම්බක, බහුපුත්තක, සාරන්දද, චාපාල ආදි ස්ථාන රැසක් පිළිබඳ ව සඳහන් වෙතත් ඒවා කෙබඳු  චෛත්‍ය ද යන්න හෝ එහි දී කිනම් අර්ථයකින් චෛතිය යන්න භාවිත කළේ දැ යි යන්න හෝ අපැහැදිළි බව
- ථූපාර්හ පුද්ගලයන් පිළිබඳ ව මහා පරිනිබ්බාණ සූත්‍රයේ "චත්තාරෝ මේ ආනන්ද ථූපාරහා, කතමේ චත්තාරෝ? තථාගතෝ අරහං සම්මා සම්බුද්ධෝ ථූපාරහෝති, පච්චේකබුද්ධෝ ථූපාරහො, තථාගතස්ස සාවකෝ ථූපාරහෝ, රාජා චක්කවත්ති ථූපාරහෝති" යනුවෙන් දැක්වෙන බුදු වදන අනුව බෞද්ධ ස්තූපය පිළිබඳ සංකල්පය බුදු රදුන් විසින් ම ඉදිරිපත් කරන ලද බව
- බුදු රදුන් පිරිනිවන් පෑමට මත්තෙන් බුදු සිරුරට කෙසේ අවසන් ගෞරව දැක්විය යුතු දැයි ආනන්ද හිමියන් බුදු රදුන්ගෙන් විමසූ අවස්ථාවේ මෘත දේහය සක්විති රජ කෙනෙකුගේ මෘතදේහය මෙන් සලකා ආදාහනය කොට සිවු මංසන්දියක ස්තූපයක් තනා ප්‍රදක්ෂිණා කිරීමෙන්, මල් දම් පැළඳවීමෙන්, සුවඳ හෝ සුනු හෝ ගැල්වීමෙන් එයට පූජා පැවැත්වීමට උපදෙස් ලබා දී ඇති බව
- බුද්ධ පරිනිර්වාණයෙන් පසු ව ආදාහන කටයුතුවලට සම්බන්ධ වූ ප්‍රදේශ අටක නියෝජිතයන්ට බුදු රදුන්ගේ ශාරීරික ධාතු බෙදා දුන් පසු ඔවු හු එම ධාතු තැන්පත් කොට ස්තූප ඉදිකළ බව
- පුරාවිද්‍යාත්මක සාධක අනුව බෞද්ධ ස්තූපයේ ආරම්භය ක්‍රි. පූ. තුන් වන සියවසෙන් ඔබ්බට නොයන අතර අශෝක, සුංග, කණිෂ්ක වැනි රාජ්‍ය වකවානුවල ඉන්දියාවේ විවිධ ස්ථානයන්හි ස්තූප ගොඩ නැගුණ බව
- සාංචි, භාරුත්, අමරාවතී ස්තූප ඉන්දියානු කලා ක්ෂේත්‍රයේ ශ්‍රේෂ්ඨ නිර්මාණ ලෙස සැලකිය හැකි බව
- දකුණු ඉන්දියාවේ අමරාවතී, භට්ටිප්‍රොල, ජග්ගයාපේට, ඝණ්ටසාලා, නාගාර්ජුනී කොණ්ඩ වැනි ස්ථානවල පිහිටි ස්තූප විශේෂ ශෛලීන්ගෙන්  නිර්මාණය කර ඇති බව

**ශ්‍රී ලාංකේය ස්තූප කලාවේ ආරම්භය**

- වංසකථා සාහිත්‍යය අනුව ලංකාවේ ස්තූප නිර්මාණයේ ආරම්භය ක්‍රි.පූ.හයවන සියවස තෙක් ඈතට දිව යන බව
- ගිරිහඬු සෑය, මහියංගණය, නාගදීපය හා කැලණිය යන ස්ථානයන්හි පිහිටි ස්තූප පිළිබඳ ව ඇති වංසකථාවන් මඟින් එය පිළිබිඹු වන බව
- එහෙත් පුරාවිද්‍යාත්මක සාක්ෂ්‍ය අනුව ලංකාවේ ඉපැරණි ම ස්තූපය ලෙස හඳුන්වා ඇත්තේ අනුරාධපුර ථූපාරාම ස්තූපය බව
- මිහිඳු හිමියන්ගේ උපදෙස් පරිදි දෙවන පෑතිස් රජතුමන් විසින් මෞර්ය ගෘහ නිර්මාණ ශිල්පය පදනම් කරගෙන බුදු රදුන්ගේ දකුණු අකු ධාතූන් වහන්සේ තැන්පත් කොට මෙම ස්තූපය ඉදි කළ බව
- වසර දෙදහකට වැඩි කාලයක් ගත වී ඇති ථූපාරාම දාගැබේ මුල් හැඩය වර්තමානයේ දක්නට නොලැබුණ ද එය වරින් වර විවිධ පාලක පිරිස් විසින් ප්‍රතිසංස්කරණය කරමින් පවත්වාගෙන එනු ලැබූ බව
- මහාවංශයේ සඳහන් පරිදි ථූපාරාමය ඉදි කිරීමෙන් අනතුරු ව දෙවන පෑතිස් රජතුමා යොදුනෙන් යොදුන ස්තූප ඉදි කළ බව
- දෙවන පෑතිස් රජුගේ සොහොයුරු උත්තිය රජු විසින් මිහිඳු මාහිමියන්ගේ භස්මාවශේෂ තැන්පත් කොට අම්බස්ථල ස්තූපය ගොඩ නැංවූ බව
- මිරිසවැටිය දාගැබ ඉදි කිරීමෙන් අනතුරු ව දුටුගැමුණු මහ රජතුමා රුවන්මැලිසෑය ඉදි කරමින් මහා පරිමාණ ස්තූප ගොඩ නැංවීමේ ක්‍රියාවලිය ආරම්භ කළ බව
- අනුරාධපුර අභයගිරි හා ජේතවන යන ස්තූප මෙරට ස්තූප කලාවේ විශිෂ්ටත්වය ලොවට විදහාපාන ප්‍රමුඛ නිර්මාණ බව
- පොළොන්නරු යුගයේ ද මහාපරිමාණයේ හා මධ්‍ය පරිමාණයේ ස්තූප ඉදි වීම සිදු වූ බව

**විවිධ ස්තූප ආකෘති**

- ස්තූපයක බඳ කොටස හෙවත් ගර්භයේ හැඩය අනුව ප්‍රධාන වශයෙන් ස්තූප ආකෘති හයක් පැරණි ශ්‍රී ලාංකික කලා ශිල්පීන් හඳුන්වා දී ඇති බව
  1. පද්මාකාර - පොළොන්නරුවේ දෙමළ මහා සෑය හා යුදගණා ස්තූපය ආදිය
  2. ඝණ්ටාකාර - අනුරාධපුරයේ ථූපාරාමය, ලංකාරාමය ආදි කුඩා ස්තූප රැසක් මේ ගණයට ඇතුළත් බව
  3. ධාන්‍යාකාර - කැලණි ස්තූපය ආදිය
  4. බුබ්බුලාකාර - රුවන්මැලි සෑය ඇතුළු මහා ස්තූප රැසක් මේ ගණයට ඇතුළත් බව
  5. ඝටාකාර - කතරගම කිරිවෙහෙර, සෝමාවතී ස්තූපය මුලින් මේ හැඩයෙන් යුක්ත වූ බව
  6. ආමලකාකාර - දැදිගම කොටවෙහෙරින් මේ වර්ගයේ ධාතු කරඬුවක් හමු වී ඇති බව

- මීට අමතර ව පසු කාලයේ පලාණ්ඩාකාර, අණ්ඩාකාර, චතුරාස්‍රාකාර, අෂ්ටාස්‍රාකාර ආදි වශයෙන් තවත් ආකෘති කිහිපයක් පිළිබඳ ව තොරතුරු දැක්වෙන බව

**ශ්‍රී ලාංකේය ස්තූපයේ අනන්‍යතා ලක්‍ෂණ**

- ශ්‍රී ලාංකේය ස්තූප නිර්මාණයේ ආකෘතිය ඉන්දියාවේ සාංචි ස්තූපය පූර්වාදර්ශ කරගෙන තිබුණ ද එහි ශ්‍රී ලාංකික අනන්‍යතා ලක්‍ෂණ රැසක් දෘශ්‍යමාන වන බව
- මෙම විශේෂතා බහුල ව දැකිය හැකි වන්නේ ස්තූපයන්හි උපරිභාගයේ වන බව
- ඉන්දියානු ස්තූපවල දක්නට ලැබුණු හර්මිකා නමින් හැඳින්වුණු ගරාදි වැටක් සහිත හතරැස් කොටුව මුල් කාලයේ ලාංකේය ස්තූපවල දක්නට ලැබුණ ද පසු කාලයේ එය නවීකරණය වී ගඩොළු සහ බදාම සහිත ඝනකයක් බව
- ලාංකේය ස්තූපයන්ට අනන්‍ය වූ සිලිංඩරාකාර හැඩයෙන් යුතු නිර්මාණය දේවතා කොටුව නමින් හැඳින්වෙන අතර එහි සතර වරම් දෙවිවරුන්ගේ රූප නෙළා ඇති බව
- කොත් කැරැල්ල, කොත, චූඩා මාණික්‍යය ලාංකේය ස්තූපයේ අනන්‍යතාව පෙන්නුම් කරන තවත් ලක්‍ෂණයන් බව
- භාරතයේ පැවැති චෛත්‍යශාලා වෙනුවට චේතියඝර ඇති වූ බව
- ගර්භයේ හැඩය අනුව ස්තූප වර්ගීකරණයට ලක් වූ බව
- පේසා වළලු තුනක් දක්නට ලැබෙන බව
- වාහල්කඩ, මලසුන් ගෙවල් ලාංකේය ස්තූප කලාවට ආවේණික ලක්‍ෂණ බව
- ත්‍රිවිධ චෛත්‍ය සංකල්පය ජනප්‍රියත්වයට පත් වීමත් සමඟ විහාරස්ථානයක අත්‍යවශ්‍ය පූජනීය වස්තුවක් ලෙසට ස්තූපය පරිවර්තනය වූ බව

**ස්තූපයේ සංකේතාර්ථ**

- ත්‍රිවිධ චෛත්‍යයන්ට අයත් ස්තූපය ශාරීරික චෛත්‍යයකි. බෞද්ධයාගේ ආධ්‍යාත්මික දියුණුව ද ස්තූප මඟින් සංකේතවත් වන අතර විද්වත් මතයට අනුව ස්තූපාංග මඟින් ද බුදු දහමට අදාළ ධර්ම කොටස් විවරණය කෙරෙන බව

  ඒ අනුව

  1. පදනම - සූවාසූ දහසක් ධර්මස්කන්ධය
  2. තුන් මහල් පේසාව - ත්‍රිවිධ රත්නය
  3. ගර්භය - සත්තිස් බෝධිපාක්ෂික ධර්ම
  4. හතරැස් කොටුව - චතුරාර්ය සත්‍යය
  5. දේවතා කොටුව - දිව්‍ය ලෝක හෝ සතරවරම් දෙවිවරු
  6. කොත් කැරැල්ල - නවාංග ශාස්තෘ ශාසනය
  7. කොත - නිවන

  සංකේතවත් කරන බව

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණය මැන බැලීමට සුදුසු ආකාරයේ ඇගයීම් සකස් කරගැනීමට ගුරු භවතාට නිදහස ඇත. ඒ අතරට පහත සඳහන් ඇගයීම් ද යොදා ගත හැකි ය.

1. බුද්ධ ප්‍රතිමාවේ ආරම්භය පිළිබඳ ව ඇති සාහිත්‍යගත තොරතුරු හා විවිධ මතවාද යනමැයෙන් රචනයක් ලියන්න
2. ලංකාවේ ඉපැරණි බුද්ධ ප්‍රතිමාවන් දහයක් පිළිබඳ ව අදාළ තොරතුරු පහත දැක්වෙන වගුවෙහි සටහන් කරන්න

| ඉරියව්ව | පිහිටි ස්ථානය | නිර්මාණය කළ අය | කාලය | මුද්‍රාව | සම්ප්‍රදායය |
|---|---|---|---|---|---|
| | | | | | |

3. පහත සඳහන් කරුණු සැලකිල්ලට ගනිමින් 'ස්තූපයේ ආරම්භය හා ව්‍යාප්තිය' යන මැයෙන් ප්‍රස්තුතීකරණයක් (Presentation) ඉදිරිපත් කරන්න
   - i ස්තූපයේ ආරම්භය පිළිබඳ සාහිත්‍යගත තොරතුරු
   - ii මෞර්ය යුගයේ පිහිටි ස්තූප කිහිපයක ආකෘති හා ස්තූපාංග
   - iii ස්තූප වර්ගයන්ට අදාළ ආකෘති හා පිහිටි ස්ථාන
   - iv ස්තූපාංග මඟින් ඉදිරිපත් කෙරෙන සංකේතාර්ථ

4. ශ්‍රී ලාංකේය ස්තූපයේ අනන්‍යතා ලක්ෂණ පහක් නම් කරන්න.
5. ස්තූපයේ ආගමික හා සංස්කෘතික වටිනාකම පැහැදිලි කරමින් පුවත්පතකට ලිපියක් සකස් කරන්න.
6. බුද්ධ ප්‍රතිමා හා ස්තූප නිර්මාණයට අදාළ භාරතීය හා ශ්‍රී ලාංකේය නිර්මාණ ඇසුරෙන් බහුවරණ ප්‍රශ්න 10ක් සකස් කරන්න.

**පරිශීලනයට**

- මහා පරිනිබ්බාණ සූත්‍රය - දීඝ නිකාය
- ඒක පුග්ගල වර්ගය - අංගුත්තර නිකාය
- උදාන පාළිය - ඛුද්දක නිකාය
- මහාවංසය - සුමංගල හිමි සහ බටුවන්තුඩාව දේව රක්‍ෂිත පරිවර්තනය
- ලක්දිව බුදු පිළිමය - කඹුරුපිටියේ වනරතන හිමි
- බුදු පිළිම - තිරාණගම රතනසාර හිමි
- අපේ සංස්කෘතිය - බද්දේගම විමලවංශ හිමි
- බුදු පිළිමය මුද්‍රා සහ ආසන - බෙල්ලන්විල විමලරතන හිමි

- බුද්ධ ප්‍රතිමාවේ සමාරම්භය පිළිබඳ නව නිදසුන් කිහිපයක් - වල්පොළ විමලඥාන හිමි

- බුද්ධ ප්‍රතිමාව සහ ලංකාව - ඩී.ටී. දේවේන්ද්‍ර
- පැරණි සිංහල ප්‍රතිමා ශිල්පය - නන්දදේව විජේසේකර
- නිවන් මඟ බෞද්ධ කලා ශිල්ප අංකය - රජයේ මුද්‍රණාලය
- බෞද්ධ ස්තූප - තිරාණගම රතනසාර හිමි
- ලංකාවේ ස්තූප - එස්. පරණවිතාන
- ස්තූප - චන්ද්‍රා වික්‍රම ගමගේ
- ලංකාවේ ස්තූපය - ටී.ජී. කුලතුංග

- බෞද්ධ ශිෂ්ටාචාරය මූල ධර්ම සහ වංශකථාව - චන්දිම විජේබණ්ඩාර, එච්.එම්. මොරටුවගම

- බුදු පිළිම - පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

**නිපුණතාව 10.0 :** බුදුසමයෙන් පෝෂණය වූ භාරතීය, ශ්‍රී ලාංකේය කලා ශිල්ප හා සාහිත්‍යය ඇගයීමට ලක් කරමින් ඒවා සංරක්ෂණයටත් සංවර්ධනයටත් දායක වෙයි.

**නිපුණතා මට්ටම 10.2 :** අනුරාධපුර, පොළොන්නරු යුගවලට අයත් බුද්ධ ප්‍රතිමා හා ස්තූප අනුබද්ධ කලා නිර්මාණ පිළිබඳ ව අධ්‍යයනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 34 යි.

**ඉගෙනුම් පල :**

- අනුරාධපුර, පොළොන්නරු යුගවලට අයත් බුද්ධ ප්‍රතිමා, ස්තූප හා තදනුබද්ධ කලා නිර්මාණ පිළිබඳ ව ගවේෂණය කරයි.
- ඉපැරණි ශ්‍රී ලාංකේය කලාකරුවාගේ කලා කෞශල්‍යය අගය කරයි.
- ඉපැරණි බෞද්ධ කලා කෘති සුරක්ෂිත කිරීමට දායක වෙයි.
- නව බෞද්ධ කලා කෘති නිර්මාණයෙහි ලා උත්සුක වෙයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්:**

බුදු දහමින් පෝෂිත හෙළ කලාකරුවා ත්‍රිවිධ චෛත්‍යය සංකේතවත් කිරීම සඳහා ස්තූපය, බෝධිය හා බුද්ධ ප්‍රතිමා නිර්මාණය කිරීමට පෙලඹුණාක් මෙන් ම, එයට අනුබද්ධ ව තවත් කලාත්මක නිර්මාණයන් රැසක් සිදු කළේ ය.ඒවා පිළිබඳ ව අනාගත පරපුර දැනුම්වත් කිරීම හා එම උරුමයන් ආරක්ෂා කර ගැනීමේ වැදගත්කම පිළිබඳ හැඟීමක් ඇති කිරීම මෙයින් අපේක්ෂිත ය.

**විෂය අන්තර්ගතය**

- චේතියඝර
- පටිමාඝර
- බෝධිඝර
- වාහල්කඩ
- සඳකඩපහණ
- මුරගල
- කොරවක්ගල
- පියගැටපෙළ

යන කලා නිර්මාණ පිළිබඳ අවබෝධය

**චේතියඝර**

- කුඩා හා මධ්‍ය පරිමාණයේ චෛත්‍යයන්හි ආරක්ෂාව සඳහා ගල් කණුවලින් වට කොට ඒ මත පියස්සක් තනා ඉදිකළ වෘත්තාකාර ගෘහය චේතියඝර, ථූපඝර යන නම් වලින් හැඳින්වෙන බව
- ඉන්දියාවේ පැවැති චෛත්‍යශාලාවලින් ලක්දිව චේතියඝර සඳහා පූර්වාදර්ශයන් ලැබෙන්නට ඇති බව
- මුල් කාලයේ ථූපාරාමය, ලංකාරාමය, අම්බස්තලය වැනි කුඩා ස්තූපවලට ඉදි කළ චේතියඝර පැවැති බවට සාධක හමු වන බව
- චේතියඝරය බොහෝ විට හඳුන්වන්නේ වටදාගෙය යනුවෙන් බව
- මෙම සංකල්පය වර්ධනය වී කුඩා ධාතු ගර්භයක් වට කොට නිමැවුණ වෘත්තාකාර අලංකාර මන්දිර විශේෂයට වටදාගෙය යනුවෙන් ව්‍යවහාර කළ බව
- ඇතැම් විද්වතුන්ගේ මතය වන්නේ චේතියඝර සංකල්පය ථෙරවාද බුදු දහමට සම්බන්ධ නිමැවුමක් වන අතර වටදාගෙය මහායානයට අදාළ නිමැවුමක් බව
- වටදාගෙය නම් වු ගොඩනැගිල්ල තුළ සිවු දිසාවට මුහුණ ලා බුද්ධ ප්‍රතිමා තැන්පත් කර තිබීම නිසා ප්‍රතිමා වන්දනයට වැඩි ඉඩක් සැලසුණු බව
- මැදිරිගිරිය, පොළොන්නරුව, තිරියාය යන වටදාගෙවල් (චේතියඝර) කලාත්මක විශේෂත්වයක් ගන්නා බව
- මෙම ගෘහ නිර්මාණයන් මඟින් චෛත්‍යයේ ආරක්ෂාව තහවුරු වූවා සේ ම සැදැහැවතුන්ට අව්වෙන් වැස්සෙන් ඇතිවන පීඩාවන්ගෙන් වැළකී වැඳුම් පිදුම් කිරීමට අවකාශය සැලසුණ බව
- වටදාගෙය අලංකාර ගල් කුලුනු, පියගැටපෙළ, කොරවක්ගල්, මුරගල්, පුන්කලස්, සඳකඩ පහණ යන කලාත්මක අංග රැසකින් සුසැදි සුවිශේෂී නිර්මාණයක් බව

**පටිමාඝර**

- බුදු පිළිම තැන්පත් කිරිම සඳහා ඉදි කළ ගෘහ විශේෂය පටිමාඝර හෙවත් පිළිම ගෙවල් යනුවෙන් හැඳින්වෙන බව
- ස්වාභාවික විපත්වලින් බුද්ධ ප්‍රතිමා ආරක්ෂා කර ගැනීමට පටිමාඝර ඉදි වූ බව
- ගන්ධ කුටි, පාසාද හා ගෙඩිගේ යනුවෙන් පැරණි පටිමාඝර ප්‍රධාන වශයෙන් තුන් ආකාර වූ බව
- බුදු රදුන් වැඩසිටි කුටිය ගන්ධ කුටිය නමින් හැඳින්වුණ අතර මුල් යුගයේ පිළිමගෙවල් එයට අනුරූපී ව සමචතුරාස්‍රකාර ව ඉදිවුණ බව
- අනුරාධපුර කිරිබත් වෙහෙර පිළිමගෙය, ථූපාරාමය අසල පිළිමගෙය, තොලුවිල පිළිමගෙය ගන්ධ කුටි ක්‍රමයට නිදසුන් බව
- පාසාද යන්නෙන් මහල් සහිත ගොඩනැගිල්ලක් පිළිබඳ ව අදහස් කෙරෙන අතර එබඳු මහල් සහිත පිළිම ගෙවල් ''පාසාද පටිමාඝර'' ගණයට ගැනෙන බව
- මිගාරමාතු ප්‍රාසාදය බුදු රදුන් වැඩ සිටි ආරාමයක් වූ බැවින් ඒ අනුව ලාංකේය ගෘහ නිර්මාණ ශිල්පීන් මහල් සහිත පිළිම ගෙවල් තැනීමට යොමු වූ බව

- ලංකාවේ ප්‍රසිද්ධ රත්න ප්‍රාසාදය නම් ගොඩනැගිල්ල, බිසෝ මාලිගා ගොඩනැගිල්ල යන ස්ථානවලින් මෙයට අදාළ පිළිම ගෙවල් හමු වී ඇති බව
- පංචායතන නමින් හැඳින්වෙන ගොඩනැගිලි සංකීර්ණ තුළ ද පාසාද ක්‍රමයට අයත් පිළිම ගෙවල් හමු වී ඇති බව
- ආයත චතුරස්‍රාකාර ගෘහ විශේෂයක් වන මෙහි පිළිමය පිහිටුවා ඇත්තේ දිග පැත්තේ බව
- වහලය ද ඇතුළත් සමස්ත ගොඩනැගිල්ල ම ගඩොළින් ම නිමවා තිබීම ගෙඩිගේ සම්ප්‍රදායේ විශේෂත්වය වූ බව
- ගන්ධ කුටි ප්‍රතිමා ගෘහයක මෙන් ප්‍රවේශය, අන්තරාලය, ගර්භගෘහය යන අංගත්‍රයයම මෙම පිළිම ගෙවල් තුළ ද දක්නට ලැබෙන බව
- ඇතැම් ප්‍රතිමා ගෙඩිගේ ප්‍රතිමා ගෘහවල ප්‍රදක්ෂිණා කිරීම සඳහා ද ඉඩක් වෙන් කර තිබූ බව
- පිළිම ගෙවල බිත්තියේ පිටත දිව්‍ය විමානයන් ද ඇතුළත ජාතක හා බුදු සිරිතේ විශේෂ අවස්ථා ද සිතුවම් කොට ඇති බව
- පොළොන්නරුවේ මහ පැරකුම්බාවන්ගේ නිර්මාණ ලෙස සැලැකෙන ථූපාරාමය, ලංකාතිලක විහාරය හා ජේතවනාරාමය හෙවත් තිවංක පිළිම ගෙයත් ඊට අමතර ව මාතලේ දිස්ත්‍රික්කයේ නාලන්දා ගෙඩිගෙයත් මෙයට නිදසුන් ලෙස දැක්විය හැකි බව
- මෙම ප්‍රතිමාඝර වර්ග තුනට අතිරේක ව මහනුවර රාජධානි යුගයේ සංවර්ධනය වූ ටැම්පිට පිළිම ගෙවල් ද විශේෂත්වයක් ගන්නා බව

බෝධිඝරය

- බෝධිඝරය යන්නෙන් අදහස් කරන්නේ බෝධීන් වහන්සේ වටා ඉදි කරනු ලැබූ පටු පියස්සක් සහිත මණ්ඩපයක් බව
- බුදු රජාණන් වහන්සේට දැක්වූ ගෞරවය බෝධීන් වහන්සේට ද පළ කිරීමක් වශයෙන් හා බෝධි වන්දනාවේ යෙදෙන බැතිමතුන්ට අව්වෙන් වැස්සෙන් ඇති වන පීඩා වැළැක්වීම සඳහා බෝධිඝර නිර්මාණය වූ බව
- දඹදිව ශ්‍රී මහා බෝධීන් වහන්සේ වටා මෙන් ම අනුරාධපුර ශ්‍රී මහා බෝධීන් වහන්සේ වටා ද බෝධිඝර පැවැති බව
- ඉන් අනතුරු ව ලංකාවේ බොහෝ බෝධීන් වහන්සේලා වෙනුවෙන් ද බෝධිඝර ඉදි කළ බවට නිදසුන් පන්කුලිය, වෙස්සගිරිය, අභයගිරි විහාරය, මගුල් මහා විහාරය, තොලුවිල, පුලියන්කුලම, සීගිරිය ආදි ස්ථාන රැසකින් හමු වන බව
- දැනට තරමක් දුරට ආරක්ෂා වී ඇති කලාත්මක බවින් අනූන වූ බෝධිඝරයක් කුරුණෑගල දිස්ත්‍රික්කයේ නිල්ලක්ගම ප්‍රදේශයෙන් හමු වී ඇති බව
- සමචතුරස්‍රාකාර වූ මාලක දෙකකින් යුත් එම බෝධිඝරය ක්‍රි.ව. අට වන සියවසට අයත් වූවක් ලෙස සැලකෙන බව.

වාහල්කඩ

- පැරණි ඉන්දීය දාගැබ් වටා සිවුදෙසින් ඉදි වූ තොරණ සතර වෙනුවට ලංකාවේ දාගැබ්වල ගර්භයට සම්බන්ධ ව සතර දිසාවට මුහුණ ලා තනා ඇති කලාත්මක නිර්මාණය වාහල්කඩ නමින් හැඳින්වෙන බව
- වර්තමානයේ වාහල්කඩ නමින් හැඳින්වෙන නිර්මාණ විශේෂය ශිලා ලේඛනවල සඳහන් ව ඇත්තේ ආයක හා ආදිමුඛ යනුවෙන් බව

- පැරණි සිංහල කලාකරුවාගේ නිර්මාණ කෞශල්‍යය පිළිබිඹු කරන පැරණි කැටයම් රැසක් වාහල්කඩවල දක්නට ලැබෙන බව
- මිහින්තලේ කණ්ඨක චෛත්‍යයෙහි වාහල්කඩ කැටයම් උසස් කලාත්මක අගයකින් යුක්ත බව
- එහි උතුරු වාහල්කඩ සම්බන්ධ උතුරු දිසාවට අයත් ගල්කුලුනු දෙකෙහි හිස මත සිංහ රූපත්, දකුණු වාහල්කඩ කුලුනු හිසමත ගව රූපත්, නැගෙනහිර කුලුනු හිස මත ඇත් රූපත්, බටහිර කුලුනු හිස මත අශ්ව රූපත් දක්නට ලැබෙන බව
- ගල් කණුවල මුහුණත වර්ණ ගන්වන ලද විවිධ මල්කම් ද කළයකින් ඉහළට නඟින කොළ සහිත දඬු ද දේව, මිනිස්, තිරිසන් හා පක්ෂි රූප ද දක්නට ලැබෙන බව
- මෙහි පවත්නා කල්ප වෘක්ෂ කැටයම අතිශයින් ම සිත්ගන්නා සුළු බව
- රුවන්මැලි සෑය, මිරිසවැටිය, අභයගිරිය, ජේතවනය යන ස්තූපවල කැටයම්වලින් යුතු වාහල්කඩ පැවැති බව
- වාහල්කඩ සෑම ස්තූපයක ම අනිවාර්ය අංගයක් නොවූ බව

**සඳකඩපහණ**

- හෙළ කලාකරුවාගේ විශිෂ්ටතම නිමැවුම් අතර සඳකඩපහණට ප්‍රමුඛත්වයක් හිමි වන බව
- ඉන්දියාවේ පාටිකා නමින් හැඳින්වුණ සඳකඩපහණ ලංකාවේ අඩ්ඪ චන්ද පාෂාණ, අඩසඳ පහණ, අඩ්ඪ චන්ද පදගණ්ඨිකා යන නම්වලින් ද හැඳින්වෙන බව
- මුල් කාලයේ බෞද්ධ ගොඩනැඟිලිවලට ප්‍රවේශ වීමට ඇති පියගැටපෙළ පාමුල තිබූ අර්ධ කවාකාර ගල් පඩිය සඳකඩපහණ නමින් හැඳින්වූ බව
- ඉන්දියාවේ නාගාර්ජුන කොණ්ඩ, අජන්තා විහාරය යන ස්ථාන කිහිපයක සඳකඩ පහණ දක්නට ලැබුණ ද ඒවා කලාත්මක බවින් උසස් නොවන බව
- ලාංකේය සඳකඩපහණ ආරම්භක වකවනුවේ කැටයම් විරල චාම් එකක් වූ අතර ක්‍රමයෙන් එයට කැටයම් එකතු වී ඇති බව
- බෞද්ධ ලෝකයේ විශිෂ්ටතම සඳකඩපහණ නිර්මාණය කිරීමේ ගෞරවය අනුරාධපුර යුගයේ මධ්‍ය භාගයේ සිටි කලාකරුවන්ට හිමි වන බව
- මෙම යුගයේ කලාත්මක බවින් අනූන සඳකඩපහණ කිහිපය අතුරින් ප්‍රමුඛ වන්නේ බිසෝ මාලිගාව අසල පිහිටි සඳකඩපහණ බව
- ඊට අමතර ව මහසෙන් මන්දිරයෙහි ඇති සඳකඩපහණ, ථූපාරාමයට ආසන්නයේ දළදා මාලිගා ගොඩනැඟිල්ලෙහි ඇති සඳකඩපහණ හා ශ්‍රී මහා බෝධියේ උතුරු ගෝපුරයේ ඇති සඳකඩපහණ ද කලාත්මක ඒවා බව
- අනුරාධපුර සඳකඩපහණට වඩා පොළොන්නරු යුගයේ සඳකඩපහණ කරුණු කිහිපයකින් වෙනස් වන බව
- හින්දූන්ගේ පූජනීය සත්ත්වයා වශයෙන් සැලකෙන ගවයා ඉවත් වීමත් ඉතිරි සත්ත්වයන් අනුරාධපුරයේ මෙන් එක ම තීරුවක නොව වෙන වෙන ම තීරුවල කැටයම් කර තිබීමත් කැටයම් අනුපිළිවෙළෙහි වෙනස්කම් දක්නට ලැබීමත් ප්‍රධාන කරුණු බව
- උගතුන්ගේ මතයට අනුව මෙම සඳකඩපහණනෙහි ඇතුළත් කැටයම් හුදෙක් අලංකාරය සඳහා පමණක් නිමවන ලද ඒවා නොවන අතර ඉන් කිසියම් අරුතක් සන්නිවේදනය කෙරෙන බව

- ඒ මත ඉදිරිපත් කරන්නන් අතර එච්.සී.පී.බෙල්, එස්.පරණවිතාන, ඩී.ටී.දේවේන්ද්‍ර, වින්සන්ට් ස්මිත්, විනී විතාරණ, විලියම් ඊ වෝඩ් ප්‍රධාන වන බව
- සඳකඩපහණ පිළිබඳ ව මුල් ම මතය ඉදිරිපත් කළ බෙල් මහතා එහි එක් පෙළට ගමන් කරන සතුන් හතර දෙනාගෙන් සතර දිසාව සංකේතවත් කෙරේ යැයි පවසන බව
- සඳකඩපහණෙහි ඇති සියලු කැටයම් සැලැකිල්ලට ගෙන ගැඹුරු අර්ථකථනයක් ඉදිරිපත් කළ සෙනරත් පරණවිතාන මහතා එය භව චක්‍රය ලෙස හඳුන්වා දෙන බව
- එම අර්ථකථනයට අනුව අනුරාධපුර සඳකඩපහණෙහි පිට රවුමේ දක්නට ලැබෙන පළාපෙති කැටයම ගිනිදැල් ලෙස හඳුන්වාදෙන ඔහු ඒ මඟින් සත්ත්වයා රාගාදි කෙලෙස් ගින්නෙන් දැවෙන බවත් සතුන් හතර දෙනාගෙන් ජාති, ජරා, ව්‍යාධි, මරණ යන සතර බියත් ලියවැලෙන් තෘෂ්ණාවත් හංසාවලිය මඟින් පිවිතුරු බවත් නෙළුම් මලෙන් නිවනත් සංකේතවත් කෙරෙති යි පවසන බව
- ඩී.ටී. දේවේන්ද්‍ර මහතාට අනුව සඳකඩ පහණ ගොඩනැගිලි දොරටු සැරසීමට යොදාගත් උපායක් හා පාදෝනිත් ලෙස දැක්විය හැකි බව
- විනී විතාරණ මහතාට අනුව සඳකඩ පහණ චන්ද්‍ර සූර්ය දෙදෙනා පිළිබඳ විශ්වාසයට හා සශ්‍රීකත්වයට සම්බන්ධ කරමින් ඉදිරිපත් කර ඇති බව
- විලියම් ඊ වෝඩ් මහතාගේ අදහසට අනුව සඳකඩ පහණ ආශ්‍රමයක හෝ විහාර මන්දිරයක හෝ ප්‍රාසාදයක හෝ පළමු පියගැටය සමඟ ම යාවී ඇති හෙයින් එහි මැද ඇති විකසිත නෙළුම්පත් රටාව ශුද්ධ ස්ථානයකට ඇතුළු වීමේ දී බැතිමතුන්ගේ ආත්ම පූජාවෙන් කොටසක් සංකේතවත් කරන බව
- සඳකඩපහණ ලාංකේය කලාකරුවාගේ කලා කෞශල්‍යය ලොවට පෙන්නුම් කරන මාහැගි නිර්මාණයක් බව

මුරගල

- පූජනීය හා රාජකීය ගොඩනැගිලි දොරටුවල දෙපස කොරවක්ගලට ඉදිරියෙන් පිහිටුවා ඇති කැටයම් සහිත හෝ රහිත හෝ අර්ධකවාකාර මුදුනකින් යුත් ගල්පුවරු, දොරටුපාල රූප හෙවත් මුරගල් නමින් හඳුන්වනු ලබන බව
- දොරටුවල අංග සම්පූර්ණත්වය සඳහාත් අලංකාරය සඳහාත් මුරගල් යොදාගෙන ඇති බව
- ඇතැම් විට කොරවක්ගලට ආධාරකයක් වශයෙන් ද මුරගල යොදාගෙන ඇති බව
- මුරගලේ සංවර්ධනීය අවස්ථා ගණනාවක් දක්නට ලැබෙන බව
- එහි දියුණු ම අවස්ථාව ලෙස ත්‍රිභංග ලීලාවෙන් යුත් මිනිස් වෙස් ගත් නා රජ මුරගල සැලැකෙන බව
- කලාත්මක බවින් උසස් ම මුරගල අනුරාධපුරයේ රත්න ප්‍රාසාදය නම් ගොඩනැගිල්ල සමීපයේ දක්නට ලැබෙන බව
- පොළොන්නරුවේ නටබුන් අතර මුරගල් දක්නට ලැබෙන අතර ඒවා සෞන්දර්යය අතින් අනුරාධපුර මුරගල ඉක්මවා නොයන බව

**කොරවක්ගල**

- ගොඩනැඟිල්ලකට පිවිසීමට ඇති පියගැට පෙළට දෙපසින් මුරගලට පිටුපසින් පිහිටුවා ඇති අලංකාර ගල් පුවරුව කොරවක්ගල නම් වන බව
- මුල දී පූජනීය ගොඩනැගිල්ලකට පිවිසීමට ඇති පියගැට පෙළට දෙපසින් පිහිටා තිබුණ ද පසු ව රජ මාලිගා මෙන් ම පොකුණුවලට බැසීමට ඇති පියගැට පෙළ දෙපස ද කොරවක්ගල් පිහිටුවා ඇති බව
- ආරම්භක වකවනුවේ ඉදි වුණ කොරවක්ගල කැටයම්වලින් තොර රළු එකක් වූ අතර පසු කාලයේ එය කලාත්මක කැටයමින් අලංකාරවත් කර ඇති බව
- අනුරාධපුරයේ දක්නට ලැබෙන බොහෝ කොරවක්ගල්වල ශීර්ෂය මකර මුඛයකින් නිකුත් වන ලියවැලක විලාසය ගත් අතර එම ලිය වැල කෙළවර වන්නේ විශාල වෘත්තාකාර දඟරයක් හෙවත් සංඝ සූරිලතාකරණයකින් බව
- කොරවක්ගලේ පිටට පෙනෙන බිත්තියේ සිංහ, හස්ති, නාග හා වාමන රූප කැටයම් බොහෝ විට දක්නට ලැබෙන බව
- පොළොන්නරුවේ පිහිටි කොරවක්ගල් ද අනුරාධපුර කොරවක්ගල්වලට සමාන වන අතර විශාල වෙනසක් නොපවතින බව
- පොළොන්නරු යුගයෙන් පසු ව ගජසිංහ හිස හෝ ඇත් හිස හෝ සිංහ හිස සහිත කොරවක්ගල් දක්නට ලැබෙන අතර යාපහුවේ හා දඹදෙණියේ දළදා මාලිගාවල ඇති කොරවක්ගල් එම වෙනස පෙන්වන බව

**පියගැට පෙළ**

- පහළ ස්ථානයක සිට ඉහළ ස්ථානයකට නැඟීමට ඇති මාර්ගයක අවශ්‍ය ම අංගයක් ලෙස පියගැට පෙළ හෙවත් පඩිපෙළ සැලැකෙන බව
- මුලින් සඳහන් කළ නිර්මාණයන් මෙන් ම පියගැට පෙළ ද ඉදිරිපත් කිරීමට හෙළ කලාකරුවන් උත්සුක වූ බව
- පියගැටපෙළේ ඇති සැම පඩියක ම සිරස් පෘෂ්ඨය කැටයම්වලින් අලංකාර කර තිබූ බව
- අනුරාධපුර පියගැට පෙළ කැටයම් අතර බහුල ව වාමන රූප දක්නට ලැබෙන අතර පඩියක දෙකෙළවර සහ මැද මිටි මිනිසුන් බරක් උසුලාගෙන සිනාමුසු මුහුණින් සිටින ආකාරය නිර්මාණය කර ඇති බව
- අනුරාධපුර යුගයේ පිය ගැටවල දක්නට ලැබෙන චාම් බව පොළොන්නරු යුගයේ පියගැටපෙළ දක්නට නොලැබෙන බව

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණය මැන බැලීමට සුදුසු ආකාරයේ ඇගයීම් සකස් කරගැනීමට ගුරු භවතාට නිදහස ඇත. ඒ අතරට පහත සඳහන් ඇගයීම් ද යොදා ගත හැකි ය.

1. අපේ පැරණි ගොඩනැඟිලි ආශ්‍රිත කලා නිර්මාණ ඇසුරින් නිර්මාණ සංග්‍රහයක් සකස් කරන්න.
2. සඳකඩපහණ පිළිබඳ ව ඉදිරිපත් වී ඇති මතවාද පහක් ගෙනහැර දක්වන්න.
3. අනුරාධපුර, පොළොන්නරු යුගයන්හි සඳකඩ පහණවල දැකිය හැකි වෙනස්කම් වගුගත කොට දක්වන්න.
4. ඉපැරණි පටිමාඝර පිළිබඳ හැඳින්වීමක් කරන්න.
5. චෛතියඝර, බෝධිඝර, මුරගල, වාහල්කඩ යන මාතෘකාවන්ට අදාළ ක්ෂණික කතා තරගයක් සංවිධානය කරන්න.
6. අනුරාධපුර හා පොළොන්නරු යුගවලට අයත් බුද්ධ ප්‍රතිමා සහ ස්තූප අනුබද්ධ කලා නිර්මාණ ඇසුරෙන් බහුවරණ ප්‍රශ්න 10ක් සකස් කරන්න.

**පරිශීලනයට :**

- අපේ සංස්කෘතිය - බද්දේගම විමලවංශ හිමි
- ශ්‍රී මහා බෝධි සංස්කෘතිය - වැලමිටියාවේ ධම්මරක්ඛිත හිමි
- සඳකඩ පහණ හා වෙනත් ලිපි - ඩී.ටී. දේවේන්ද්‍ර
- නිවන් මග (බෞද්ධ කලා ශිල්ප අංකය) - රජයේ මුද්‍රණාලයීය බෞද්ධ සංගමය
- ලංකාවේ ස්තූප - එස් පරණවිතාන
- ස්තූප - චන්ද්‍රා වික්‍රම ගමගේ
- ශ්‍රී ලංකාවේ පැරණි ගොඩනැගිලි දොරටු - චන්ද්‍රා වික්‍රම ගමගේ
- ලංකාවේ ස්තූපය - ටී.ජී.කුලතුංග

**නිපුණතාව 10.0 :** බුදුසමයෙන් පෝෂණය වූ භාරතීය ශ්‍රී ලාංකේය කලා ශිල්ප හා සාහිත්‍යය ඇගයීමට ලක් කරමින් ඒවා සංරක්ෂණයටත් සංවර්ධනයටත් දායක වෙයි.

**නිපුණතා මට්ටම 10.3 :** ශ්‍රී ලාංකේය සාහිත්‍යය හා ශිල්ප කලාවන් පෝෂණයෙහි ලා බුදුසමයෙන් ලැබුණු දායකත්වය ගවේෂණය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 24 යි.

**ඉගෙනුම් පල :**

- බුදුසමයෙන් පෝෂණය වූ ශ්‍රී ලාංකේය සාහිත්‍යය හා ශිල්ප කලාවන් විචාරශීලී ව අධ්‍යයනය කරයි.
- සාහිත්‍යය හා විවිධ කලා මාධ්‍ය සමාජයකට සාරධර්ම සම්ප්‍රේෂණය කිරීමෙහි ලා මූලික වූ ප්‍රබල සන්නිවේදන මාධ්‍යයක් බව පිළිගනියි.
- උසස් රසඥතාවකට යොමු වෙයි.
- සදාචාරාත්මක පුරවැසියකු බිහි කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

දඹදෙණි හා කෝට්ටේ යුගයේ දී බිහි වූ ගද්‍ය පද්‍ය සාහිත්‍යය සහ දේශීය චිත්‍ර කලාව හා ජනකවි, ගීත, නාට්‍ය යන සැම කලා ක්ෂේත්‍රයක් කෙරෙහි ම බෞද්ධ ආභාසය ලැබී ඇති අයුරු පරීක්ෂාවට ලක් කරමින් එම නිර්මාණ පරිශීලනය කිරිමටත්, සුරක්ෂිත කරලීමටත් අවධානය යොමු කිරීම මෙයින් අපේක්ෂිත ය.

**විෂය අන්තර්ගතය**

**දඹදෙණි හා කෝට්ටේ යුගවල සිංහල ගද්‍ය හා පද්‍ය සාහිත්‍යය**

- මෙම යුගයන්හි රචිත බොහෝ සාහිත්‍යය නිර්මාණ සඳහා බෞද්ධ ආභාසය ලැබී ඇති අයුරු එම නිර්මාණ අවසානයේ දී පැහැදිලි වන බව
- ජාතක කථා, බුද්ධ චරිතය, ලාංකේය ශාසන ඉතිහාසය, ත්‍රිවිධ චෛත්‍යය හා බැඳුණු පූජනීය වස්තූන් මුල් කරගෙන මෙම සාහිත්‍ය නිර්මාණ බිහිවූ බව
- දඹදෙණි සාහිත්‍යය යුගයේ දී රචිත ගද්‍ය සාහිත්‍ය කෘති අතර සද්ධර්ම රත්නාවලිය, පූජාවලිය දහම් සරණ සඟසරණ, ථූපවංසයත් පද්‍ය සාහිත්‍ය කෘති අතර හෙළයේ මහා කාව්‍ය ලෙස සැලැකෙන කව්සිළුමිණ සාහිත්‍යය කෘතියත් වැදගත් වන බව
- බුත්සරණ නම් වූ ගද්‍ය නිර්මාණය ද මෙම යුගයේ ම රචනා වූවා යැයි ඇතැම් විද්වතුන්ගේ අදහස බව
- කෝට්ටේ යුගය පද්‍ය සාහිත්‍යයේ ස්වර්ණමය යුගය ලෙස සැලකෙන බව
- මෙම යුගයේ රචනා වන ගුත්තිල කාව්‍යය, කාව්‍යශේඛරය, බුදුගුණ අලංකාරය, ලෝ වැඩ සඟරාව සඳහා ඍජු ලෙස බෞද්ධ ආභාසය ලැබී ඇති අතර සන්දේශ සාහිත්‍යය නිර්මාණයේ දී වුව බෞද්ධ ලකුණ දක්නට ලැබෙන බව
- ගද්‍ය සාහිත්‍ය කෘති රචනා වීම අඩුවෙන් ම සිදු වී ඇති බව.

- මෙම සැම සාහිත්‍ය කෘතියකින් ම පාහේ සාහිත්‍යය රස ජනනය කිරීමට සමත් වූවා සේ ම, ජන විඥාණය පොහොසත් කිරීමට ද සමත් වී ඇති බව

**ශ්‍රී ලංකාවේ බෞද්ධ චිත්‍ර කලාව**

- විහාරස්ථානයන්හි පිහිටි පිළිමගෙය කලාගාරයක් ලෙස සැලැකෙන අතර එහි ඇති චිත්‍ර මූර්ති, කැටයම් මඟින් එය තහවුරු කෙරෙන බව
- බුද්ධ චරිතය, බෝසත් සිරිත හා ශාසන ඉතිහාසය පිළිබඳ ව පොතපතින් ලබාදෙන දනුමට නොදෙවෙනි වූ දූනුමක් ලබාදීමට චිත්‍ර කලාව ද සමත් වී ඇති බව
- අනුරාධපුර, පොළොන්නරු, මහනුවර යුගවල මෙන් ම නූතන යුගයේ සිතුවම් කලාව මඟින් ද එය සනාථ කෙරෙන බව
- අනුරාධපුර යුගයට අයත් හිඳගල, රුවන්මැලි සෑ ධාතු ගර්භය, මිරිසවැටිය, ජේතවනය, කණ්ඨක චෛත්‍යය වාහල්කඩ, මහියංගන ස්තූපය, දිඹුලාගල, පුල්ලිගොඩ, තිවංක පිළිම ගෙය ආදි ස්ථානවල සිතුවම් මඟිනුත් මහනුවර යුගයට අයත් දෙගල්දොරුව, දඹුල්ල, රිදී විහාරය, මැදවල විහාරය, මහනුවර දළදා මාළිගාව, ගඩලාදෙණිය ආදි විහාරස්ථානයන්හි පිහිටි සිතුවම් මඟිනුත්, නූතන යුගයේ කැලණියේ අලුත් විහාරය, බොරැල්ලේ ගෝතමී විහාරය, සේදවත්තේ වෙහෙර ගොඩැල්ලේ විහාරය, මැද්දෙපොළ විහාරය, මාවිල සුමන කුසුමාරාමය, බෙල්ලන්විල රාජමහාවිහාරය යන ස්ථානයන්හි පිහිටි සිතුවම් තුලින් ද බෞද්ධ කලාවේ තේමා, අරමුණු හා සුවිශේෂතා හඳුනා ගත හැකි බව
- ලාංකේය සිංහල ජනකවි, සම්භාව්‍ය ගීත සාහිත්‍යය මෙන් ම නාට්‍ය කලාව කෙරෙහි ද බෞද්ධ ආභාසය ලැබී ඇති බව
- බොන්නේ බොර දියයි පූරුවෙ කළ පවට, පව් කළ ගොනෝ ඇදපන් හපුතල් යනවා, බුදුන් වඳින ලෙස වැඳපන් අම්මාට, නිවන් පුරේ පලයන් තලගොයි පැටියා, සාදුකාර දී ඔරුවක නැඟී වරෙන් යනුවෙන් සඳහන් ජනකවි මඟිනුත් තුන් සරණේ කවි මඟිනුත් බෞද්ධ ආභාසය පිළිබිඹු කෙරෙන බව
- තෙරුවන් පිළිබඳ ව ශ්‍රද්ධාව ජනනය කිරීමත්, බුද්ධ චරිතය පිළිබිඹු කිරීමත් බෞද්ධ දර්ශනය ප්‍රකට කරලීමත්, ශාසන ඉතිහාසය, ඉදිරිපත් කිරීමත් අරමුණු කරගෙන මෙරට බෞද්ධ ගීත සාහිත්‍යය ගොඩනැඟී ඇති බව
- අමාදහර දිය ගලා ගලා, බුද්ධං සරණං ගච්ඡාමි, සුගත ලෝනා සම්බුද්ධ රාජා. දන්නෝ බුදුන්ගේ ශ්‍රී ධර්මස්කන්ධ, අඩවන් වූ දෙනෙතින් ගලනා, දස බිම්බර මාර සෙනඟ, පාරමිතා බල පූරිත පූජිත, සන්නාලියනේ, සංසාරේ බවේ දුකා, අඩු කුලේ කියාලා, කවාලා විළඳ ජාති, සොර දෙටුවෙක් කස තැළුම් කකා..... ආදි වශයෙන් ඇති ගීත නිදසුන් වශයෙන් දැක්විය හැකි බව.
- දේශීය නාට්‍ය කලාවේ ආරම්භයේ පටන් ම බෞද්ධ ආභාසය ලැබී ඇති බව
- නාඩගම් නෘත්‍ය හා නාට්‍ය ඉතිහාසය විමසීමේ දී මේවාට අදාළ නිර්මාණ ශිල්පීන් ජාතක කථා, ශාසන ඉතිහාසය හා බැඳුණු කතා පුවත් ස්වකීය නිර්මාණ සඳහා යොදාගෙන ඇතැයි පෙනෙන බව

- සඳකිඳුරු නාඩගම, විදුර නාඩගම, හේමමාලී යන නෘත්‍යයන්ට ද, මනමේ නාඩගම, වෙස්සන්තර නාඩගම මෙන් ම මනමේ නාට්‍යය ඇතුළු ව  ලෝමහංස, බවකඩතුරාව, පේමතෝ ජායතී ශෝකෝ, මහාසාර, කදා වළලු ආදි කොට ඇති බොහෝ නාට්‍යයන්ට ද ජාතක කථා මුල් වී ඇති බව
- ජන  හදවත් තුළට බෞද්ධ සාරධර්ම සම්ප්‍රේෂණය කිරීම සඳහා මෙම නිර්මාණ විශේෂය ප්‍රබල  දායකත්වයක් සපයන බව

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණය මැන බැලීමට සුදුසු ආකාරයේ ඇගයීම්  සකස් කරගැනීමට ගුරු භවතාට නිදහස ඇත. පහත සඳහන් ඇගයීම් ද යොදා ගත හැකි ය.

1. දඹදෙණි හා කෝට්ටේ යුගයන්හි නිර්මාණය කරන ලද බෞද්ධ සාහිත්‍ය කෘති ඇසුරෙන් පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න.

| අනු අංකය | ග්‍රන්ථ නාමය | කතුවරයා | ගද්‍ය/ පද්‍ය | වස්තු විෂය | සාහිත්‍ය යුගය |
|---|---|---|---|---|---|
| | | | | | |

2. එක් එක් යුගවලට අයත් සිතුවම් හා පිහිටි ස්ථාන හා එහි සුවිශේෂත්වය ප්‍රකට කරමින් ප්‍රස්තුතිකරණයක් (Presentation) ඉදිරිපත් කරන්න.

3. ජනකවියේ බෞද්ධ ආභාසය යන තේමාව යටතේ බෞද්ධ සංකල්ප ඇතුළත් ජනකවි එකතු කොට කුඩා පොතක් සකස් කරන්න.
4. උසස් රසඥතාවකට පුද්ගලයා යොමු කරන බෞද්ධ ගීත එකතු කොට එම එක් එක් ගීතයෙන් කියවෙන අරුත සංක්ෂිප්ත ව දක්වන්න. (හැකි සෑම ගීතයක ම රචකයා හා ගායකයා නම් කරන්න.)

5. බෞද්ධ කතා තේමා කරගෙන නිර්මාණය වූ නාඩගම්, නෘත්‍ය, නාට්‍ය හඳුනාගෙන පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න.

| නාඩගම<br>නෘත්‍යය<br>නාට්‍යය | නිර්මාණකරු | කතා<br>තේමාව | ලබාදෙන<br>ආදර්ශය |
|---|---|---|---|
| | | | |

6. ශ්‍රී ලාංකේය සාහිත්‍යය හා ශිල්ප කලාවන් පෝෂණයෙහි ලා බුදුසමයෙන් ලැබුණු දායකත්වය ගවේෂණය කරයි යන නිපුණතා මට්ටමට අදාළ ව කෙටි ප්‍රශ්න 10ක් සකස් කරන්න.

**පරිශීලනයට :**

- සාහිත්‍ය ලතා - කොත්මලේ අමරවංශ හිමි
- සිංහල සාහිත්‍ය වංශය - පුංචිබණ්ඩාර සන්නස්ගල
- බණකතා සාහිත්‍යය - මාර්ටින් වික්‍රමසිංහ
- බෞද්ධ සාහිතය අංකය - රජයේ මුද්‍රණාලයීය, බෞද්ධ සංගමය
- මධ්‍යකාලීන සිංහල කලා - ආනන්ද කුමාරස්වාමි
- විසිවන සියවසේ ශ්‍රී ලාංකේය විහාර සිතුවම් කලාව - ඩබ්.එම්.පී. සුදර්ශන බණ්ඩාර
- සිංහල විශ්ව කෝෂය - සිංහල විශ්ව කෝෂ කාර්යාලය සම්පාදිත, සංස්කෘතික දෙපාර්තමේන්තුවේ 2006 11 කාණ්ඩය (චිත්‍ර)
- සිංහල ගැමි නාටකය - එදිරිවීර සරච්චන්ද්‍ර
- බෞද්ධ නාට්‍ය සම්ප්‍රදාය - චන්ද්‍රසිරි පල්ලියගුරු

## පාසල පදනම් කරගත් තක්සේරුකරණය - හැඳින්වීම

ඉගෙනුම් - ඉගැන්වීම් සහ ඇගයීම අධ්‍යාපන ක්‍රියාවලියේ වැදගත් සංරචක තුනක් බවත් ඉගෙනුමෙහි සහ ඉගැන්වීමෙහි ප්‍රගතිය දැන ගැනීම පිණිස ඇගැයීම යොදා ගත යුතු බවත්, සෑම ගුරුවරයකු විසින් ම දත යුතු පැහැදිලි කරුණකි. ඒවා අන්‍යෝන්‍ය බලපෑමෙන් යුතු ව ක්‍රියා කරන බවත් එසේ ම එකිනෙකෙහි සංවර්ධනය කෙරෙහි එම සංරචක බලපාන බවත් ගුරුවරු දනිති. සන්තතික (නිරන්තරයෙන් සිදුවන) ඇගයීම් මූලධර්ම අනුව ඇගයීම සිදුවිය යුත්තේ ඉගෙනීම හා ඉගැන්වීම කෙරෙන අතරතුර දීය. මෙය ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය ආරම්භයේ දී හෝ මැද දී හෝ අග දී හෝ යන ඕනෑම අවස්ථාවක දී සිදුවිය හැකි බව තේරුම් ගැනීම ගුරුවරයකුට අවශ්‍යය. එලෙස තම සිසුන්ගේ ඉගෙනුම් ප්‍රගතිය ඇගයීමට අපේක්ෂා කරන ගුරුවරයකු ඉගෙනුම ඉගැන්වීම සහ ඇගයීම පිළිබඳ සංවර්ධනාත්මක සැලැස්මක් යොදාගත යුතු ය.

පාසල පදනම් කරගත් ඇගයීම් වැඩපිළිවෙළ හුදු විභාග ක්‍රමයක් හෝ පරීක්ෂණ පැවැත්වීමක් හෝ නොවේ. එය හඳුන්වනු ලබන්නේ සිසුන්ගේ ඉගෙනීමත්, ගුරුවරුන්ගේ ඉගැන්වීමත් වැඩිදියුණු කිරීම සඳහා යොදාගනු ලබන මැදිහත් වීමක් වශයෙනි. තව ද මෙය ඉගෙනුම්-ඉගැන්වීම් දීර්ඝ කිරීමක් වශයෙන් ද හැඳින්විය හැකි ය. මෙය සිසුන්ට සමීපව සිටිමින් ඔවුන්ගේ ප්‍රබලතා සහ දුබලතා හඳුනාගෙන ඒවාට පිළියම් යොදමින් සිසුන්ගේ උපරිම වර්ධනය ළඟා කර ගැනීමට යොදාගත හැකි වැඩපිළිවෙළකි.

ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාකාරකම් තුළින් අනාවරණ ක්‍රියාවලියකට සිසුන් යොමු කෙරෙන අතර, ගුරුවරයා සිසුන් අතර ගැවසෙමින් ඔවුන් ඉටුකරන කාර්ය නිරීක්ෂණය කරමින් මාර්ගෝපදේශකත්වය සපයමින් කටයුතු කිරීම පාසල් පදනම් කරගත් ඇගයීම් වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීමේ දී අපේක්ෂා කෙරේ. මෙහිදී ශිෂ්‍යයා නිරතුරුව ඇගයීමට ලක් විය යුතු අතර, ශිෂ්‍ය හැකියා සංවර්ධනය අපේක්ෂිත අන්දමින් සිදුවන්නේ දැයි ගුරුවරයා විසින් තහවුරු කරුණු ලැබිය යුතු වෙයි.

ඉගෙනීම සහ ඉගැන්වීම මඟින් සිදුවිය යුත්තේ සිසුන්ට නිසි අත්දැකීම් ලබා දෙමින් ඒවා සිසුන් විසින් නිසි පරිදි අත්පත් කර ගෙන තිබේ දැයි තහවුරු කර ගැනීම ය. ඒ සඳහා නිසි මාර්ගෝපදේශය සැපයීම ගුරුභවතාගේ වගකීමකි. ඇගයීමේ (තක්සේරු කිරීමේ ) යෙදී සිටින ගුරුවරුන්ට තම සිසුන් සඳහා දෙයාකාරයක මාර්ගෝපදේශකත්වය ලබාදිය හැකි ය. එම මාර්ගෝපදේශ පොදුවේ හඳුන්වන්නේ ප්‍රතිපෝෂණය (Feed Back) හා ඉදිරි පෝෂණය (Feed Forward) යනුවෙනි. සිසුන්ගේ දුබලතා හා නොහැකියා අනාවරණය කරගත් විට ඔවුන්ගේ ඉගෙනුම් ගැටලු මඟහරවා ගැනීමට ප්‍රතිපෝෂණයෙන් සිසු හැකියා සහ ප්‍රබලතා හඳුනා ගත් විට එම දක්ෂතා වැඩි දියුණු කිරීමට ඉදිරි පෝෂණයක් ලබාදීම ගුරු කාර්යය වෙයි.

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ සාර්ථකත්වය සඳහා පාඨමාලාවේ අරමුණු අතරෙන් කවර අරමුණු කවර මට්ටමින් සාක්ෂාත් කළ හැකි වුයේ දැයි හඳුනා ගැනීම සිසුන්ට අවශ්‍ය වෙයි. ඇගයීම්

වැඩ පිළිවෙළ ඔස්සේ සිසුන් ළඟා කර ගත් ප්‍රවීණතා මට්ටම් නිශ්චය කිරීම මේ අනුව ගුරුවරුන්ගෙන් බලාපොරොත්තු වන අතර සිසුන් හා දෙමව්පියන් ඇතුළු වෙනත් අදාළ පාර්ශ්වවලට සිසු ප්‍රගතිය පිළිබඳ තොරතුරු සන්නිවේදනය කිරීමට ගුරුවරුන් යොමුවිය යුතුය. මේ සඳහා යොදාගත හැකි හොඳම ක්‍රමය වන්නේ සන්තතිකව සිසුන් ඇගයීමට පාත්‍ර කිරීමට ඉඩ ප්‍රස්ථා සලසන පාසල පදනම් කරගත් ඇගයීම් ක්‍රමයයි.

යථෝක්ත අරමුණු සහිත ව ක්‍රියා කරන ගුරුවරුන් විසින් තම ඉගැන්වීම් ක්‍රියාවලිය සිසුන්ගේ ඉගෙනුම් ක්‍රියාවලියත් වඩාත් කාර්යක්ෂම කිරීම පිණිස වඩා හොඳ කාර්යක්ෂමතාවෙන් යුක්ත ඉගෙනුම්-ඉගැන්වීම් සහ ඇගයීම් ක්‍රම යොදා ගත යුතු වෙයි. මේ සම්බන්ධයෙන් සිසුන්ට සහ ගුරුවරුන්ට යොදා ගත හැකි ප්‍රවේශ පිළිබඳ ප්‍රභේද කිහිපයක් මතු දැක්වෙයි. මේවා බොහෝ කලක සිට ගුරුවරුන් වෙත විභාග දෙපාර්තමේන්තුව විසින් ද ජාතික අධ්‍යාපන ආයතනය විසින් ද තොරතුරු සම්පාදනය කරන ලද ක්‍රමවේද වෙයි. එහෙයින් ඒවා සම්බන්ධයෙන් පාසල් පද්ධතියේ ගුරුවරුන් හොඳින් දැනුවත් වී ඇතැයි අපේක්ෂා කෙරේ. එම ප්‍රභේද මෙසේ ය.

1. පැවරුම්
2. ව්‍යාපෘති
3. සමීක්ෂණ
4. ගවේෂණ
5. නිරීක්ෂණ
6. ප්‍රදර්ශන /ඉදිරිපත් කිරීම
7. ක්ෂේත්‍ර චාරිකා
8. කෙටි ලිඛිත පරීක්ෂණ
9. ව්‍යුහගත රචනා
10. විවෘත ග්‍රන්ථ පරීක්ෂණ
11. නිර්මාණාත්මක ක්‍රියාකාරකම්
12. ශ්‍රවණ පරීක්ෂණ
13. ප්‍රායෝගික ක්‍රියාකාරකම්
14. කථනය
15. ස්ව නිර්මාණ
16. කණ්ඩායම් ක්‍රියාකාරකම්
17. සංකල්ප සිතියම්
18. ද්විත්ව සටහන් ජර්නල
19. බිත්ති පුවත්පත්
20. ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන්
21. ප්‍රශ්න හා පිළිතුරු පොත්
22. විවාද
23. සාකච්ඡා මණ්ඩල
24. සම්මන්ත්‍රණ
25. ක්ෂණික කථා
26. භූමිකා රංගන

හඳුන්වා දී ඇති මෙම ඉගෙනුම්-ඉගැන්වීම් සහ ඇගයීම් ක්‍රම සෑම එකක් ම සෑම විෂයයක් සම්බන්ධයෙන් සෑම විෂයය ඒකකයකට ම යොදා ගත යුතු යැයි අපේක්ෂා නොකෙරෙයි. තම විෂයයට, නිපුණතා මට්ටමට ගැළපෙන ප්‍රභේදයක් තෝරා ගැනීමට ගුරුවරුන් දැනුවත් විය යුතු ය. වගබලා ගත යුතු ය.

මෙම ගුරු මාර්ගෝපදේශවල ගුරවරුන්ට තම සිසුන්ගේ ඉගෙනුම් ප්‍රගතිය තක්සේරු කිරීම සඳහා යොදාගත හැකි ඉගෙනුම් - ඉගැන්වීම් හා ඇගයීම් ප්‍රභේද පිළිබඳ සඳහනක් තිබේ. ඒවා ගුරුවරුන් විසින් සුදුසු පරිදි තම පන්තියේ සිසුන්ගේ ප්‍රගතිය තක්සේරු කිරීම පිණිස යොදාගත යුතු වෙයි. ඒවා භාවිත නොකොට මඟ හැරීම සිසුන්ට තම ශාස්ත්‍රීය හැකියා මෙන් ම ආවේදනික ගති ලක්ෂණත් මනෝචාලක දක්ෂතාත් පිළිබඳ වර්ධනයක් ළඟා කර ගැනීමත් ප්‍රදර්ශනය කිරීමත් පිළිබඳ අඩුපාඩු ඇති කරවයි.

වාරය : 1
උපකරණ අංක : 01
නිපුණතාව : 06
නිපුණතා මට්ටම : 6.1
උපකරණයේ ස්වභාවය : සාකච්ඡා මණ්ඩල

**ක්‍රියාවලිය** : සිඟාලෝවාද සූත්‍රයෙහි ''භෝග විනාශ මුඛ හා පරාභව සූත්‍රයෙහි පරාභව කරුණු'' තේමා කරගෙන, දරුවන් කණ්ඩායම් කර ධර්ම සාකච්ඡාවක් පැවැත්වීම.

| නිර්ණායක / කණ්ඩායම් අංකය හෝ නම | ඉගෙනුම් ක්‍රියාවලියට අදාළ බව | සාකච්ඡා මණ්ඩල සංවිධානය කර ගැනීම, මෙහෙයවීම හා තේමා බෙදා කර ගැනීම සහ උපදෙස් අනුගමනය කිරීම | සාකච්ඡාව ඉදිරියට ගෙන යන අයුරින් සංවර්ධනාත්මක අදහස් ඉදිරිපත් කිරීම. | ඉදිරිපත් කරන අදහස්වල නිර්මාණශීලී බව, නිරවුල් බව හා තර්කානුකූල බව | නිගමන හා නිගමනවලට හේතු ඉදිරිපත් කිරීම | ලකුණු එකතුව (20 න්) | මුළු ලකුණු / 2 අවසාන ලකුණ (10 න්) |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

ලකුණු පරාසය :

| තත්වය | ලකුණු |
|---|---|
| ඉතා හොඳයි | 4 |
| හොඳයි | 3 |
| මධ්‍යස්ථයි | 2 |
| සංවර්ධනය විය යුතුයි | 1 |

වාරය : 1

උපකරණ අංක : 02

නිපුණතාව : 07

නිපුණතා මට්ටම : 7.2

උපකරණයේ ස්වභාවය : කණ්ඩායම් ක්‍රියාකාරකම්

ක්‍රියාවලිය : භාරතීය ත්‍රිවිධ ථෙරවාද සංගායනා හඳුන්වා දී අනතුරුව ශිෂ්‍යයන් කණ්ඩායම් තුනකට බෙදා, ඒ ඒ සංගායනාවල හේතු ප්‍රධානත්වය, දායකත්වය, කාලය, ක්‍රියාවලිය, ප්‍රතිඵල පිළිබඳ තොරතුරු රැස් කිරීම, වාර්තා කිරීම සඳහා සිසුන් යොමු කරවීම.

| නිර්ණායක / කණ්ඩායම් අංකය හෝ නම | අරමුණු පැහැදිලි ව දැක්වීම, විෂයයට එහි ඇති සම්බන්ධතාව දැක්වීම | මාතෘකාව පිළිබඳ ව සාකච්ඡාව සඳහා කණ්ඩායම් වැඩ සංවිධානය කාර්ය ලැයිස්තු ගත කිරීම, ක්‍රියාකාරී සැලැස්ම ගොඩනැගීම | කාර්යයෙහි නියැලීම, සහයෝගය, වගකීම දැරීම, කාලයට අනුව වැඩ අවසන් කිරීම | තර්කානුකූලව ඉදිරිපත් කිරීම, නිර්මාණශීලී බව, උචිත බව, යොදාගත් විවිධ උපක්‍රම, නායකත්වය, අනුගාමිකත්වය | නිගමනවලට එළඹීම, හේතු සාධක ඉදිරිපත් කිරීම, නිවැරදි බව, වාර්තා සැකසීම | ලකුණු එකතුව (20 න්) | අවසාන ලකුණ (10 න්) මුළු ලකුණු / 2 |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

ලකුණු පරාසය :

| තත්වය | ලකුණු |
|---|---|
| ඉතා හොඳයි | 4 |
| හොඳයි | 3 |
| මධ්‍යස්ථයි | 2 |
| සංවර්ධනය විය යුතුයි | 1 |

| | | |
|---|---|---|
| **වාරය** | : | 1 |
| **උපකරණ අංක** | : | 03 |
| **නිපුණතාව** | : | 07 |
| **නිපුණතා මට්ටම** | : | 7.3 |
| **උපකරණයේ ස්වභාවය** | : | කථනය |

**ක්‍රියාවලිය** : අශෝක හා කණිෂ්ක රජවරුන්ගේ චරිතාපදානය, ශාසනික සේවාව හා චිරස්ථිතිය පිළිබඳ ව තොරතුරු ඒකරාශී කර ගැනීමට ශිෂ්‍යයන්ට පහසුකම් හා කාලය ලබා දී නිශ්චිත කාලසීමාවක් තුළ දී වාචික ව කරුණු ඉදිරිපත් කිරීමට උචිත මාතෘකා ලබා දී කථනයට අවස්ථාව ලබා දීම.

| නිර්ණායක / කණ්ඩායම් අංකය හෝ නම | මාතෘකාවට ප්‍රවේශවීමේ නිවැරදි බව | සංවිධානාත්මක බව, මාතෘකාවට අදාළ කරුණු ඉදිරිපත් කිරීම | පුද්ගල ප්‍රකාශ යොදා ගැනීම හා නිර්මාණශීලී බව | පැහැදිලි බව, නිවැරදි කටහඬ පාලනය, අංගචලනය හා කාලය යොදා ගැනීම | සම්පිණ්ඩනය හා නිගමනය | ලකුණු එකතුව (20 න්) | අවසාන ලකුණ $\frac{\text{මුළු ලකුණු}}{2}$ (10 න්) |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

**ලකුණු පරාසය :**

| තත්වය | ලකුණු |
|---|---|
| ඉතා හොඳයි | 4 |
| හොඳයි | 3 |
| මධ්‍යස්ථයි | 2 |
| සංවර්ධනය විය යුතුයි | 1 |

වාරය : 1
**උපකරණ අංක** : 04
**නිපුණතාව** : 07
**නිපුණතා මට්ටම** : 7.4
**උපකරණයේ ස්වභාවය** : විවෘත ග්‍රන්ථ පරීක්ෂණය

**ක්‍රියාවලිය** : 7.4 නිපුණතා මට්මට අදාළ නාලන්දා, වික්‍රමශිලා සහ වළභි යන ඉපැරණි බෞද්ධ විශ්වවිද්‍යාල ත්‍රිත්වයට අදාළ තොරතුරු ශාස්ත්‍රීය පදනමක පිහිටා ගොනු කොට පන්තියට ඉදිරිපත් කිරීම (අදාළ තොරතුරු සපයාගත් මූලාශ්‍රය, පිටුඅංකය, ප්‍රකාශිත ආයතනය ආදිය සටහන් විය යුතු ය.)

| නිර්ණායක / කණ්ඩායම් අංකය හෝ නම | මාතෘකාව හඳුන්වීම හා විෂය කරුණු සමඟ ඇති සම්බන්ධතාවය | රැස්කර ගත යුතු තොරතුරු නිර්ණය කිරීම හා ඒ සඳහා යොදාගත් පොත්පත් පරිශීලනය කිරීම | තොරතුරුවල ඇති නිරවුල් බව, නිරවද්‍යතාව හා ඒවායේ වැදගත් බව | තොරතුරු සංවිධානයට යොදාගත් ලේඛන ක්‍රමවේද හා ඒවායේ පවත්නා තර්කානුකූල බව | කරුණු ඉදිරිපත් කිරීම හා ඒවාට හේතු දැක්වීම | ලකුණු එකතුව (20 න්) | මුළු ලකුණු / 2 අවසාන ලකුණ (10 න්) |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

**ලකුණු පරාසය** :

| තත්වය | ලකුණු |
|---|---|
| ඉතා හොඳයි | 4 |
| හොඳයි | 3 |
| මධ්‍යස්ථයි | 2 |
| සංවර්ධනය විය යුතුයි | 1 |

වාරය : 2
උපකරණ අංක : 05
නිපුණතාව : 08
නිපුණතා මට්ටම : 8.1
උපකරණයේ ස්වභාවය : කණ්ඩායම් ක්‍රියාකාරකම්

ක්‍රියාවලිය : 8.1 නිපුණතාවට අදාළ ව ප්‍රාග් මහින්ද යුගයේ පැවැති ඇදහිලි හා විශ්වාසයන් වෙන වෙනමත්, බුදු සසුන ලැබීමෙන් පසු බුදු සමයට අනුව ඒවා හැඩගැසුණු ආකාරය පිළිබඳවත් කණ්ඩායම් ක්‍රියාකාරකම් වශයෙන් තොරතුරු රැස්කොට පන්තියට ඉදිරිපත් කිරීමට සැලැස්වීම

| නිර්ණායක / කණ්ඩායම් අංකය හෝ නම | තේමාවට අදාළ ලෙස කරුණු ගොනුකර තිබීම | ගොනුකර ඇති කරුණුවල ප්‍රමාණවත් බව | තර්කානුකූල බව හා අර්ථාන්විත බව | කණ්ඩායමේ සෙසු සාමාජිකයින්ගේ සහභාගිත්වය | කරුණු ඉදිරිපත් කිරීමේ ක්‍රමවත් බව හා නිර්මාණශීලී බව | ලකුණු එකතුව (20 න්) | අවසාන ලකුණ $\frac{\text{මුළු ලකුණු}}{2}$ (10 න්) |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

ලකුණු පරාසය :

| තත්වය | ලකුණු |
|---|---|
| ඉතා හොඳයි | 4 |
| හොඳයි | 3 |
| මධ්‍යස්ථයි | 2 |
| සංවර්ධනය විය යුතුයි | 1 |

| | | |
|---|---|---|
| **වාරය** | : | 2 |
| **උපකරණ අංක** | : | 06 |
| **නිපුණතාව** | : | 08 |
| **නිපුණතා මට්ටම** | : | **8.2** |
| **උපකරණයේ ස්වභාවය** | : | ව්‍යාපෘති |

**ක්‍රියාවලිය** : නිපුණතා මට්ටමට අදාළ දන්දීම, පරෝපකාරය හා ගිලානෝපස්ථානය යන විෂය අන්තර්ගතය ශිෂ්‍යයන්ට පැහැදිලි කර. පුද්ගල ආධ්‍යාත්මික සංවර්ධනය හා පරාර්ථ සේවය උදෙසා සිසුන් කණ්ඩායම් තුනකට බෙදා ඉහත මාතෘකා තුන යටතේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

| නිර්ණායක / කණ්ඩායම් අංකය හෝ නම | ව්‍යාපෘතියේ අරමුණ හා ක්‍රියා පිළිවෙළ සැකසීම | කාලරාමුවට අනුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම | ක්‍රියාත්මක කළ ව්‍යාපෘතියේ ගුණාත්මක බව | කණ්ඩායමේ සාමූහික බව | ව්‍යාපෘතිය සාර්ථකව අවසන් කිරීම හා වාර්තා ඉදිරිපත් කිරීම | ලකුණු එකතුව (20 න්) | අවසාන ලකුණ $\frac{\text{මුළු ලකුණු}}{2}$ (10 න්) |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

**ලකුණු පරාසය** :

| **තත්වය** | **ලකුණු** |
|---|---|
| ඉතා හොඳයි | 4 |
| හොඳයි | 3 |
| මධ්‍යස්ථයි | 2 |
| සංවර්ධනය විය යුතුයි | 1 |

වාරය : 2
**උපකරණ අංක** : 07
**නිපුණතාව** : 09
**නිපුණතා මට්ටම** : **9.1**
**උපකරණයේ ස්වභාවය** : ශ්‍රවණ පරීක්ෂණ

**ක්‍රියාවලිය** : මියන්මාරය හා ථායිලන්තය සංස්කෘතිය බුදු දහමින් පෝෂණය වූ ආකාරයත් දෙරරෙටහි බෞද්ධ සංස්කෘතියෙහි විශිෂ්ට ලක්ෂණයන් අදාළ කරගත් හඬ පටයක් ශ්‍රවණය කිරීමට සලස්වා, ඒ ඇසුරෙන් සකස් කළ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට සිසුන් යොමු කිරීම.

| නිර්ණායක / කණ්ඩායම් අංකය හෝ නම | ක්‍රියාකාරකම් පිළිබඳ ව අවබෝධය ලබා ගැනීම, ඉගෙනුම් අරමුණුවලට සම්බන්ධ වන ආකාරය හඳුනා ගැනීම | අඛණ්ඩව අවධානය යොමු කරමින් ක්‍රියාකාරකම අවසාන වනතුරු සහභාගිවීම හා උපදෙස් අනුව බලාපොරොත්තු වන ප්‍රතිචාර දැක්වීම | ප්‍රතිචාරවල ප්‍රමාණාත්මක බව හා නිවැරදි බව | තර්කානුකූලව අදහස් ඉදිරිපත් කිරීම හා වාර්තා සකස් කිරීම | නිගමනවලට එළඹීම, යෝජනා ඉදිරිපත් කිරීම | ලකුණු එකතුව (20 න්) | අවසාන ලකුණ $\frac{\text{මුළු ලකුණු}}{2}$ (10 න්) |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

**ලකුණු පරාසය :**

| **තත්වය** | **ලකුණු** |
|---|---|
| ඉතා හොඳයි | 4 |
| හොඳයි | 3 |
| මධ්‍යස්ථයි | 2 |
| සංවර්ධනය විය යුතුයි | 1 |

වාරය : 3

**උපකරණ අංක** : 08

**නිපුණතාව** : 10

**නිපුණතා මට්ටම** : **10.1, 10.2**

**උපකරණයේ ස්වභාවය** : ප්‍රදර්ශන

**ක්‍රියාවලිය** : අනුරාධපුර හා පොළොන්නරු යුගයන්ට අයත් බුද්ධ ප්‍රතිමා හා ස්තූපයනුත් ඒ හා බැඳුණු (තදානුබද්ධ) සෙසු කාල නිර්මාණ (චෛතියඝර, බෝධිඝර, පටිමාඝර, වාහල්කඩ, සඳකඩපහණ, මුරගල, කොරවක්ගල, පියගැටපෙළ) පිළිබිඹු කෙරෙන ප්‍රදර්ශනයක් පැවැත්වීම.

| නිර්ණායක / කණ්ඩායම් අංකය හෝ නම | සම්පත් සපයා ගැනීම හා උපදෙස් ලබා ගැනීම | සංවිධානය හා ක්‍රමවත් බව | නිර්මාණශීලී බව | ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලියට ඇති උචිත බව හා පැහැදිලි විස්තර ප්‍රකාශය | ප්‍රදර්ශන ක්‍රියාවලියෙන් පසු ස්ථානීය පිරිසිදු බව | ලකුණු එකතුව (20 න්) | අවසාන ලකුණ (10 න්) මුළු ලකුණු / 2 |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

**ලකුණු පරාසය** :

| තත්වය | ලකුණු |
|---|---|
| ඉතා හොඳයි | 4 |
| හොඳයි | 3 |
| මධ්‍යස්ථයි | 2 |
| සංවර්ධනය විය යුතුයි | 1 |

**වාරය** : 3
**උපකරණ අංක** : 09
**නිපුණතාව** : 10
**නිපුණතා මට්ටම** : **10.3**
**උපකරණයේ ස්වභාවය :** නිර්මාණාත්මක ක්‍රියාකාරකම්

**ක්‍රියාවලිය** : ශ්‍රී ලංකාවේ ජනකවි, ගීත හා නාට්‍ය කෙරෙහි බෞද්ධ ආභාෂය ලැබී ඇති ආකාරය අධ්‍යයනය කර සැදැහැ ගීතයක් හෝ බෞද්ධ කෙටි නාට්‍ය පිටපතක් නිර්මාණය කිරීම

| නිර්ණායක / කණ්ඩායම් අංකය හෝ නම | ශෛලීන් අරමුණුවලට ඇති සම්බන්ධතාව, අදාළ බව හා නවතාවකින් යුතුවීම | නිර්මාණය සඳහා යොදා ගන්නා මාධ්‍යයේ උචිත බව | නිර්මාණශීලී බව | අරමුණු ඉටුවන ආකාරයට ගොඩනැගී තිබීම | අලංකරණය සඳහා යොදා ඇති උපක්‍රම හා ඒවායේ සාර්ථකත්වය | ලකුණු එකතුව (20 න්) | අවසාන ලකුණ (මුළු ලකුණු / 2) (10 න්) |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

**ලකුණු පරාසය :**

| තත්වය | ලකුණු |
|---|---|
| ඉතා හොඳයි | 4 |
| හොඳයි | 3 |
| මධ්‍යස්ථයි | 2 |
| සංවර්ධනය විය යුතුයි | 1 |